ජාතික
ගොඩනැගිලි
පර්යේෂණ
සංවිධානය

2020 වාර්ෂික වාර්තාව

ජා. ගො. ප. සංවිධානය....3
විධායක වාර්තාව....4
දැක්ම, මෙහෙවර සහ ඉලක්කයන්....7
ජා. ගො. ප. සංවිධානයේ කළමනාකරණය....8
ආයතනික ව්‍යුහය....9
ජ්‍යෙෂ්ට කළමනාකාරීත්වය....9
වැදගත් සිදුවීම්....10
රාජ්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති....11
පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන්....18
සිම්පෝසියා....24
පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු....26
ප්‍රධාන උපදේශන ව්‍යාපෘති....28
අනෙකුත් ආදයම් උත්පාදන ක්‍රියාකාරකම්....31
විදේශීය/දයකත්ව සහයෝගීතා සහිත ව්‍යාපෘතීන්....32
ජා. ගො. ප. සංවිධානයේ ප්‍රකාශනයන්....40
මූල්‍ය ම ය විශේෂ අවස්ථා....41
මූල්‍යමය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය....42
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය....43
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය....44
ගිණුම් සටහන්....45
මානව සම්පත් කළමනාකරණය /ධාරිතා සංවර්ධනය....46
විගණකාධිපති වාර්තාව 2020....49

2020 වාර්ෂික වාර්තාව ජා. ගො. ප. සංවිධානයේ අතුරු කළමනාකරණ කමිටුව (IMC) 2021 පෙබරවාරි 24 දින පැවති රැස්වීමේ දී අනුමත කරන ලදී.

ජා. ගො. ප. සංවිධානය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (ජා. ගො. ප. සංවිධානය) 1983 සැප්. 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 1984 මාර්තු 05 දින පිහිටුවන ලදී. අද වන විට වසර 37 කට ආසන්න කාලයක් පුරා තාක්ෂණික සේවා සපයන කීර්තිමත් ආයතනයකි. ජා. ගො. ප. සංවිධානය ප්‍රමුඛ පෙළේ කැපී පෙනෙන පර්යේෂණ හා සංවර්ධන ආයතනයක් මෙන් ම, නායයෑම් අවදානම් කළමනාකරණය සඳහාවන ජාතික කේන්ද්‍රස්ථානය වශයෙන් ද පත් ව ඇත.

ජා. ගො. ප. සංවිධානය යනු අනු පිළිවෙලින් ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ හා පරීක්ෂාකිරීමේ අංශය, පාරිසරික අධ්‍යයන සහ සේවා අංශය, භූ තාක්ෂණික ඉංජිනේරු පරීක්ෂණ අංශය, මානව ජනාවාස සැලසුම් හා පුහුණු අංශය, නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය යන තාක්ෂණික අංශ හය සහ පරිපාලන අංශය, මුදල් අංශය, තොරතුරු සන්නිවේදන හා වැඩසටහන් ඒකකය මෙන් ම අභ්‍යන්තර විගණන ඒකකය යන අංශයන් හි සහයෝගීතාවය යටතේ ක්‍රියාත්මකවන බහු ශික්ෂිත ආයතනයකි.

කීර්තිමත් පර්යේෂණ ආයතනයක් වශයෙන් පාර්ශවකාර ආයතන විසින් සිදුකරනු ලබන ඉල්ලීම් පරිදි සහ තම විෂය පථය හා සම්බන්ධ පර්යේෂණ සිදුකරනු ලබයි. මහා භාණ්ඩාගාරය විසින් මෙම පර්යේෂණ කටයුතු සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සපයනු ලබන අතර ඒවායේ ප්‍රගති වාර්ෂික ව ප්‍රකාශයට පත්කෙරේ. ශ්‍රී ලංකාව තුළ නායයෑම් අවදානම කළමනාකරණය කිරීම සඳහාවන කේන්ද්‍රස්ථානය වශයෙන් ජා. ගො. ප. සංවිධානය විසින් බෑවුම් අස්ථායීතාව හඳුනාගැනීමේ ක්‍රියාකාරකම් සිදුකිරීම, ආශ්‍රිත අවදානම් තක්සේරු කිරීම, අවදානම් කලාප සිතියම්ගත කිරීම, නායයෑම්වල චලනය සහ නායයෑම් අවදානම් ප්‍රදේශවල වර්ෂාපතනය නිරීක්ෂණය කිරීම, නායයෑම් පිළිබඳ පූර්ව අනතුරු හැඟවීම් නිකුත්කිරීම මෙන් ම නායයෑම් අවමකිරීම යන කටයුතු සිදුකරනු ලබයි. නායයෑම් ඇතිවිය හැකි ප්‍රදේශවල ඉදිකිරීම් සහ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා අනිවාර්ය අංගයක් ලෙස අවදානම් ඇගයීම් වාර්තා නිකුත් කිරීම ද සිදුකරනු ලබයි.

ස්වයං අරමුදල් උපයමින් ආයතනයක් වශයෙන් ජා. ගො. ප. සංවිධානය මහජනතාව, රාජ්‍ය අංශයේ ආයතන, පෞද්ගලික සමාගම් සහ ජාත්‍යන්තර ආයතන වෙත පරීක්ෂණ හා තාක්ෂණික උපදේශන සේවා සැපයීම ඔස්සේ සිදුකරන ඉපයීම් තුළින් තම පුනරාවර්තන වියදම් අවශ්‍යතා සපුරාගනු ලබන ආයතනයකි. සංවිධානය සතු ජාත්‍යන්තර තත්ත්ව ආයතනයේ ප්‍රතීතනය ලත් අධි තාක්ෂණික උපාංගයන්ගෙන් සැදුම්ලත් පාංශු පර්යේෂණාගාරය මඟින් ප්‍රමුඛතම ආයතනයක් වශයෙන් භූ තාක්ෂණ ඉංජිනේරු ම ය පරීක්ෂණයන්, බොහොමයක් විශාල යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සහ නායයෑම් අවමකිරීම සඳහා විමර්ශනයන් ජා. ගො. ප. සංවිධානය සිදුකරනු ලබයි. ජා. ගො. ප. සංවිධානය විසින් ගාස්තු මත පදනම් සේවා ලෙස ඉදිකිරීම් සඳහා ගොඩනැගිලි ද්‍රව්‍යවල යෝග්‍යතාව පරීක්ෂාකිරීම, ආපදා අවදානම සහ නායයෑම් තක්සේරුකිරීම, පිරිවැය ඵලදායී ආපදා ප්‍රතිරෝධී නිවාස සංවර්ධනය හා මානව ජනාවාස සැලසුම්කිරීම, ජලය, අපජලය, පස, අවසාදිත වාතය සහ සමුච්ච විමෝචන පරීක්ෂාකිරීම, ගොඩනැගිලි තත්ත්ව හා ව්‍යුහාත්මක අඛණ්ඩතාව තක්සේරුකිරීම මෙන් ම තාක්ෂණික උපදේශන සේවා ලෙස වෙනත් විවිධ ආශ්‍රිත අධ්‍යයනයන් තුළින් ජා. ගො. ප. සංවිධානය වෙත ආදායම් රැස්කිරීම සිදුවේ.

ජනතාව තමන් ජීවත්වන වටාපිටාවෙහි මුහුණ දෙන අවදානම් සහිත කඳු, මෘදු භූමි, දූෂිත වාතය, දූෂිත ජලය, දුර්වල ඉදිකිරීම් සහ ප්‍රමිතියෙන් තොර ගොඩනැගිලි ද්‍රව්‍ය පිළිබඳ ගැටලු ආදියෙහි ජා. ගො. ප. සංවිධානයෙහි සහාය අපේක්ෂා කරයි. ජා. ගො. ප. සංවිධානය වගකිවයුතු සේවා සපයන්නෙකු වශයෙන් විවිධ ක්ෂේත්‍රයන් හි තාක්ෂණික ප්‍රවීනයන් හා එක් ව සියලු පුරවැසියන්ගේ ජීවන තත්ත්වය පවත්වාගෙන යාම හා වැඩිදියුණු කිරීම සඳහා උචිත විසඳුම් සැපයීමට බැඳී සිටී.

විධායක වාර්තාව

ජා. ගො. ප. සංවිධානය 2020 වසරේ පැවති කොවිඩ් -19 වසංගත තත්ත්වය හමුවේ වුව ද, තම රාජකාරී සම්පූර්ණයෙන් හා උපරිම වශයෙන් ඉටුකිරීමට සමත්වී ඇත. වසංගත තත්ත්වය හමුවේ වැඩකිරීමේ තත්ත්වය අභියෝගාත්මක වුව ද වගකිව යුතු රාජ්‍ය ආයතනයක් වශයෙන් පැවරී තිබූ කාර්යයන් නිසි ආකාරයෙන් ඉටු කිරීමට සමත් ව ඇත. ඒ අනුව සලකා බැලීමේ දී, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජා. ගො. ප. සංවිධානයෙහි වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශය සම්පාදනය කර ඉදිරිපත් කිරීමට ලැබීම මා ලද විශේෂ භාග්‍යයක් ලෙස සලකමි.

පසුගිය වසර හා සසඳන විට 2020 වර්ෂයේ නායයෑම් සිදුවීම් කිහිපයක් පමණක් සිදුවී ඇත. 2020 වසර තුළදී සැලකිය යුතු පාෂාණ කුට්ටි කඩාවැටීම් කිහිපයක්, බෑවුම් සහ රැඳවුම් බිත්ති බිඳවැටීම් සිද්ධි කිහිපයක් රත්නපුර, කෑගල්ල සහ මාතලේ දිස්ත්‍රික්කවලින් වාර්තා වූ අතර ජා. ගො. ප. සංවිධානය විසින් අධීක්ෂණය කිරීම, ඉවත් කිරීම සඳහා පූර්ව අනතුරු හැඟවීම හා අවම කිරීමේ කාර්ය භාරයන් සිදුකරන ලදී.

ජා. ගො. ප. සංවිධානය විසින් ඉදිරි වසර 2 සිට 3 අතර කාලය තුළදී නිමකිරීමට අපේක්ෂිත, දැනටමත් ක්‍රියාත්මක ආපදා අවමකරණ ක්‍රියාමාර්ග සම්බන්ධ ව්‍යාපෘති අඛණ්ඩ ව ක්‍රියාත්මක කරන ලදී. AIIB මූල්‍ය සහාය සහිත ව අවමකිරීමේ ක්‍රියාමාර්ග තුළින් නායයෑම් අවදානම අවමකිරීමේ මහා පරිමාණ ව්‍යාපෘතිය 2023 වසරවන විට නිමකිරීමට ජා. ගො. ප. සංවිධානය සැලසුම්කර ඇත. මෙම ව්‍යාපෘතිය තුළ පාසල්, ආරෝග්‍යශාලා හා වැදගත් ගොඩනැගිලි, ප්‍රධාන මාර්ග මෙන් ම දුම්රිය මාර්ග ආදියට ආසන්න අඩවි 147 ක් ආවරණයවන පරිදි අවමකරණ කටයුතු සඳහා ස්ථාන තෝරාගෙන ඇත.

වසංගතය විසින් පනවන ලද දුෂ්කර තත්ත්වයන් සහ එහි ප්‍රතිඵලයක් ලෙස සංවර්ධන ක්‍රියාකාරකම්වල අඩුවීමක් තිබියදීත් සැලසුම්කර ඇති ආකාරයට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට තාක්‍ෂණික උපදේශන සේවා සැපයීමට සහ පාරිභෝගිකයින් හට පර්යේෂණාගාර පරීක්‍ෂණ සේවා ලබාදීමට ජා. ගො. ප. සංවිධානය සමත්විය. පරීක්‍ෂණ සහ උපදේශන සේවා කටයුතු මගින් ලද මුළු ආදායම රු. මිලියන 387.0 කි. 2020 වසරේ ජා. ගො. ප. සංවිධානය රු. මිලියන 771.0 ක ආදායමක් වාර්තා කර ඇති අතර රු. මිලියන 30.2 ක ලාභයක් සහිත ව මූල්‍ය ක්‍රියාකාරකම් කළමනාකරණය කරමින් ආයතනික ස්ථායීතාවය පවත්වාගෙන ඇත.

උසස් ප්‍රමිතියක් පවත්වාගැනීම තුළින් තරඟකාරී ගිවිසුම් ප්‍රසම්පාදනය කිරීමේ දී ජා. ගො. ප. සංවිධානය වෙත ප්‍රමුඛස්ථානයක් හිමිවන බව නිරීක්‍ෂණය වේ. පවත්නා වසංගත තත්ත්වය තුළ වුව ද, ජා. ගො. ප. සංවිධානය සැමවිට ම පරීක්‍ෂණයන් හි ප්‍රතිඵල හා තාක්‍ෂණික උපදේශනයන් හි නිමවුම්වල තත්ත්වය හා ගුණාත්මකභාවය පවත්වා ගනිමින් නියමිත වේලාවට ලබා දීමට සමත් ව ඇත. ISO 17020 ප්‍රතීතනයට ලක් ව පර්යේෂණාගාර තුනම නිසි පරිදි නඩත්තු කිරීම් සිදුකරන ලද අතර නියමිත සියලු අභ්‍යන්තර හා බාහිර විගණනයන් නිසි වේලාවට සිදුකරන ලදී. කාර්යමණ්ඩලය සඳහා වූ පුහුණු වැඩසටහන් තත්ත්ව කළමනාකරණ ප්‍රයත්නයන් සඳහා වැඩිදුරටත් දායක විය. ISO 17020 ප්‍රතීතනය සඳහා අනෙකුත් අංශ විසින් සිදුකරන ලද විමර්ශනයන්, පර්යේෂණ ව්‍යුහයක් වශයෙන් සහ ISO 17020 සහතික කිරීමේ ව්‍යුහයක් වශයෙන් සැලසුම් කිරීම හා අවශ්‍ය කටයුතු මේවන විට ක්‍රියාත්මක වෙමින් පවතී.

ජා. ගො. ප. සංවිධානයෙහි අනුමත කරන ලද කාර්යමණ්ඩලය නඩත්තු කරන ලද අතර භාරගත් ව්‍යාපෘතිවල අවශ්‍යතා මත කාර්යමණ්ඩල බඳවාගැනීම් සිදු කෙරිණ. 2020 දෙසැම්බර් මස අවසානවන විට කාර්යමණ්ඩල ශක්තිය 402 ක් විය.

ජා. ගො. ප. සංවිධානය විසින් වර්ෂය ආරම්භයේ දී කර්මාන්තවල අවශ්‍යතා අධ්‍යයනය කර පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්වලට දායක කරගැනීම සඳහා තම පාර්ශවකරුවන් සමඟ වාර්ෂික කර්මාන්ත උපදේශන හමුවක් පවත්වන ලදී. ජා. ගො. ප. සංවිධානය විසින් 2020 වසරතුළ රජයේ ප්‍රතිපාදන රු. මිලියන 12.8 ක් පර්යේෂණ සඳහා භාවිතාකර ඇති අතර රු. මිලියන 9.8 ක් පර්යේෂණ අරමුණු සඳහා පර්යේෂණාගාර හා ක්ෂේත්‍ර උපකරණ ප්‍රසම්පාදනය සඳහා එලදායී අයුරින් භාවිතාකර ඇත. 2020 වසරතුළ පර්යේෂණ හා සංවර්ධන අධ්‍යයනයන් පුළුල් විෂය පරාසයක් ආවරණය කර ඇති අතර විස්තර මෙම වාර්තාවෙහි පර්යේෂණ හා සංවර්ධන ශීර්ෂය යටතේ ඉදිරිපත් කර ඇත.

ජපාන රජයේ සහයෝගීතාවයෙන් 2019 සිට 2023 දක්වා ක්‍රියාත්මක SATREPS ව්‍යාපෘතිය මගින් ජා. ගො. ප. සංවිධානයෙහි නායයෑම් පර්යේෂණ ධාරිතාවය වැඩිදියුණු කිරීමට අපේක්ෂිත ය.

ජාතික සංවර්ධනය උදෙසා දායකත්වය

නායයෑම් අධ්‍යයනය සඳහා ජාතික කේන්ද්‍රස්ථානය වශයෙන් ජා. ගො. ප. සංවිධානය වැදගත් වගකීමක් ඉටුකරයි. සංවිධානය විසින් නිර්මාණයකර ඇති උපදෙව හා අවදානම් සිතියම් ජාතික භෞතික සැලසුම් සහ සංවර්ධන කටයුතු සඳහා භාවිතා කෙරේ. ජා. ගො. ප. සංවිධානය විසින් සිදුකරණු ලබන පූර්ව අනතුරු හැඟවීම් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරයි.

ජා. ගො. ප. සංවිධානය වෙත පැවරුණු රාජකාරියක් ලෙස නායයෑම් අවදානම සහිත ප්‍රදේශ පවතින දිස්ත්‍රික්ක 14 ක රජයේ ආයතන වෙත ඉදිකිරීම් හෝ සංවර්ධන කටයුතු සඳහා අනුමැතිය ලබාදීම සඳහා නායයෑම් අවදානම් තක්සේරු වාර්තා (LRAR) සහ තාක්‍ෂණික නිර්දේශ ලබාදීම සිදුකරයි. 2020 වසර තුළ අවශ්‍ය විමර්ශනයන්ගෙන් පසුව වාර්තා 6085 ක් නිකුත්කිරීමට කටයුතු කර ඇත.

2020 වසර තුළදී ජාත්‍යන්තර පරිත්‍යාගශීලී නියෝජිත සමාගම් සහ ආයතන කිහිපයක් ඔවුන්ගේ සහාය ජා. ගො. ප. සංවිධානය වෙත ලබා දී ඇත. ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (JICA), ලෝක බැංකුව, ආසියානු ආපදා පෙර සූදානම් මධ්‍යස්ථානය (ADPC), නෝර්වීජියානු භූ තාක්‍ෂණ ආයතනය (NGI) සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) තවදුරටත් ඔවුන්ගේ සහාය ජා. ගො. ප. සංවිධානයෙහි නායයෑම් අවදානම කළමනාකරණ උත්සාහය සඳහා ලබාදෙන ලදී. ඊට අමතර ව එක්සත් ජනපද භූ විද්‍යා සංගමය, එක්සත් රාජධානියේ හාත් විශ්වවිද්‍යාලය, සල්ෆර්ඩ් විශ්වවිද්‍යාලය සහ හඩර්ස්ෆීල්ඩ් විශ්වවිද්‍යාලය ද ජා. ගො. ප. සංවිධානය වෙත සහයෝගය ලබාදී ඇත.

ජා. ගො. ප. සංවිධානය විසින් නායයෑම් අවමකිරීමේ කාර්යයන් දිගින් දිගටම ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන් සඳහා හඳුනාගත් අනතුරු තර්ජනයට ලක් ව ඇති ජනාවාස සහිත ස්ථානයන් හි අවමකරණ කටයුතු මාර්ගබද බෑවුම්, හඳුනාගත් දුම්රිය මාර්ග ආසන්න අස්ථාවර බෑවුම් සහ පාසල් හා අවදානමට ලක්විය හැකි පොදු ගොඩනැගිලි ආශ්‍රිත බෑවුම් ස්ථායීකරණය ඇතුලත් ය.

ජා. ගො. ප. සංවිධානයෙහි විශේෂඥ දැනුම ව්‍යාප්ත කිරීම.

අසාර්ථකත්වයට පත්වූ මීතොටමුල්ල කසළ පිරවුම විසින් විනෝද උද්‍යානයක් බවට ප්‍රවර්තන ක්‍රියාවලියේ දී නාගරික සංවර්ධන අධිකාරිය හා ජා. ගො. ප. සංවිධානය විසින් අදාළ භූ ස්ථර ස්ථාපනය., කාන්දු නිස්සාරණ පද්ධති හා වායාශ්‍ර සැකසුම සඳහා අවශ්‍යකරණ තාක්‍ෂණික සේවා සපයන ලදී. එමෙන් ම ජා. ගො. ප. සංවිධානය විසින් මහනුවර - මහියංගනය මාර්ගය, දක්ෂිණ අධිවේගී මාර්ගය හා වෙනත් ප්‍රධාන මාර්ග ජාලයන් හි බෑවුම් ස්ථාවර කිරීමේ කටයුතු ලෝක බැංකු ආධාර යටතේ වන දේශගුණික අවබලපෑම් අවමකිරීමේ ව්‍යාපෘතිය (CRIP) හා ජයිකා (JICA) ආධාර යටතේ වන නායයෑම් ආපද ආරක්‍ෂණ ව්‍යාපෘතිය (LDPP) යටතේ ක්‍රියාත්මක කරන ලදී.

ජා. ගො. ප. සංවිධානය විසින් මෑතක දී නායයෑම්වලට හා ගංවතුර විපත්වලට ගොදුරුවූවන් මෙන් ම, ආපදාවලට ලක්වීමේ අවදානම් සහිත ප්‍රදේශවල ජීවත්වන පුද්ගලයින් ආරක්ෂිත ප්‍රදේශවල නැවත පදිංචිකිරීමේ රජයේ වැඩපිළිවෙල සඳහා ද තම තාක්‍ෂණික දායකත්වය සැපයීම සිදුකරයි.

ආදායම

ජා. ගො. ප. සංවිධානය තම පුනරාවර්තන වියදම් ප්‍රධාන වශයෙන් රාජ්‍ය අංශයට හා පෞද්ගලික අංශයට උපදේශන සේවා සහ පරීක්‍ෂණ සේවා සැපයීම තුලින් උපයන ආදායම ඇසුරින් සපුරාගනු ලබයි. ජා. ගො. ප. සංවිධානය විසින් සිදුකරනු ලබන නායයෑම් අවදානම් තක්සේරු වාර්තා සැපයීම ද සාමාන්‍ය පරිදි ගාස්තු මත පදනම් සේවාවකි. ජා. ගො. ප. සංවිධානය වෙත අවමකරණ ව්‍යාපෘති, සිතියම්ගත කිරීම්, විශේෂ නායෑම් විමර්ශනයන්, අනෙකුත් රාජ්‍ය ප්‍රතිපාදන ව්‍යාපෘති සහ දායකත්ව අරමුදල් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ද ප්‍රතිපාදන ලැබීම් සිදුවේ. 2010 වසරේ සිට සෑම වසරක ම ශුද්ධ ලාභයක් ඉපයීමට සමත් ව ඇත.



පසුගිය වසර 5 තුල සමස්ත ක්‍රියාකාරී ආදායම



පසුගිය වසර 5 තුල ලාභ අලාභ සටහන්



2020 වසර තුල ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා රාජ්‍ය ප්‍රතිපාදන

බාධක

පහත සඳහන් සාධක ප්‍රධාන බාධක ලෙස හඳුනාගෙන ඇත.

- ''ජා. ගො. ප. ආයතනය" නෛතික වශයෙන් ස්ථාපනය කිරීම සඳහා කෙටුම්පත්කර ඇති පනත මේ දක්වා අනුමත නොවීම.
- උපදේශන ලංසු තැබීමේ දී රාජ්‍ය සංවිධානයක් වශයෙන් තරඟකිරීමේ දුෂ්කරතාවය.
- වැඩකරන දීර්ඝ පැය ගණන් සඳහා ගෙවීම් සීමාවීම්.
- වෙනත් ආයතන විසින් ඉහල ප්‍රතිලාභ ප්‍රදානය කිරීම හේතුවෙන් දක්ෂ හා ප්‍රවීන කාර්යමණ්ඩල රඳවාගැනීමේ දුෂ්කරතාවයන් ඉහල යමින් පවතී.

ඵලදායීතා ප්‍රවර්ධනය සඳහා මුලපිරීම්

ආයතනික කාර්යසාධනය ප්‍රවර්ධනය උදෙසා පහත සඳහන් පියවරයන් ක්‍රියාවට නංවා ඇත.

- ✓ පර්යේෂණාගාර තුනෙහි ම ප්‍රතීතනයන් පවත්වාගෙන යාම
- ✓ තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘති මඟින් ආයතනික තාක්ෂණික ධාරිතාවය බලගැන්වීම
- ✓ නායයෑම් අවදානම් අවමකිරීම් ව්‍යාපෘතීන් හි කටයුතු කිරීම සඳහා ජා. ගො. ප. සංවිධානයෙහි සැලසුම් ඒකකය ශක්තිමත් කිරීම
- ✓ උස් හා විශාල පරිමාණයේ ගොඩනැගිලි සංකීර්ණ හේතුවෙන් යාබද දේපලවල ආරක්ෂාව සහතික කිරීම සඳහා භූ තාක්ෂණ අවදානම් තක්සේරු ධාරිතා වර්ධනය

අනාගත සැලසුම්

- ➢ නායයෑම් අවමකිරීමේ කටයුතු පවත්ගෙනයාම හා අදාල ධාරිතාවයන් ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂිත ය.
- ➢ උපද්‍රව සිතියම් හා අවදානම් පැතිකඩ සැකසීම් වේගවත් කිරීමට අපේක්ෂාකර ඇත.
- ➢ විපත් අවමකිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස වැදගත්කමකින් යුතු ගොඩනැගිලිවල තත්ත්ව ඇගැයීම් සිදුකිරීමට අපේක්ෂිත ය.
- ➢ රසායනික උපද්‍රව කළමනාකරණය පිළිබඳ අධ්‍යයනයන් අඛන්ඩ ව පවත්වාගෙන යාමට අපේක්ෂාකර ඇත.
- ➢ ඉදිකිරීම් කර්මාන්තය සඳහා මෑතක දී සම්පාදනය කරන ලද මාර්ගෝපදේශ ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.
- ➢ මේවන විට කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලිවල පවත්ගෙන යනු ලබන දිස්ත්‍රික් කාර්යාල සඳහා නව ගොඩනැගලි ඉදිකිරීම ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

කෘතවේදීත්වය

ජා. ගො. ප. සංවිධානයෙහි මෙම සාර්ථකත්වය උදෙසා මාර්ගෝපදේශනය හා මගපෙන්වීම ලබාදුන් ජාතික ආරක්ෂක ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ ගරු රාජ්‍ය අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා, ජාතික ආරක්ෂක ස්වදේශ කටයුතු සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්, ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න, ජා. ගො. ප. සංවිධානයේ අන්තර් කළමනාකරණ කමිටුවේ (IMC) සභාපති, අතිරේක ලේකම් මේජර් ජෙනරාල් සුදන්ත රණසිංහ යන මහත්වරුන් වෙත කෘතඥතාවය පලකිරීම සඳහා මම මෙය අවස්ථාව කරගනිමි.

තව ද, ජා. ගො. ප. සංවිධානයේ අන්තර් කළමනාකරණ කමිටුව සහ විගණන කළමනාකරණ කමිටුවෙහි සාමාජිකයින්, අයවැය දෙපාර්තමේන්තුව, මහාභාණ්ඩාගාරය, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව (ERD), ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, භූ විද්‍යා හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරුන් සහ අධ්‍යක්ෂ, ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය (NDRSC) මහත්සේ ඇගැයීමට ලක්කළ යුතු ය.

මේ අවස්ථාවේ දී අපගේ කෘතවේදීත්වය ජාත්‍යන්තර පාර්ශවකාර ලෝක බැංකුව, UNDP, JICA, ADPC, NGI, AIIB, USGS, ජපානයේ SATREPS, එක්සත් රාජධානි සල්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ THINKlab හා භාත් විශ්වවිද්‍යාලය ඇතුලු විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා මූල්‍ය සහ තාක්ෂණික සහයෝගය ලබාදුන් සියලු සහයෝගීත්ව ආයතනයන් වෙත පුදකළ යුතු ය. ඊට අමතර ව මාගේ අවංක ස්තුතිය අප කෙරෙහි අඛන්ඩ ව විශ්වාසය තැබීම පිළිබඳ ව අපගේ දේශීය පාර්ශවකරුවන් සහ වටිනා පාරිභෝගිකභවතුන් වෙත පුදකරමි. ජා. ගො. ප. සංවිධානයෙහි කැපවීම් සහිත සේවක ප්‍රජාව වෙත මාගේ කෘතඥතාවය පුදකරමි.

ඔවුන්ගේ එම සහයෝගය නොවන්නට මෙතරම් සාර්ථක ව 2020 වසර තුල ඉලක්කයන් සමූහය ළඟාකර ගැනීමට නොහැකිවනු ඇත. ඉහත සියලු ක්‍රියාකාරකම් හි විශිෂ්ඨත්වය උදෙසා ජා. ගො. ප. සංවිධානයෙහි කොඳු නාරට්ය බඳු කැපී පෙනෙන දක්ෂතාවයන්ගෙන් පූර්ණ කණ්ඩායම ඔවුන්ගේ දැනුම, හැකියාව සහ වෘත්තීය නිපුණත්වය ආරෝපණය කර ඇත.

එළඹෙන ඉදිරි වසරවල දී ද අපගේ වාර්ෂික ක්‍රියාකාරකම් සැලසුම්වලට අනුකූල ව මෙහෙයුම් හා ඉලක්කයන් ඉටුකරලීමට අප සැවොම සහයෝගයෙන් යුක්ත ව ජා. ගො. ප. සංවිධානයෙහි කාර්ය සාධනය තවදුරටත් වර්ධනය උදෙසා ක්‍රියා කරමු. අපගේ කණ්ඩායමෙහි එකිනෙකා කෙරෙහි ඉතාමත් සහයෝගීතාවයෙන් යුතු ව අදහස් හුවමාරු කරගනිමින් විශිෂ්ඨ ප්‍රතිඵල සාක්ෂාත් කරගනු ඇතැ යි අප විශ්වාස කරමු.

ඉංජිනේරු (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන
අධ්‍යක්ෂ ජනරාල්

දැක්ම, මෙහෙවර සහ ඉලක්කයන්

දැක්ම

ප්‍රත්‍යාස්ථිත හා තිරසාර නිර්මිත සුරක්ෂිත පරිසරයක වෙසෙන ජනතාවක්

මෙහෙවර

ආපද අවදනම අවමකිරීම උදෙසා ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීම තුලින් සැමට සුරක්ෂිත හා තිරසාර නිර්මිත පරිසරයක්

ඉලක්කයන්

- ඉලක්කය 1: ආපද අවදනම් තක්සේරුකිරීමේ විෂයයන් හා විෂය ක්ෂේත්‍ර තුල තාක්ෂණික විශිෂ්ඨත්වය කරා ළඟාවීම
- ඉලක්කය 2: ආපද අවදනම අවමකිරීම (DRR) හි අදල විෂයයන් හා විෂය ක්ෂේත්‍ර තුල නෛතික තත්ත්වය සහ ව්‍යවස්ථාපිත බලතල ළඟාකරගැනීම.
- ඉලක්කය 3: පාරිසරික, භූ තාක්ෂණ ඉංජිනේරු, ගොඩනැගිලි ද්‍රව්‍ය, ඔරොත්තුදෙන ගොඩනගත ලද පාරිසරික සැළසුම්කරණය සහ ප්‍රත්‍යාස්ථිත ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ප්‍රතිතනය ලත් පරීක්ෂණ සහ තාක්ෂණික සේවා සපයන ඉහලම ජාතික ආයතනයක් බවට පත්වීම
- ඉලක්කය 4: ආපද අවදනම අවමකිරීම (DRR) සහ ආපදවන්ට ඔරොත්තුදීමේ හැකියාව සංවර්ධනය පිළිබඳ තාක්ෂණය හා නවෝත්පාදන ක්ෂේත්‍රවල පර්යේෂණ හා සංවර්ධන විශිෂ්ඨත්වය ළඟාකරගැනීම.
- ඉලක්කය 5: ජාතික කළාපීය සහයෝගීතා සම්බන්ධතා මඟින් ආපද අවදනම අවමකිරීම (DRR) දිරිගැන්වීම හා පවත්වාගෙන යාම සඳහා ආපද ප්‍රත්‍යාස්ථිතික විද්‍යා හා තාක්ෂණය යොදගැනීම.
- ඉලක්කය 6: ඵලදයී ලෙස ආපද අවදනම අවමකිරීම සඳහා අදල විෂයයන් හා විෂය ක්ෂේත්‍රය තුල ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම
- ඉලක්කය 7: ආපද අවදනම අවමකිරීමේ ඵලදයී ක්‍රියාත්මකවීම උදෙසා ජා. ගො. ප. සංවිධානයෙහි මූල්‍ය තිරසාර බව ළඟාකර ගැනීම.
- ඉලක්කය 8: නායයෑම් අවදනම කළමනාකරණය සඳහා විශිෂ්ඨත්වයෙන් යුත් ජාතික කේන්ද්‍රස්ථානය බවට පත්වීම.
- ඉලක්කය 9: දේශගුණික සවිඥනික පූර්ව අනතුරු හැඟවීමේ තාක්ෂණය තුලින් ආපදවන්ට ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීම
- ඉලක්කය 10: පරිසරය මත පදනම් ආපද අවදනම් අවමකිරීමේ තාක්ෂණය තුලින් ආපදවන්ට ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීම
- ඉලක්කය 11: ප්‍රජා විද්‍යාව පදනම් කරගත් ආපද අවදනම අවමකිරීමේ ක්‍රියාවලීන් තුලින් ආපදවන්ට ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීම.

ඉලක්කය 12: පුනරුත්තාපනය සහ නැවත ගොඩනැගීමේ තාක්ෂණය තුලින් ආපදවන්ට ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීම

ජා. ගො. ප. සංවිධානයේ කළමනාකරණය

විෂයභාර අමාත්‍යතුමා

ගරු චමල් රාජපක්ෂ
ජාතික ආරක්ෂක, ස්වදේශ කටයුතු සහ ආපදා කළමනාකරණ
රාජ්‍ය අමාත්‍ය

> වර්තමානයේ දී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පරිපාලන, මූල්‍ය හා කළමනාකරණ කටයුතු මෙහෙයවීමට සහ මාර්ගෝපදේශකත්වය සැපයීම සඳහා රේඛීය අමාත්‍යංශයේ ලේකම් සභාපතිත්වය දරණ කැබිනට් අනුමැතිය ලත් අන්තර් කළමනාකරණ කමිටුවක් පත්කර ඇත.

අන්තර්වාර කළමනාකරණ කමිටුව (IMC)

ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න (සභාපති) ලේකම්, ජාතික ආරක්ෂක, ස්වදේශ කටයුතු සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය	එම්. ඒ. තන්දනී මහත්මිය අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ජාතික අයවැය දෙපාර්තමේන්තුව
මේජර් ජෙනරල් සුදන්ත රණසිංහ අධ්‍යක්ෂ ජනරාල් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	එච්. කේ. බාලචන්ද්‍ර මයා අධ්‍යක්ෂ ජනරාල් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
ආචාර්ය සුගත් යාලේගම අතිරේක ලේකම් (ප්‍රතිපත්ති හා පාලන) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය	එච්. යූ. ආර්. ෆොන්සේකා මයා ප්‍රධාන ගණකාධිකාරී ජාතික ආරක්ෂක, ස්වදේශ කටයුතු සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
ඒ. කේ. කරුණානායක මයා අධ්‍යක්ෂ ජනරාල් කාලගුණ දෙපාර්තමේන්තුව	ඉංජි. (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන අධ්‍යක්ෂ ජනරාල් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

විගණන හා කළමනාකරණ කමිටුව

එම්. ඒ. තන්දනී මහත්මිය (සභාපති) අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ජාතික අයවැය දෙපාර්තමේන්තුව	**ආර්. ඒ. එන්. ඩී. රණතුංග මිය** ප්‍රධාන අභ්‍යන්තර විගණක ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
එච්. කේ. බාලචන්ද්‍ර මයා අධ්‍යක්ෂ ජනරාල් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය	**ඒ. බී. ආර්. අමරකෝන් මහත්මිය** විගණන අධිකාරී රාජ්‍ය විගණන අංශය
ඉංජි. (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන අධ්‍යක්ෂ ජනරාල් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය	**එච්. යූ. ආර්. ෆොන්සේකා මයා** ප්‍රධාන ගණකාධිකාරී ජාතික ආරක්ෂක, ස්වදේශ කටයුතු සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
එච්. එල්. රුවන්තිලක මයා අභ්‍යන්තර විගණක ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය	**කුමුදු රත්දෙනි මහත්මිය** අධ්‍යක්ෂ (මුදල්) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

ආයතනික ව්‍යුහය



ජ්‍යෙෂ්ට කළමනාකාරීත්වය

ඉංජිනේරු (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන	**අධ්‍යක්ෂ ජනරාල්**
කේ. සී. සුගතපාල මයා	අධ්‍යක්ෂ, මානව ජනාවාස සැලසුම්කරණය හා පුහුණු අංශය
සර්ධානි වී. ඩයස් මිය	අධ්‍යක්ෂ, පාරිසරික අධ්‍යයන හා සේවා අංශය
කිත්සිරි එන්. බණ්ඩාර මයා	අධ්‍යක්ෂ, භූ තාක්ෂණික ඉංජිනේරු හා පරීක්ෂණ අංශය
සුනේත්‍රා මුතුරත්න මිය	අධ්‍යක්ෂ, ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ හා පරීක්ෂණ අංශය
ජේ. කුමුදුණී ජයවර්ධන මිය	අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරණ අංශය
ආචාර්ය ගාමිණී ජයතිස්ස මයා	වැ. බ. අධ්‍යක්ෂ, නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය
කුමුදු රත්දෙනිය මිය	අධ්‍යක්ෂ, මූල්‍ය
සරත් කුරේ මයා	වැ. බ. අධ්‍යක්ෂ, පරිපාලන

වැදගත් සිදුවීම්

2020 වසරේ දී ජා. ගො. ප. සංවිධානය ජාත්‍යන්තර නායයෑම් සම්මේලනය සහ තවත් බොහෝ වැදගත් පාර්ශවකරුවන්ගේ මැදිහත්වීමෙන් ශ්‍රී ලංකා සහ ජපාන රජයන් ආධාර සපයන පස් අවුරුදු මහා පරිමාණ පර්යේෂණ අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. ජා. ගො. ප. සංවිධානය විසින් මේවන විටත් ක්‍රියාත්මක 2019 වසරේ දී ආරම්භ කරන ලද වැදගත් මහා පරිමාන ව්‍යාපෘතියක්වන අවමකිරීමේ විධි විධාන තුලින් නායයෑම් අවදානම අවමකිරීමේ ව්‍යාපෘතිය (RLVMMP) අඛන්ඩ ව ක්‍රියාත්මක කරන ලදී. 'ආසියානු ආපද පෙර සූදනම්' මධ්‍යස්ථානය සමඟ ක්‍රියාත්මක කරන ලද ස්වභාව ධර්මය මත පදනම් කරගත් නායයෑම් අවදනම් අවමකිරීමේ ව්‍යාපෘතිය සාර්ථක ව නිමකරන ලදී. ආයතනික ධාරිතාවය ශක්තිමත් කරගැනීම සඳහා ජාත්‍යන්තර පාර්ශවකාර ආයතන (SATREPS, NILIM, SABO & USGS) සමඟ කරන ලද තවත් බොහෝ ව්‍යාපෘති රටතුල පවතින වසංගත තත්ත්වය හමුවේ වුව ද සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගෙන ඇත.

ජා. ගො. ප. සංවිධානය විසින් නායයෑම් අවදානම සහිත ප්‍රදේශවල ස්වයංක්‍රිය වර්ෂාමාන ජාලය සහ භූමි චලනය වන නායයෑම් හැසිරීම හඳුනාගැනීමේ උපකරණ පද්ධතිය තවදුරටත් ශක්තිමත් කිරීම තුලින් ජා. ගො. ප. සංවිධානයෙහි ප්‍රධාන කාර්යාලයෙහි ස්ථාපිත නායයෑම් පූර්ව ආපද අනතුරු හැඟවීමේ මධ්‍යස්ථානය අඛන්ඩ ව ක්‍රියාත්මක කිරීම සහ වඩාත් කාර්යක්ෂම ඵලදායී හා කාලීන අයුරින් පූර්ව අනතුරු ඇඟවීමේ ප්‍රචාරණය සිදුකිරීම සිදුවිය. දේශීය වශයෙන් ස්වයංක්‍රිය වර්ෂාමානක හා ආශ්‍රිත උපකරණ සංවර්ධනය මෙම පද්ධතීන් ව්‍යාප්ත කිරීම හා පවත්වාගැනීම සඳහා වන උත්සාහයක් වශයෙන් ක්‍රියාත්මක විය.

තාක්ෂණික උපදේශනය සඳහා ජා. ගො. ප. සංවිධානයේ වාර්ෂික පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් පාර්ශවකරුවන් සමඟ වසර ආරම්භයේ දී පවත්වන ලදී. 2020 වසරේ ජා. ගො. ප. සංවිධානයෙහි වාර්ෂික පර්යේෂණ සමුළුව පැවති වසංගත තත්ත්වය හේතුවෙන් නොපැවැත්වුව ද පර්යේෂණ කමිටුවේ මාර්ගෝපදේශ යටතේ පර්යේෂණ කටයුතු අඛන්ඩ ව සිදුකරන ලදී.

ජා. ගො. ප. සංවිධානය රේඛීය අමාත්‍යාංශයේ ආපද කළමනාකරණ අංශයෙහි පර්යේෂණ හස්තය මෙන් ම එකම තාක්ෂණික ආයතනය ද වේ. නවීන පහසුකම්වලින් ශක්තිමත් බහුවිධ විෂය පථයන්ගෙන් යුත් තාක්ෂණික අංශයන් හි ධාරිතාවයන් ඒකාබද්ධ භාවිතාකරමින් රටතුල බොහොමයක් ගැටළු සඳහා විසඳුම් සැපයීමට ජා. ගො. ප. සංවිධානය සමත් ව ඇත. ජා. ගො. ප. සංවිධානයෙහි විශේෂඥතාවය වර්තමානයෙහි ප්‍රධාන වශයෙන් තාක්ෂණික ඉංජිනේරු, ගොඩනැගිලි ද්‍රව්‍ය තාක්ෂණය, මානව ජනාවාස සැලසුම්කරණය, පාරිසරික කළමනාකරණය හා ව්‍යාපෘති කළමනාකරණය යන ක්ෂේත්‍රතුල තාක්ෂණික සේවා ලෙස පිරිනමනු ලැබේ. විශේෂයෙන් නායයෑම් අවමකිරීමේ තාක්ෂණය හා රටතුල උද්ගතවන ක්ෂේත්‍රයන් හි එනම්, භූමියෙහි ගිලා බැසීම්හඳුනාගැනීම, ආපදවන්ට ඔරොත්තු දීමේ හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සහ නියගයට අනුවර්තනය වීම යන ගැටළු පිළිබඳ ජා. ගො. ප. සංවිධානය විශේෂඥතාවයක් උසුලනු ලබයි.

සමාලෝචිත වර්ෂය තුල ජා. ගො. ප. සංවිධානය විසින් තමා වෙත පවරන ලද හා වාර්ෂික ක්‍රියාකාරකම් සැලැස්මෙහි සඳහන් විශේෂිත කාර්යයන් ක්‍රියාවට නංවා ඇත.

රාජ්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති

නායයෑම් ආපද කළාප සිතියම්ගත කිරීමේ ව්‍යාපෘතිය (LHMP)

1985 වසරේ සිදුවූ දරුණු නායයෑම්වලින් පසුව රජය විසින් නායයෑම් අධ්‍යයනය ජා. ගො. ප. සංවිධානය වෙත පවරා ඇත. ඉන් අනතුරු ව ජා. ගො. ප. සංවිධානය විසින් නායයෑම් හඳුනාගැනීම හා සිතියම් ගත කිරීමේ කටයුතු සඳහා නායයෑම් අවදනම් කලාප සිතියම්ගත කිරීමේ ව්‍යාපෘතිය (LHMP) 1992 වසරේ දී එක්සත් ජාතීන්ගේ සමාරම්භක වැඩසටහන (UNDP) සහාය ද ඇති ව දියත්කරන ලදී. පසුව එම ව්‍යාපෘතිය මඟින් මේ දක්වා රාජ්‍ය අරමුදල් යටතේ නායයෑම් අවදනම් සහිත ප්‍රදේශ සිතියම්ගත කිරීම සිදුකෙරේ. හඳුනාගත් දිස්ත්‍රික්ක 13 ක සමස්ත වර්ග කි. මී. 32,593.1 ක ප්‍රදේශයක් ආවරණය වන පරිදි 1:50,000 පරිමාණයට අනුව සිතියම්ගත කර ඇති අතර ප්‍රමුඛතා කළාප ඇතුලත්වන පරිදි වර්ග කි. මී, 8,500 ක භූමි ප්‍රමාණයක් ආවරණය කරමින් 1:10,000 පරිමාණය යටතේ සිතියම්ගත කර ඇත.

2020 වසර තුල ව්‍යාපෘතිය සඳහා රජය මඟින් රු. මි. 23.0 ප්‍රතිපාදන ලැබී ඇති අතර එහි ප්‍රථිඵල ලෙස නුවරඑළිය දිස්ත්‍රික්කය තුල වර්ග කි. මී. 40 බැගින් ආවරණයවන පරිදි 1:10,000 පරිමාණය යටතේ ආවරණයවන සමස්ත භූමි ප්‍රමාණය වර්ග කි. මී. 300 සිතියම් ගතකර ඇත.

මෙම ව්‍යාපෘතිය මඟින් සකස්කරන ලද සිතියම් නායයෑම් පූර්ව අනතුරු හැඟවීම් නිකුත් කිරීමට ද, ආපද තක්සේරු කිරීම උදෙසා නායයෑම් විමර්ශන කටයුතු කිරීම (LRAR) සඳහා ද, නාය අනතුරු සිදුවිය හැකි භූමි හඳුනාගැනීමේ ප්‍රමුඛතාවය අනුව අවමකිරීමේ ව්‍යුහ ම ය ක්‍රමවේද යෙදීමේ කාර්යයන් සඳහා ද භාවිතා කරනු ලැබේ. තව ද, විවිධ ආයතන මඟින් ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ සැලසුම්කරණ කටයුතු සඳහා ද මෙම සිතියම් භාවිතා කරනු ඇත. මෙම සිතියම්වලින් බොහොමයක් ජා. ගො. ප. සංවිධානයේ වෙබ් අඩවියෙන් නොමිලේ බාගත කරගැනීමට හැකියාව ඇත. (www.nbro.gov.lk)



Hazard Zonation Mapping Area





Hazard Zonation Map 1: 50,000

නායයෑම් අවදානම තක්සේරුකර වාර්තා නිකුත්කිරීමේ ක්‍රියාවලිය (LRAR)

ජා. ගො. ප. සංවිධානය විසින් පළාත් පාලන අධිකාරීන් වෙත නායයෑම් අවදානම් තක්සේරු වාර්තා නිකුත්කිරීම සිදුකරන අතර., ඒ තුළින් නායයෑම් සිදුවීමේ හැකියාව සහිත ප්‍රදේශවල ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු සඳහා අවසර ලබාදෙන්නේ ද නැද්ද යන්න පිළිබඳව නිර්දේශ ලබාදීම ද සිදුකෙරේ. නායයෑම් අවදානම් තක්සේරු වාර්තා නිකුත්කිරීම මුලින් ම 2011 වසරේ මාර්තු මස ආරම්භ වූ අතර එතැන් සිට 2020 දෙසැ. 31 වනවිට ඉල්ලුම්පත් 89,000 කට අධික සංඛ්‍යාවක් ලැබී ඇත. 2020 වසර තුළ දී අනුමැතිය ලබාදී ඇති සංඛ්‍යාව 6085 වන අතර මෙම කාලය තුළ ඉල්ලුම් පත් 715 ක් ප්‍රතික්ෂේප කිරීම සිදුවී ඇත. ජා. ගො. ප. සංවිධානය විසින් අවශ්‍ය විමර්ශනයන් සිදුකිරීම හා වාර්තා නිකුත්කිරීම සඳහා නාමික ගාස්තුවක් අයකරනු ලැබේ. 2020 වසරේ මෙම ක්‍රියාවලියෙහි පුනරාවර්තන වියදම් ආවරණය කරනු පිණිස මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 32.5 ක ප්‍රතිපාදන සපයන ලද අතර අතිරික්ත පිරිවැය ආයතනික සමාජ වගකීමක් ලෙස ආයතනික ආදයමෙන් දරා ඇත.

වගුව - 2011 වසරේ මාර්තු මස ආරම්භයේ සිට මේ දක්වා : LRAR විස්තර

Progress of Landslide Risk Assesment Process for Building and Land Approval (Application LAB & LAD)-LRRMD-from 01.03.2011 to 31/12/2020 නායයෑම් අවදානම් සහිත ප්‍රදේශ වල ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු සඳහා අනුමැතිය ලබා ගැනීමේ වැඩ පිළිවෙලෙහි ප්‍රගති සමාලෝචනය - - 01.03.2011 සිට 31/12/2020 දක්වා

	(district) දිස්ත්‍රික්කය	1	2			3=1-(2a+2b+2c)	Pending Application Details (අතිරික්ත ඉල්ලුම්පත් පිළිබඳ විස්තර)		
		Total Applications Received (ලැබු ඉල්ලුම්පත් සංඛ්‍යාව)	Total Applications work completed (වැඩ නිමකළ ඉල්ලුම්පත් සංඛ්‍යාව) 2a Permission granted (අනුමැතිය ලබා දුන් ඉල්ලුම්පත්)	2b Permission not granted (අනුමැතිය ලබා නොදුන් ඉල්ලුම්පත්)	2c Applications rejected due to other reasions (වෙනත් හේතුන් මත අවසරය ලබා නොදුන් ඉල්ලුම්පත්)	Total applications pending (අතිරික්ත ඉල්ලුම්පත් සංඛ්‍යාව)	Pending For initial Investigation (මූලික පරීක්ෂණ සඳහා)	Referred to revisit/detailed investigation විස්තරාත්මක අධ්‍යයනයට යොමු කිරිම සඳහා)	Documents Pending from Client (ඉල්ලුම්කරුගෙන් අදාල ලියකියවිලි ලැබෙන තෙක්)
1	Kandy	20002	17614	313	1392	683	486	5	192
2	Matale	8505	8325	17	33	130	106	10	14
3	Nuwaraeliya	7474	7205	64	51	154	40	79	35
4	Badulla	11976	11328	200	310	138	101	28	9
5	Kagalle	11336	10780	62	432	62	3	0	59
6	Rathnapura	11376	9829	38	1430	79	58	0	21
7	Kaluthara	1105	1054	7	29	15	15	0	0
8	Galle	15540	15444	8	23	65	63	2	0
9	Matara/H'tota	2222	2206	5	7	4	4	0	0
10	Kurunagala	26	25	0	0	1	1	0	0
	Total	**89562**	**83810**	**714**	**3707**	**1331**	**877**	**124**	**330**

නායයෑම් විශේෂ විමර්ශන (SPI)

නායයෑම් නිසා අසල්වැසි ජනාවාස, යටිතල පහසුකම් සහ වතු ආශ්‍රිත ව පවතින අවදානම් හඳුනාගැනීම සහ ජීවිත, දේපලවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නායයෑම් සම්බන්ධ විශේෂ විමර්ශන පවත්වා කඩිනමින් නිර්දේශ ලබාදෙන මෙන් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් මෙන් ම වෙනත් රාජ්‍ය ආයතනවල නිලධාරීන්

විසින් ජා. ගො. ප. සංවිධානය වෙතින් ඉල්ලීම් සිදුකෙරේ. 2020 වසරේ දී එබඳු නායයෑම් විශේෂ විමර්ශන 3460 ක් සිදුකර ඇත. ඒ සඳහා මහා භාණ්ඩාගාරය විසින් රු. මිලියන 61.0 ක ප්‍රතිපාදන සපයා ඇත.

නායයෑම් අවමකිරීමේ ව්‍යාපෘති (රාජ්‍ය අරමුදල්)

නායයෑම් අවමකිරීමේ ව්‍යාපෘතිය හා විශේෂ විමර්ශනවලින් අවමකිරීම් අවශ්‍ය යැ යි හඳුනාගෙන ඇති පහත සඳහන් ප්‍රමුඛතා ස්ථාන තුනක නායයෑම් සහ බෑවුම් අස්ථායීතාවයන් 2020 වසරතුල දී සම්පූර්ණ කර ඇත.

අනු අංකය	දිස්ත්‍රික්කය	ව්‍යාපෘතිය/ස්ථානය	පිරිවැය (රු. මි.)
01	බදුල්ල	කහට්ටවල රාහුල විද්‍යාලයය - හපුතලේ අදියර II	23.75
02	බදුල්ල	රත්කරව්ව මහා විද්‍යාලයය - වැලිමඩ	38.09
03	රත්නපුර	කිරිඇල්ල නායයෑම් අවමකිරීම අදියර I සහ II	12.38

නායයෑම් අවදානමක් සහිත ප්‍රදේශ සඳහා ආපද පැතිකඩ සැකසීම

නායයෑමක් සිදුවුවහොත් අපේක්ෂිත ජීවිත හා දේපලහානි ඇතිවීමේ විභවයන් පිළිබඳ ව නායයෑම් අවදානම් සිතියම් මගින් පෙන්නුම් කෙරේ. නායයෑම් ආපද කලාප සිතියම් හා මානව ජනාවාස සිතියම් ඒකාබද්ධ කිරීම මගින් නායයෑම් අවදානම් සිතියම් සංවර්ධනය කර ඇත. මෙම සිතියම් නායයෑම්වලට ලක්විය හැකි ඉඩම් සංවර්ධනය හා භාවිතය සහ ආයෝජනය සඳහා මඟපෙන්වන මෙවලමක් ලෙස භාවිතා කිරීමට හැකිවනු ඇත. පස් අවුරුදු වැඩ සැලැස්මකට ඇතුලත් පහත සඳහන් ක්‍රියාකාරකම් 2020 වසරතුල දී ඉටුකොට ඇත.

- අවදානමට ලක්ව ඇති ඒකකයන් හි දත්ත රැස්කිරීම (මහනුවර හා මාතලේ)
- අවදානම් පැතිකඩ දත්ත පද්ධතිය සංවර්ධනය (රත්නපුර, ගාල්ල, මාතර, මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්ක)
- සංවර්ධනය සඳහා විභවීය භූමි හඳුනාගැනීම (ඉඩම් බැංකු සිතියම්) ගාල්ල, මාතර, හම්බන්තොට හා මාතලේ දිස්ත්‍රික්ක
- විශේෂිත විමර්ශන ස්ථානයන් හි තොරතුරු රැස්කිරීම
- බදුල්ල දිස්ත්‍රික්කයේ නායයෑමට නිරාවරණය වී ඇති පාසල් 17 ක අවදානම් ඇගැයීම
- අවදානම අවමකිරීමේ පියවරයන් හි ප්‍රජා කළමනාකාරීත්ව ක්‍රියාත්මක කිරීම තුලින් නායයෑම් අවදානම අවමකිරීම - (ප්‍රජා ඒකක 20 තුල)
- නායයෑම් නිරාවරණ සිතියම්වල (නුවරඑළිය, රත්නපුර, මාතර, මහනුවර, මාතලේ දිස්ත්‍රික්ක) අවදානම් ඇගැයීම් තුලදී හඳුනාගත් අතිරේක ගොඩනැගිලි වල ගොඩනැගිලි 2000 තොරතුරු රැස්කිරීම
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 35 ක කොට්ඨාශ මට්ටමේ අවදානම් පැතිකඩ සංවර්ධනය කිරීම (කෑගල්ල, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්ක)
- නායයෑම් අනතුරු තර්ජනයට ලක්ව ඇති ප්‍රජාවන්හට ප්‍රමාණවත් කාලයක දී උචිත අයුරින් ක්‍රියාත්මක වීම පිණිස බලගැන්වීම (බදුල්ල, නුවරඑළිය, කෑගල්ල, කළුතර, ගාල්ල, මාතර, මාතලේ යන දිස්ත්‍රික්කවල ප්‍රජා ඒකක 200)

ස්වයංක්‍රීය වර්ෂාමාන ජාලය පුළුල්කිරීම තුලින් තත්කාලීන ව නායයෑම් පුරෝකථනය සහ පූර්ව අනතුරු හැඟවීමේ ශක්‍යතාවය වැඩිදියුණු කිරීම

කාර්යක්ෂම නායයෑම් අනතුරු හැඟවීම් ක්‍රියාවලීන් සඳහා ස්වයංක්‍රීය නියාමනය සහිත වර්ෂාමාන ජාලයක් ස්ථාපනය කර ඇත. අධි තීව්‍රතාවයකින් යුත් වාර්ෂා නිසා පාංශු තෙතමනය අධික ලෙස ඉහළ යාමෙන් බොහෝවිට නායයෑම් ආරම්භ වේ. කාළගුණ අනාවැකි හා ජා. ගො. ප. සංවිධානය විසින් ස්ථාපනය කර ඇති ස්වයංක්‍රීය වර්ෂාමාණ ජාලයෙන් ලබාගන්නා දත්තයන් අනුසාරයෙන් ජා. ගො. ප. සංවිධානය විසින් නායයෑම් පූර්ව අනතුරු හැඟවීමේ නිවේදන නිකුත්කිරීම සිදුකරයි.

මේවන විට ස්වයංක්‍රීය වර්ෂාමාපක 300 කින් සමන්විත පද්ධතියක් ස්ථාපනයකොට ක්‍රියාත්මක වන අතර, පද්ධතිය මඟින් ලබාගන්නා යාවත්කාලීන දත්ත භාවිතයෙන් නායයෑම් පූර්ව අනතුරු හැඟවීමේ ක්‍රියාවලිය සිදුකරයි. අයහපත් කාළගුණ තත්ත්වයන් හි දී 24 පැය පුරා ක්‍රියාත්මක නායයෑම් අනතුරු හැඟවීමේ මධ්‍යස්ථානය, ආපද කළමනාකරණ මධ්‍යස්ථානයේ ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය හරහා නායයෑමට ලක්විය හැකි ප්‍රජාව වෙත පූර්ව අනතුරු හැගවීමේ නිවේදන නිකුත්කිරීම සිදුකෙරේ.







ස්වයංක්‍රීය හා ස්වයංක්‍රීය නොවන වර්ෂාමාන ස්ථානයන්　　*නුවරඑළිය පූර්ව අනතුරු හැඟවීමේ මධ්‍යස්ථානයෙහි වර්ෂාමාන පද්ධතිය*

ශ්‍රී ලංකාවේ රසායනික ආපදා අවදානම විධිමත් ව තක්සේරු කිරීම

රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්තවල සිදුවන අනතුරු ඉහලයාමේ ප්‍රවනතාවයක් දක්නට ලැබෙන අතර ආශ්‍රිත ප්‍රදේශවල අවදානමට ලක්විය හැකි ඒකකයන් මෙම උපද්‍රවයන්ට නිරාවරණය වීම තුලින් මානව ක්‍රියාකාරකම් මත ජනිතවන ව්‍යසනයන්ට පාදක විය හැක. අවදානම තක්සේරු කිරීම සඳහා ක්‍රමාණුකූල ක්‍රියා පටිපාටියක් නොමැතිවීමත්, සමස්ත තත්ත්වය පිළිබඳව මහජනතාව වෙත විනිවිද භාවයෙන් යුතු ව තොරතුරු ගලා නොයාමත් මත තත්ත්වය වඩාත් අයහපත් වේ. අතීත සිදුවීම් තුලින් පවත්නා ආපද කළමනාකරණ ක්‍රියාදමයේ පවත්නා හිඩැස හඳුනාගෙන ඇති අතර රසායනික විපත් සඳහා පවතින විභවයන් අවබෝධකරගනිමින් රසායනික අනතුරු අවමකර ගැනීමේ සැලැස්මක් හා රසායනික අනතුරු ආශ්‍රිත ආපද කළමනාකරණය පිළිබඳ සුදුසු නෛතික පද්ධතියක් හඳුන්වාදීමේ ඇති අවශ්‍යතාවයක් පවතී.

රසායනික ද්‍රව්‍ය භාවිත කර්මාන්තයන් හි අවදානම් තක්සේරු ක්‍රමවේදයක් සහ අවදානම හා බලපෑම තක්සේරුකරණය සඳහා කර්මාන්තවල දත්ත රැස්කිරීමේ දත්ත පද්ධති වේදිකාවක් සංවර්ධනය කර ඇත. කාර්මික රසායන ද්‍රව්‍ය 5 ක් සඳහාවන ආරක්ෂණ මාර්ගෝපදේශ අත්පොතෙහි පළමු වෙළුම ප්‍රකාශයට පත්කර ඇත. රසායනික ආපද කළමනාකරණය සඳහා අදාලවන අධිකාරීන් හඳුනාගැනීම සඳහා සහ ජා. ගො. ප. සංවිධානයේ විද්‍යාඥයින් තුල හා රසායනික ආපද කළමනාකරණය හා සම්බන්ධවන පාර්ශවකාර සංවිධානයන් තුල නිපුනතාවය සංවර්ධනය උදෙසා, මොරටුව විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හා ව්‍යාපෘතියේ ඉංජිනේරු තිස්ස ඒ දෙඩන්ගොඩ මහතාගේ සම්පත් දායකත්වයෙන් වැඩමුළුවක් පවත්න ලදී.

ගොඩනැගිලි තක්සේරුකරණය සහ තත්ත්ව වාර්තාකරණය සඳහා ක්‍රමෝපාය සංවර්ධනය කිරීම

රජය සතු පොදු ගොඩනැගිලි සහ මහජනතාව බහුලව භාවිතා කරන අනෙකුත් ගොඩනැගිලි හිමිකරුවන් විසින් නිර්මිත කාලයකට වඩා පැරණිවීම, ඉපැරණිභාවය නිසා පරිහානියට පත් ව ඇතිබවක් විද්‍යමානවීම, දුර්වල මට්ටමේ ව්‍යුහාත්මක අඛන්ඩතාවයක් සහිතවීම, ව්‍යසනයක දී භෞතික හානිවලට ලක්ව තිබීම, දුර්වල නඩත්තුකරණය හෝ අවම පරිසරයේ සිදුවන ඉදිකිරීම්වල බලපෑම් වැනි හේතූන් මත ජා. ගො. ප. සංවිධානය වෙතින් විමර්ශනයක් පවත්වා තාක්‍ෂණික ඇගැයීම් වාර්තා ලබාගැනීමත්, ඒ සමඟ ඉදිරිපත්වන නිර්දේශ ක්‍රියාත්මක කිරීමත් සිදුකෙරේ. ජා. ගො. ප. සංවිධානය විසින් 2020 වසරතුළ ගොඩනැගිලි 75 ක ව්‍යුහාත්මක ඇගැයීම් හා විමර්ශන සිදුකොට ඇත.

ජා. ගො. ප. සංවිධානය විසින් සිදුකරන ලද වැදගත් ගොඩනැගිලි තත්ත්ව හානි සහ අසමත්භාවයන් තක්සේරුකරණය

කුරුණෑගල පෞරාණික ගොඩනැගිල්ලෙහි හානි හා ප්‍රතිස්ථාපන පිරිවැය තක්සේරු කිරීම

කඩාබිඳ දමන ලද භුවනෙක හෝටලය ලෙස හැඳින්වෙන පෞරාණික ගොඩනැගිල්ලෙහි සහ පුරාවිද්‍යාත්මක වැදගත්කමකින් යුත් පැරණි ජල බැස්මක් ලෙස පැවති කොටස් පිළිබඳ විමර්ශනයක් අධිකරණ නියෝගයකට අනුව සිදුකරන ලදී. මෙම සිදුවීම රට පුරා විරෝධතාවයන් මතුකළ ජාතික ගැටළුවක් බවට පත්විය. ප්‍රතිස්ථාපනය සඳහා වන පිරිවැය සඳහන් වාර්තාව අදාල අධිකාරීන් වෙත ඉදිරිපත් කරන ලදී.

කුරුණෑගල භුවනෙක පෞරාණික ගොඩනැගිල්ලෙහි සිදුව තිබූ හානි

මහනුවර හුවැලිකඩ තට්ටු නිවසක බිඳවැටීම

2020 සැප්තැම්බර් මාසයේ දී මහනුවර හුවැලිකඩ සංඝමිත්තා මාවතේ නිවසක්, අසල්වැසි නිවසකට හානි සිදුකරමින් හා ජීවිත හානි සිදුකරමින් කඩාවැටීම සිදුවිය. ජා. ගො. ප. සංවිධානය විසින් කඩාවැටීම සිදුවූ වහාම කඩාවැටීම හා අසල්වාසී නිවාසවල තත්ත්වය පිළිබඳ ව විමර්ශන සිදුකළ අතර අවට පදිංචිකරුවන් ස්ථානයෙන් ඉවත්කිරීම සඳහා උපදෙස් ලබාදෙන ලදී. අනතුරු ව ජා. ගො. ප. සංවිධානය විසින් බිඳවැටීමට හේතු විමසා බැලීම සඳහා සුන්බුන් ඉවත්කිරීමේ ක්‍රියාවලිය අතරතුර විමර්ශන කටයුතු සිදුකරන ලද අතර ගොඩනැගිලි කොටස්වල තත්ත්වය පරීක්‍ෂා කිරීම හා භූ තාක්‍ෂණික විමර්ශනයක් ද සිදුකරන ලදී. ත්‍රිමාණ අකෘතියක් භාවිතයෙන් ව්‍යුහාත්මක විශ්ලේෂණයන් සිදුකරන ලද අතර කුමන ආකාරයේ ව්‍යුහාත්මක ක්‍රියාවන් ව්‍යුහයේ විවිධ කොටස්වල පැවතී ඇති ද යන්න විමසා බැලීම සඳහා ගොඩනගා ඇති ආකාරය පිළිබඳ සැලැස්මක් ද නිර්මාණය කරන ලදී. ව්‍යුහාත්මක විශ්ලේෂණ හා ගණනයකිරීම් තුළින් තීරණාත්මක කුලුනුවල ස්ථායීතාවය අධ්‍යයනය හා ගොඩනැගිල්ලෙහි අසාර්තකභාවයට පත්ව ඇති ආකාරය තහවුරු කර ගැනීම සිදුකරන ලදී, ඒ අනුව පහළ මට්ටමේ තීරණාත්මක ලෙස භාරයන්ට ලක්ව පැවති ඇති ඇතැම් කුලුනුවල

ව්‍යුහාත්මක අසමත්භාවය මගින් බිඳවැටීම ඇවිලීම සිදුව ඇති බවට යෝජනා විය. වාර්තාවත් අදාල අධිකාරීන් වෙත ඉදිරිපත් කරන ලදී, මෙම සිදුවීමෙන් පසුව එහි ප්‍රතිඵලයක් ලෙස අස්ථාවර යැයි සැක සහිත මහනුවර ප්‍රදේශයේ බොහොමයක් නිවාස සඳහා ගොඩනැගිලි තත්ත්ව ඇගැයීම් සඳහා ඉල්ලීම් ඉදිරිපත් වූ අතර ජා. ගො. ප. සංවිධානය විසින් එබඳු නිවාස 15 ක ඇගැයීම් සිදුකරන ලදී.

මහනුවර භුවැලිකඩ බිඳවැටුණු ගොඩනැගිල්ල

කැප්පෙටිපොළ නිවාස සංකීර්ණයෙහි තත්ත්ව තක්සේරුකිරීම

ජා. ගො. ප. සංවිධානය වෙත ඉදිරිපත් වූ ඉල්ලීමකට අනුව කොළඹ 5, කැප්පෙටිපොළ මාවතෙහි පිහිටි සමුළු නිවාස සංකීර්ණයෙහි තත්ත්ව තක්සේරුකිරීම සිදුකරන ලදී. වර්තමානයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා රජයේ උසස් නිලධාරීන් විසින් භාවිතා කරනු ලබන නිවාස ඒකක 176 ක් මෙම සංකීර්ණය සතු ය. නිවාස ව්‍යුහාත්මක ව ඉතා හොඳ තත්ත්වයේ පවතින බවත්, පඩිපෙළ උස් ඇවිදීමේ මාර්ග සහ ආනතීන් හි ව්‍යාහුත්මක ස්ථායීතාව ආශ්‍රිත ප්‍රධාන දෝෂයන් පවතින බවත් නිරීක්ෂණය විය. විමර්ශනයන් හි ප්‍රතිඵල විධිමත් පරිදි අදාල අධිකාරීන් වෙත දැනුම් දී ඇති අතර ප්‍රතිස්ථාපනයන් සඳහා අවශ්‍යකරන උචිත නිර්දේශයන් ද වැඩිදුරටත් ලබාදී ඇත.

කොළඹ 5 කැප්පෙටිපොළ මාවතේ පිහිටි සමුළු නිවාස සංකීර්ණය

හිගුරක්ගොඩ ප්‍රදේශයේ බලපෑමට ලක්වූ ජනාවාස සඳහා නිර්දේශ

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් හා අනෙකුත් අධිකාරී ආයතන විසින් (පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිගුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ) අංක 66 බුබුල ග්‍රාමනිලධාරී වසම, අංක 65, පාසියාවැව ග්‍රාම නිලධාරී වසම සහ අංක 38 රජඇල ග්‍රාම නිලධාරී වසම යන ප්‍රදේශයන් හි නිවාසවල බිත්ති පැලීම් පෙන්නුම් කිරීම නිසා පදිංචිකරුවන් හට අවදානම් තත්ත්වයක් උදවී ඇති බැවින් අවශ්‍ය විමර්ශනයන් සිදුකරන ලෙස ජා. ගො. ප. සංවිධානය වෙත ඉල්ලීමක් ඉදිරිපත් විය. ජා. ගො. ප. සංවිධානය විසින් එම ප්‍රදේශයෙහි භූ තාක්ෂණික විමර්ශනයක් සිදුකරන ලද අතර ප්‍රදේශයේ ඇතැම් ස්ථානයන් හි පවතින විස්තීරණය මත සුළු පස: පසෙහි තෙතමණය ඉහළයාමත් සමඟ ප්‍රසාරණය වීමත් තෙතමණය අඩුවීමත් සමඟ සංකෝචනය වීමත් සිදුවන බවත් හඳුනා ගැනින. ඒ අනුව මෙබඳු භූමියක සිදුකරන ලද ඉදිකිරීම්වලට

හානි සිදුවිය හැකි අතර මෙම තත්ත්වය 'භූ අනතුරු' තත්ත්වයක් වශයෙන් සැලකේ. ජා. ගො. ප. සංවිධානය විසින් 223 ක පමණ නිවාසවල අවශ්‍ය ගොඩනැගිලි තත්ත්ව ඇගැයීම් සිදුකරන ලද අතර ඇතැම් අධි අවදානම් නිවාසවල පදිංචිකරුවන් ඉවත්කිරීම සඳහා ද ඊට අමතර ව, අධි අවදානමක් සහිත නිවාස කඩාබිඳ දැමීමත් මධ්‍යස්ථ මට්ටමේ අවදානමක් සහිත නිවාස නැවත සකස්කිරීමත් අවම මට්ටමේ අවදානමක් සහිත නිවාස ආරක්ෂිත වාසස්ථාන ලෙස අලුත්වැඩියා කිරීමත් සඳහා උචිත පරිදි නිර්දේශ ලබාදෙන ලදී. ජා. ගො. ප. සංවිධානය විසින් ඉහතින් සඳහන් ක්‍රියාකාරකම් සඳහා සුදුසු වැඩ ක්‍රමවේදයන් ද නිර්දේශ කරන ලදී. විස්තීරණ ස්වභාවයක් සහිත භූමියට ඔරොත්තු දෙන ආකාරයේ ආපදා ප්‍රතිරෝධී ආදර්ශ නිවසක් ඉදිකිරීමට ජා. ගො. ප. සංවිධානය අපේක්ෂා කරන අතර ඒ තුළින් ඉදිරියේ දී ප්‍රදේශයට ගැලපෙන ආකාරයේ නව නිවසක් ඉදිකරන ආකාරය නිවාස ඉදිකරන්නන්ට හා ව්‍යාපාරික ප්‍රජාව වෙත පෙන්වා දීම අපේක්ෂා කර ඇත.

හිඟුරක්ගොඩ ප්‍රදේශයේ නිවාසවල පෙන්නුම්කළ පැලීම්



බලපෑමට ලක්වූ ප්‍රදේශයන්හි ගුගල් සිතියම (කොළ පැහැති - අවම අවදානම් සහිත නිවාස, කහ පැහැති - මධ්‍ය අවදානම් සහිත නිවාස, රතු පැහැය - අධි අවදානම් නිවාස)

පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන්

2020 වසරේ දී රු. මිලියන 12.0 ක ප්‍රතිපාදන පර්යේෂණ සඳහා හිමි විය. පාර්ශවකාර ආයතන සහ ඉදිකිරීම් කර්මාන්තයේ පර්යේෂණ අවශ්‍යතා අධ්‍යයනය සඳහා තාක්ෂණික උපදේශන මැඩමුළුවක් 2020 පෙබරවාරි මස 07 දින ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනයේ දී (SLIDA) හි දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය (DLC) ශ්‍රවණාගාරයේ දී ආරාධිතයින් 50 ක ගේ පමණ සහභාගීත්වයෙන් පවත්වන ලදී. පාර්ශවකරුවන්ගෙන් සහ කර්මාන්තයන් වෙතින් පැමිණි නිරීක්ෂණ ප්‍රතිචාර හා ඉල්ලීම් පරිදි රටතුල ආපදාවලට ඔරොත්තු දීමේ හැකියාව නිර්මාණය කිරීම කෙරෙහි මූලික අවධානය යොමුකරමින් ජා. ගො. ප. සංවිධානය විසින් විස්තීරණ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහනක් සකස්කරන ලදී.

ජා. ගො. ප. සංවිධානයේ පර්යේෂණ කමිටුව විසින් විද්‍යාඥයින් වෙත තම පර්යේෂණ ව්‍යාපෘති අඛණ්ඩ ව කරගෙනයාම සඳහා මාර්ගෝපදේශ හා අවශ්‍ය සහයෝගය සපයන ලද අතර ජා. ගො. ප. සංවිධානය විසින් අවශ්‍ය පහසුකම් ලබාදීම සිදුකරන ලදී. පැවති තත්ත්වය හමුවේ පර්යේෂණ ප්‍රගති රැස්වීම් සඳහා සාමාන්‍ය පරිදි ප්‍රේක්ෂකයින් රැස්කිරීමට අවකාශ නොවූ බැවින් පර්යේෂණයන් හි ප්‍රගතිය පිළිබඳ ව නේවාසිකව අඛන්ඩ ව සිදුවිය. කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සාමාන්‍ය පරිදි ජා. ගො. ප. සංවිධානයෙහි වාර්ෂික පර්යේෂණ සමුළුව දෙසැ. මාසය තුල පැවැත්වීමට නොහැකි විය. 2020 වසරතුල දී සිදුකරන ලද පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතීන් පහත සඳහන් වේ.

2020 වර්ෂයේ පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති

ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශවල වාතයෙහි ගුණාත්මකභාවය පිළිබඳ පුරෝකථනය සහ පෙර සූදානම්වීමේ පද්ධතිය සඳහා තත්‍යකාලීන වායු තත්ත්ව අධීක්ෂණ ජාලය සංවර්ධනය කිරීම

නාගරික ප්‍රදේශවල වායු දූෂණ මට්ටම් ඉහලයාම සමඟ නාගරික වායු දූෂණ නිරීක්ෂණයන් හා ඒ ආශ්‍රිත අවදානම් හඳුනාගැනීම වැදගත් කාරණයක් බවට පත්වෙමින් ඇත. මේ සම්බන්ධයෙන් දූෂණ ප්‍රභවයන් හා ඒවායේ දයකත්වය අවබෝධකර ගැනීම සඳහා හේතුවන අනෙකුත් සාධක හඳුනාගැනීමට අඛන්ඩ ව තත්කාලීන වායු තත්ත්ව නිරීක්ෂණ දත්ත අවශ්‍ය වේ. සාක්ෂි මත පදනම් අනතුරු හැඟවීමේ පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා පෙර සූදානම් තත්ත්ව ක්‍රියාවන් සැලසුම්කිරීමේ දී මෙම දත්ත අත්‍යවශ්‍ය වේ.

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ විවිධ ප්‍රදේශවල අවට පරිසරයේ වායු ගුණාත්මකභාවය මැනීම සහ එය පරිශීලක අතුරු මුහුණත ප්‍රදර්ශනය සඳහා තත්කාලීන අධීක්ෂණ ජාලයක් සංවර්ධනය කිරීම යි. PM1.0, PM2.5, PM10, සහ CO_2 නිවැරදි මිනුම්කරණ සඳහා ආලෝකය පදනම් වූ විසුරුම් මූලධර්ම සහ අනෙකුත් උසස් ඇල්ගොරිතමයන් ඇතුලත් සංවේදක තාක්ෂණය භාවිතා කරන සංවේදක උපකරණයක් සංවර්ධනය කිරීමට පර්යේෂණ කාණ්ඩායම සමත් විය. මෙම උපකරණය සමඟ සම්පූර්ණයෙන් ම ඩිජිටල් ප්‍රතිපාදනයන් (UART හා I2C අතුරු මුහුණත්) ක්‍රමාංකනය කර ඇති අතර රැස්කරන ලද දත්තයන් බීටා අවධාන තාක්ෂණයට එදිරිව වලංගුකරණය සිදුකර ඇත. පහසුවෙන් එහා මෙහා ගෙනයාහැකි පරිශීලනයට පහසු මෙම උපකරණය මගින් අවම නඩත්තු කිරීම් හා අඩු පිරිවැයක් යටතේ නිරවද්‍ය මිණුම් ලබාගැනීමේ හැකියාව පවතී. මෙහි ඇති සැහැල්ලු නිමාව හේතුවෙන් ඉතා කුඩා ඉඩ ප්‍රමාණයක සම්පූර්ණයෙන් ස්ථාපනය කිරීමේ හැකියාව සහිත ය. උපකරණය අභ්‍යන්තරයෙහි තත්‍යකාලීන දත්ත ගබඩාවකින් හා සම්ප්‍රේෂණ පහසුකම්වලින් සමන්විත වේ. මෙම උපකරණය මේවන විට කොළඹ, ගම්පහ, කළුතර, මහනුවර, කුරුණෑගල, රත්නපුර, ගාල්ල, අනුරාධපුර, බදුල්ල, පුත්තලම, යාපනය වවුනියාව, සහ නුවරඑළිය යන

තෝරාගත් නාගරික කලාප තුල වායු තත්ත්ව නිරීක්‍ෂණයන් සඳහා භාවිතා කෙරේ. මෙම පද්ධතිය ඔස්සේ රැස්කරනු ලබන දත්තයන් ගාස්තු රහිත ව ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන පාර්ශව වෙත ප්‍රතිපත්ති සම්පාදකයන් සහ මහජනතාව වෙත ඩිජිටල් මාධ්‍ය භාවිතයෙන් ලබාදීම සිදුකරයි. වැඩිදුරටත් මෙම දත්තයන් හි සාක්ෂි මත පදනම් අනතුරු හැඟවීමේ පද්ධතියක් හා අධි අවදානම් තත්ත්වයන් කළමනාකරණය කිරීම සඳහා පූර්ව සූදානම ක්‍රියාකාරී සැලැස්ම සංවර්ධනය කිරීමට භාවිතා කරනු ඇත. වායු දූෂණය සම්බන්ධයෙන් ඉහලම මට්ටමක පවතින නාගරික ප්‍රදේශ තුනක ඩිජිටල් දර්ශන පුවරු භාවිතයෙන් සහ ජනමාධ්‍ය භාවිතයෙන් සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම අනාගතයේ දී සිදුවනු ඇත.

කුඩා වැව් ආශ්‍රිත පරිසර පද්ධතිවල ජල විද්‍යාත්මක ක්‍රියාකාරකම් සහ තිරසාර ජල කළමනාකරණයේ දී එහි භූමිකාව

වසර දහස් ගණනක් පුරා ශ්‍රී ලංකාවේ වියළි කලාපය තුල කුඩා වැව්වල භාවිතාව තිරසාර ජල කළමනාකරණ ක්‍රියාමාර්ග හේතුවෙන් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කුඩා වැව් කාලගුණයට අනුවර්තනය වීමේ ඉතා යහපත් විසඳුමක් ලෙස පිළිගෙන ඇත. කුඩා වැව් පද්ධතිවල ජල විද්‍යාත්මක ක්‍රියාකාරකම් මාලාවකින් යුත් සුවිශේෂීත්වය නම්, සාමාන්‍ය මතුපිට ජලය රඳවාගැනීමකට වඩා වැඩිකාලයක් නිදහසේ ගලායන ජලය පාංශු තෙතමනය පවත්වාගැනීම සඳහා රඳවා තබා ගැනීම, භූගත ජලය ප්‍රතිපෝෂණ හැකියාව සඳහා දායකවීම මෙන් ම වාෂ්පීකරණ අවශ්‍යතා සපුරමින් පරිසර පද්ධතිය පෝෂණය කිරීමේ හැකියාව ආදිය වේ. මෙම පර්යේෂණයේ දී සිද්ධි අධ්‍යයනයන් ලෙස කුඩා ග්‍රාමීය වැව් දෙකක් ආශ්‍රිත පරිසර පද්ධතීන් හි විවිධ ජල පාරිසරික කලාපවල දීර්ඝ නියඟ කාලයන් තුල පාංශු තෙතමනය විචලනයක් පිළිබඳ ව ගවේෂණය සිදුකරයි.

ශ්‍රී ලංකාවේ නායයෑම් සඳහා කාලපීය සහ ප්‍රාදේශීය වර්ෂාපතනය සීමාවන් නිර්ණය කිරීම

නායයෑම් ලොවපුරා සෑම වසරකම දේපලවලට හා මිනිස් ජීවිතවලට දැඩි හානි සිදුකරන ප්‍රමුඛ භූ උවදුරුවලින් එකකි. නායයෑම් සඳහා වඩාත් වැදගත් හා නිරන්තර ප්‍රේරක සාධකය වර්ෂාපතනය ලෙස හඳුනාගත හැකිය. වර්ෂාපතනය නිසා ජලය යටි පසට කාන්දුවීම මගින් සිදුරු ජල පීඩනය වැඩිවන අතර එමනිසා පාංශු හරස්කඩ ශක්තිය අඩුවීම නායයෑම් ආරම්භයට දායක වේ. එබැවින් ඵලදායී නායයෑම් පූර්ව අනතුරු හැඟවීමේ පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා වර්ෂාපතන සීමාවන් තීරණයකිරීම අත්‍යවශ්‍ය කාරණයක් බව පෙනී යයි. මෙම පර්යේෂණයේ දී අතීත නායයෑම් සහ ඒ ආශ්‍රිත සමුච්ත වර්ෂාපතනයන් ආධාරයෙන් කළුගඟ ද්‍රෝණිය සඳහා දේශීය වර්ෂාපතන සීමාවන් සංවර්ධනය සඳහා උත්සාහ කර ඇත. 2015 වර්ෂයෙන් පසුව සිදුවූ නායයෑම් 37 කදී ද්‍රෝණිය පුරා ස්ථාපිත වර්ෂාමාන 10 ක් පදනම් කරගනිමින් වර්ෂාපතන වාර්තා භාවිතා කරන ලදී. ලබාගත් ප්‍රතිඵලයන්ට අනුව අධ්‍යයන ප්‍රදේශයේ නායයෑම්වලින් 89% ක් ම ආරම්භ වී ඇත්තේ පැය 2 සිට 4 දක්වා කාලයක් තුල බලපැවති මිලි මීටර් 260 ට වඩා වැඩි සමුච්චිත වර්ෂාපතන අගයන් එනම් උපරිම දින තුනක් තුලදී ලැබී ඇති අවස්ථාවන් හිදී ය. ඉතිරි 11% ක ප්‍රමාණයක් වන නායයෑම් සාපේක්ෂ වශයෙන් අඩු සමුච්චිත වර්ෂාපතන අගයන් එනම් මිලි මීටර් 190 ට අඩු හා පැයක් තුල ඉහල වර්ෂාපතන අගයන් එනම් මිලි මීටර් 70 ට වැඩි අවස්ථාවල දී ය. තව ද මෙම 11% ක නායයෑම් සිදුව ඇත්තේ දැනටමත් අස්ථාවර බෑවුම් ආශ්‍රිත ව වීම මගින් කෙටිකාලීන තීව්‍රතාවයෙන් ඉහල වර්ෂාපතනයන් සමඟ අස්ථාවර බෑවුම් සාපේක්ෂ වශයෙන් පහල සමුච්චිත වර්ෂාපතන අගයන් හි දී පවා නායයෑම් සිදුවිය හැකි බව පෙන්නුම් කෙරේ.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගෘහස්ථ ජල හිඟය ජයගැනීම සඳහා වහලය මත පදනම් තිරසාර වැසිදිය එක්රැස් කිරීම

නියඟය පිළිබඳ දේශගුණික සාධකයන් හි නූතන විශ්ලේෂණයන්ට අනුව වසර 30 ක සාමාන්‍ය අගයට වඩා වර්ෂාපතනයේ සැලකිය යුතු අඩුවීම නියඟය සඳහා ප්‍රධාන හේතුව වී ඇත. එය රටෙහි වියළි කලාපය ආශ්‍රිත දිස්ත්‍රික්කවලට බලපා ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස ගෘහස්ථ පානීය ජල හිඟය, ජීවනෝපායන්ට ඍණාත්මක බලපෑම් සහිත ව කෘෂිකර්මාන්තය සඳහා අඩු නැඹුරුතාවය, සෞඛ්‍ය හා ජීවන රටාවන් හි මෙන් ම ආර්ථික පසුබෑමට ලක්වීම ද ඇති කරයි.

නිසි ලෙස සැලසුම් කරන ලද හා ක්‍රියාත්මක වහලය මත පදනම් වූ වැසි දිය රැස්කිරීමේ පද්ධති, දීර්ඝකාලීන ව ජලය නිසා පීඩාවන්ට පත් ප්‍රජාව තුල ගෘහස්ත ජලය සඳහා වන පීඩනය කළමනාකරණය සඳහා තිරසාර විසඳුමක් වුවද පද්ධතියෙහි විශ්වාසනීයත්වයට අදාලවන පුළුල් පරාසයක සාධක හේතුවෙන් ජලය නිසා පීඩාවට පත් ප්‍රජාව අතර වහලය මත පදනම් වැසිදිය රැස්කිරීම් වඩාත් ජනප්‍රිය තිරසාර විකල්පයක් නොවේ. ජා. ගො. ප. සංවිධානය විසින් මෙහෙයවන ලද අධ්‍යයනය මඟින් අනාවරණය වී ඇත්තේ ශ්‍රී ලංකාව තුල බොහෝ ස්ථානයන් හි පවතින වැසි දිය රැස්කිරීම් (RWH) පද්ධතීන් හි ක්‍රියාකාරීත්වයන් උචිත නොවූ සැලසුම්කරණය හා වැරදි ස්ථාපනය කිරීම මෙන් ම වසර කිහිපයක් පැවතීමේ නොහැකියාව හේතුවෙන් මූලික වශයෙන් සතුටුදායක නොවන බවයි. වියළි කලාපීය ප්‍රජාවන් සඳහා වහලය ආශ්‍රිත ව වැසි දිය රැස්කිරීමේ පද්ධති (RRWHS) ස්ථාපනය කිරීමේ වැදගත්කම හඳුනා ගනිමින් අධ්‍යයන කණ්ඩායම විසින් දැනට පවත්නා පද්ධතිවල ඇති අභියෝග හා ප්‍රශ්නමාලාවන් ජයගනිමින් තිරසාර RRWHS පද්ධති නිර්මාණය කර ඇත.

ප්‍රායෝගික ක්‍රියාකාරී පර්යේෂණයක් වශයෙන් වැසි ජල රැස්කිරීමේ පද්ධති අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් නිවාස ඒකකයන් සඳහා භාවිතයට යොදවා ඇත.





ශ්‍රී ලංකාව සඳහා ගොඩනැගිලි සංග්‍රහය

ශ්‍රී ලංකාව තුල ගිනිගැනීම් හා විපත් නිසා සිදුවන බිඳවැටීම් ඉහලයාමේ ප්‍රවනතාවයක් නිරීක්ෂණය වේ. ඉතා උස්වූ ගොඩනැගිලි සහාධිපත්‍ය සහ විශාල ගොඩනැගිලි සංකීර්ණ සම්බන්ධ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වර්ධනයක් සමඟ ශ්‍රී ලංකාව සඳහා 'ගොඩනැගිලි සංග්‍රහයක' අවශ්‍යතාව අවධාරණයට ලක් ව ඇත. ගොඩනැගිලි සංග්‍රහය යනු විෂය ක්ෂේත්‍ර ගණනාවක ඒකාබද්ධ වීමකි. ගොඩනැගිලි සංග්‍රහය සංවර්ධනය කිරීම මධ්‍යම ඉංජිනේරු කාර්යාංශය (CECB) විසින් භාරගෙන ඇත. කෙසේ වෙතත් ජා. ගො. ප. සංවිධානය විසින් 'ආපදාවන්ට ඔරොත්තුදීමේ මාර්ගෝපදේශ' පිළිබඳ තාක්ෂණික ප්‍රදානයන් සැපයීම සිදුකරනු ලබයි. මෙම ව්‍යාපෘති අධ්‍යනයන් සමඟ 'ආපදාවන්ට ඔරොත්තුදෙන නිවාසකරණය සඳහා ගොඩනැගිලි සංග්‍රහය' සංවර්ධනය කිරීම ඇරඹීම සිදුවිය. මෙම අධ්‍යයනයන් තුලදී අනෙකුත් රටවල

ගොඩනැගිලි සංග්‍රහ පුරුදු සහ ඒ අයගේ අතීත අත්දැකීම් පිළිබඳ ව තක්සේරු කිරීම සිදුවිය. ශ්‍රී ලංකාව සඳහා ගොඩනැගිලි සංග්‍රහයෙහි වඩාත් උචිත අනුවර්තනය වීමේ ප්‍රවේශයන් පිළිබඳව ද විශ්ලේෂණය සිදුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ආපදාවන්ට ඔරොත්තු දෙන ඉදිකිරීම් සංග්‍රහය/පරිච්ඡේදය සංවර්ධනය කර නිකුත් කර ඇති අතර විස්තරාත්මක ලේඛන සංවර්ධනය කර ප්‍රකාශයට පත්කිරීම සඳහා සූදානම් කර ඇත.

ඉවතලන ද්‍රව්‍ය භාවිතයෙන් පිරිවැය ඵලදයී හරිත පෙදරේරු ම ය නිෂ්පාදන සංවර්ධනය

(වැඩිදියුණු කරන ලද කම්පන අවශෝෂක හා ජල පාරගම්‍ය ලක්‍ෂණ සහිත බිම් ඇතිරුම් ගල් නිශ්පාදනයේ දී රෙදිපිලි අපද්‍රව්‍ය භාවිතය)

ඇගලුම් කර්මාන්තයේ දී අපද්‍රව්‍ය ලෙස සැලකෙන කැපී ඉවත්වන කෘතිම තන්තු මිශ්‍ර රෙදිපිලි (පොලියෙස්ටර් ස්පැන්ඩෙක්ස්) වර්තමානයේ සිමෙන්ති නිෂ්පාදන ක්‍රියාවලියේ දී ඉන්ධන ලෙස පුළුස්සා දමනු ලබන අතර ශේෂයන් නීති විරෝධී බැහැරකිරීම් බවට පත්වේ.

Figure : Field application of fabric embedded paving blocks

ඒ අනුව රෙදි කාවද්දන ලද බිම් ඇතිරුම් ගල් පරිමාවෙන් 26% ක් රෙදි, වැලි - සිමෙන්ති මිශ්‍රන සමඟ මිශ්‍ර කිරීමෙන් රෙදිවල උපරිම වැරගැන්වුම් බලපෑම් සහිත ව සංවර්ධනය කර ඇත. සංවර්ධනය කරන ලද බිම් ඇතිරුම් ගල් කොන්ක්‍රීට් බිම් ඇතුරුම් ගල් සඳහාවන BSEN 1338: 2003 හි නිශ්චිත ව දක්වා ඇති අවශ්‍යතාවන් සඳහා පරීක්‍ෂණ ක්‍රමවේදයන් හා අවශ්‍යතා යටතේ පරීක්‍ෂාකරන ලදී. අතිරේක අංගයක් ලෙස සංවර්ධනය කරන ලද බිම් ඇතුරුම් ගලකට බලපෑම් බලය 20% කින් අවම කිරීමේ හැකියාව පවතින අතර එළිමහන් ක්‍රීඩා මතුපිටක පාදයන්ට වඩාත් සුව පහසුව සඳහාවන අවශ්‍යතාවයක් සපුරාලනු ලබයි. තව ද සංවර්ධනය කරන ලද රෙදි කාවැද්දූ බිම් ඇතිරුම් ගල්වල ජලය කාන්දු කරන හැකියාව සාම්ප්‍රදායික කොන්ක්‍රීට් බිම් ඇතිරුම් ගල්වලට වඩා 100 ගුණයකින් පමණ ඉහලවන අතර ඒ මඟින් අධික වර්ෂා අවස්ථාවල දී මතුපිට ජලය ගලායාම සැලකිය යුතු ලෙස අවමකිරීමේ හැකියාවක් පවතී. රෙදි කාවද්දන ලද බිම් ඇතිරුම් ගලක නිශ්පාදන වියදම නිෂ්පාදන පරිමාණය මත රඳාපවතින අතර ඒ අනුව එක් බිම් ඇතිරුම් ගලක් සඳහා (200mm x 100mm x 60) නිෂ්පාදන අමුද්‍රව්‍ය පිරිවැය රු. 29.90 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. පරීක්‍ෂණාගාර පරීක්‍ෂාවන්ගෙන් අනතුරු ව අත්හදාබැලීමක් ලෙස බිම් ඇතුරුම් ගල් 500 ක ප්‍රමාණයක් ජා. ගො. ප. සංවිධානයෙහි ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ අඩිපාරක් ආවරණය සඳහා අතුරා ඇති අතර එහි ක්‍රියාකාරීත්වය සතුටුදායක මට්ටමක පවතී.

අගය එකතුකල නිෂ්පාදන සඳහා අක්වෙරළ වැලි රොන්මඩවල යෝග්‍යතාව

ගංගා වැලි ඉදිකිරීම් කාර්මාන්තයේ අමුද්‍රව්‍යයක් වශයෙන් භාවිතාකරන අතර ශ්‍රී ලංකාව තුල අධික ලෙස නිස්සාරණය නිසා අහිතකර පාරිසරික බලපෑම් අතිවන තත්ත්වයක් දක්වා වර්ධනය වී ඇත. ඒ අනුව ඉහලයමින් පවතින මෙම ප්‍රශ්නයට විසඳුමක් ලෙස 2002 වසරේ දී ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLRDC) විසින් ගංගා වැලි සඳහා විකල්පයක් ලෙස අක්වෙරළ වැලි හඳුන්වාදෙන ලදී. අක්වෙරළ වැලි සැකසීමේ ක්‍රියාවලිය තුල දී රොන්මඩ (OSS) අතුරුඵලයක් ලෙස නිෂ්පාදනය වන අතර එහි ප්‍රමාණය මසකට ඝන අඩි 150 ක් පමණ වේ. වර්තමානය වන විට මෙම රොන්මඩ භූමි පිරවීම් සඳහා හෝ අනවසර බැහැරකිරීම් ලෙස ඉවත්කරයි. පරිමා ධාරිතාවය පුරා ගලායාමක් සිදුවන බැවින් භූමි පිරවීම් කටයුතුවල දී මෙම අක්වෙරළ වැලි ආශ්‍රිත රොන්මඩ භාවිතය ආර්ථික වශයෙන් එතරම් ශක්‍යතාවයක් සහිත නොවන්නකි. එමනිසා ඛනිජ විද්‍යාත්මක සංයුතිය හා සැසඳෙන ආර්ථික ම ය හා පරිසර හිතකාමී වෙනත් විකල්ප භාවිතයක් පිළිබඳ ව අධ්‍යයනය වැදගත් වේ. මෙම අධ්‍යයනයේ අරමුණ අක්වෙරළ වැලි මඟින් වෙන්කෙරෙන රොන්මඩ භූමි පිරවීම වෙනුවට ඉදිකිරීමේ කර්මාන්තයේ ද්වීතික භාවිතයන් සඳහා යොදගැනීමේ ශක්‍යතාව විමසා බැලීම සඳහා එහි ඇති මූලද්‍රව්‍ය ම ය ගුණාංග හඳුනා ගැනීම යි.

රොන්මඩ (OSS) නියැදීන් අක්වෙරළ වැලි එකතු කරනු ලබන එකිනෙකට වෙනස් ස්ථානයන්ගෙන් ලබාගන්නා ලද අතර මූලද්‍රව්‍ය සංයුතිය සහ අනෙකුත් භෞතික ගුණාංග තීරණය කිරීම සඳහා XRF හා වෙනත් පරීක්ෂණයන් සංලක්ෂිත කරන ලදී. අක්වෙරළ වැලි ආශ්‍රිත රොන්මඩවල ප්‍රධාන සංයෝගයන් සිලිකන්ඩයොක්සයිඩ (SiO_2 (49.5%)) සහ කැල්සියම් ඔක්සයිඩ (CaO) (32.6%) බව අනාවරණය විය. ජ්වලන පරීක්ෂණයෙහි ප්‍රතිඵල නොමැතිවීමෙන් පෙන්නුම් කලේ රොන්මඩෙහි 0.99% පහත් අගයක තිබූ බව යි. රොන්මඩ අංශුවල ප්‍රමාණයන් පිළිබඳ පරාසය BSEN ප්‍රමිතීන්ට අනුකූල ව නිර්ණය කරන ලද අතර ප්‍රධාන අංශූන් 0.5mm සිට 0.125mm පරාසය තුල වන බව නිගමනය විය. BS 1744 ප්‍රමිතීන්ට අනුව සියුම් අංශු අන්තර්ගතය (2.17%) අම්ල-ද්‍රාව්‍ය සල්ෆේට හා (0.004%) ජල-ද්‍රාව්‍ය ක්ලෝරයිඩ අන්තර්ගතවන බව නිර්ණයවිය. මෙකී ප්‍රධාන ගුණාංගයන් අනාගත වැඩිදුර අධ්‍යයනයන් සඳහා සුදුසු මඟපෙන්වීමක් විය. පරීක්ෂණවල ප්‍රතිඵලයන් අනුව අක්වෙරළ වැලි ආශ්‍රිත රොන්මඩ (OSS) ඉදිකිරීම් ක්ෂේත්‍රයේ මහත් ඉල්ලුමක් ලෙස ටයිල් මැලියම් සඳහා පිරවුම් කාරකයක් ලෙස භාවිත කිරීමේ හැකියාව පවතින බව අනාවරණය විය.

එබැවින් පර්යේෂණයේ මීලඟ පියවර වශයෙන් ජා. ගො. ප. සංවිධානය අක්වෙරළ වැලි ආශ්‍රිත රොන්මඩ (OSS) භාවිතයෙන් (පිරවුම් මාධ්‍යය ලෙස) 'ටයිල් මැලියම්' පර්යේෂණාගාර මට්ටමින් නිෂ්පාදනය කිරීමට කටයුතු කරමින් සිටී. නිෂ්පාදනය කරන ලද ටයිල් මැලියම් නියැදීන් ISO 13007-2 ප්‍රමිතීන්ට අනුකූල වේද යන්න නිරීක්ෂණය කෙරෙනු ඇත.



අක්වෙරළ වැලි ආශ්‍රිත රොන්මඩ භාවිතයෙන් සැකසූ ටයිල් මැලියම් භාවිතය

කොහු හූ ඇතිරුම් රෙදිපිළි සඳහා පරීක්ෂණ ක්‍රම සහ පිරිවිතර සංවර්ධනය

දේශීය හා අන්තර්ජාතික වෙළෙඳපොල ඉලක්ක කරගනිමින් ජෛව හායනාත්මක නිෂ්පාදනයන් සඳහා බහුල වශයෙන් භාවිතාකරන කොහු කෙඳි ජෛව හායන හැකියාව ඇති අමුද්‍රව්‍යයකි. කොහු ආශ්‍රිත හූ ආවරණ නිෂ්පාදනය හා සම්බන්ධ වූ ප්‍රධාන නිෂ්පාදකයින් පස් දෙනෙකු සිටින බව හඳුනාගෙන ඇත. කොහු හූ ඇතිරුම් රෙදි, පැදුරු, අතින් අඹරණ ලද ලණු හා යන්ත්‍රානුසාරයෙන් අඹරණ ලද ටුවයින් භාවිතයෙන් නිෂ්පාදනය කරනු ලබයි. ඒවා පාංශු ඛාදනය වැලැක්වීමේ පිරවුම් ලෙස භාවිතා කරන අතර ඒවා සියළුම පාංශු ජෛව ඉංජිනේරු ම ය හා ඇල ඉවුරු ඛාදනයන්, බෑවුම් තෙත්බිම්, කඳුකර පස මෙන් ම ගොල්ෆ් පිටි සංවර්ධනයෙහි දී ද භාවිතා කළ හැක. දේශීය නිපැයුම්කරුවන් තුල හූ ඇතිරුම් සඳහාවන ප්‍රමිතිගත පරීක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳ ව නොදැනුවත්භාවය නිසා ඒවායේ ආතන්‍ය ශක්තිය විදුත් සන්නායකතාව මෙන් ම වඩාත් වැදගත් වශයෙන් කල්පැවැත්ම තීරණය කිරීමේ නොහැකියාව පවතී. ඉන්දීය ප්‍රමිතීන් IS 15868 (1 සිට 6 කොටස්) තුල ස්වභාවික තන්තු ආශ්‍රිත හූ ඇතුරුම් රෙදිපිළි සඳහාවන පර්යේෂණ ක්‍රම, නියමකර ඇති අතර වර්ග මීටරයක ස්කන්ධය, ඝණකම, ඉදිවුම් ප්‍රතිශතය, ජල අවශෝෂක ධාරිතාවය, දැරිය හැකි ප්‍රතිරෝධය සහ දැලෙහි ප්‍රමාණය පිළිබඳ ව ඇතුලත්කර ඇත. එමනිසා ආතන්‍ය ශක්තීන් විදුත් සන්නායකතාව සහ කල්පැවැත්ම හා ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය සඳහා උචිත පරීක්ෂණ ක්‍රමවේදයන් සංවර්ධනය කොහු ආශ්‍රිත කර්මාන්තයන් සඳහා වාසිදයක වනු ඇත. ප්‍රතිඵල වශයෙන් කොහු ආශ්‍රිත හූ ඇතිරුම් නිෂ්පාදනයන් සඳහා පිටුබලයක් වේ.

කොහු ආශ්‍රිත දැල් ඛාදනයන් පාලනය හා වගාවන් සඳහා භාවිතය පිළිබඳ හඳුනාගැනීමේ පර්යේෂණයෙහි ලේඛනගත සමීක්ෂණ මේවන විට සිදුකොට ඇත. නිෂ්පාදකයන් හා අපනයනකරුවන් පිළිබඳ සමීක්ෂණය ද මාර්ග ගත ක්‍රමය ඔස්සේ සිදුකර ඇත. මෙය ඔවුන්ගේ නිෂ්පාදනයන් හා අපනයනයන් සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇති සාධක හඳුනාගැනීමෙහි ලා වැදගත් වේ. එකී තොරතුරු මත පදනම් ව පර්යේෂණයේ මාවත තීරණය කර ඇති අතර පරීක්ෂණ පිරිවිතරයන් සංවර්ධනය සඳහා පහසු මාර්ග හඳුනාගැනීම මේවන විටත් සිදුකොට ඇත. මෙම පර්යේෂණය 2021 වර්ෂය තුල දී ද ඉදිරියට ක්‍රියාත්මක වනු ඇත.

ශ්‍රී ලංකාවේ ගෘහාස්ශ්‍රිත වටපිටාවේ සහ ගෘහයේ දූහුවිලි තුල ‘ක්‍රයිසොටයිල්’ ඇස්බැස්ටස් තන්තු සාන්ද්‍රණය සහ වැදගත්කම පිළිබඳ වායු තත්ත්ව අධ්‍යයනය

මෙම ව්‍යාපෘතිය යටතට ශ්‍රී ලංකාවේ නාගරික, අර්ධ නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල ගෘහස්ථ හා අවට වටපිටාවෙහි වාතයේ ඇති ‘ක්‍රයිසොටයිල්’ තන්තු මට්ටම් හඳුනාගැනීම ඇතුලත් වේ. මෙහි ප්‍රධාන අරමුණ කොළඹ හා අනුරාධපුර දිස්ත්‍රික්ක ආශ්‍රිත ව නාගරික, අර්ධ නාගරික හා ග්‍රාමීය ප්‍රදේශයන් හි ගෘහස්ථ හා අවට පරිසරයේ වායුවෙහි ‘ක්‍රයිසොටයිල්’ තන්තු අන්තර්ගතය පරීක්ෂා කිරීම හා ‘ක්‍රයිසොටයිල්’ තන්තු අන්තර්ගත නිෂ්පාදන භාවිතය සහ වායුවෙහි හටගන්නා ‘ක්‍රයිසොටයිල්’ මට්ටම අතර සම්බන්ධයන් හඳුනාගැනීම මගින් අවශ්‍ය වේනම් ගෘහස්ථ වායු තත්ත්වයන් පිළිබඳ සාධාරණ වායු තත්ත්ව මාර්ගෝපදේශයක් ස්ථාපනය කිරීම යි. ජා. ගො. ප. සංවිධානය වෙත විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් ජාතික පර්යේෂණ සභාව හරහා ව්‍යාපෘති වටිනාකම රු. මිලියන 4.98 කින් යුත් මෙම ව්‍යාපෘතිය 2019 පෙබරවාරි මස 27 දින පිරිනමන ලදී. මෙහි ආරම්භය සඳහා ශ්‍රී ලංකාව වෙත රුසියානු වානිජ හා කර්මාන්ත මණ්ඩලය අරමුදල් සපයන ලදී. වසර දෙකක ව්‍යාපෘති කාලය තුල ඇස්බැස්ට්‍රස් නියැදිකරණය ‘අදියර පරස්පර අන්වීක්ෂීය ක්‍රමය’ භාවිතයෙන් තංතු ගණනය හා විශ්ලේෂණයක් සම්පූර්ණ කිරීමට ජා. ගො. ප. සංවිධානය සමත් විය. කාර්තු ම ය වශයෙන් වාර්තා ඉදිරිපත් කිරීම සිදුකරන ලද අතර එක් පර්යේෂණ පත්‍රිකාවක් ප්‍රකාශයට පත් කරන ලදී. වර්තමානය වනවිට අවසන් ව්‍යාපෘති වාර්තාව සම්පාදනය සහ ජාත්‍යන්තර පර්යේෂණ පත්‍රිකා දෙකක් ලේඛනගත කිරීම් සිදුවෙමින් පවතී.

සිම්පෝසියා

බහුවිධ උපද්‍රව පූර්ව අනතුරු හැඟවීම් සහ ආපදා අවදානම අවමකිරීම පිළිබඳ ජාත්‍යන්තර සමුළුව (MHEW 2020)

තාක්ෂණික හා විද්‍යාත්මක පර්යේෂණ භාවිතාවන් හා අවස්ථාවන් ප්‍රවර්ධනය මෙන් ම ආපදා අවදානම අවමකිරීම පිළිබඳව සෙන්ඩායි වැඩසටහන සැලැස්ම, දිරිගැන්වීම හා ක්‍රියාත්මක කිරීම උදෙසා බහුවිධ උපද්‍රව පූර්ව අනතුරු හැඟවීම් හා ආපදා අවදානම් අවමකිරීම පිළිබඳ ජාත්‍යන්තර සමුළුම 2020 දෙසැ. 14 දින සිට 16 දක්වා අතත්‍ය සිදුවීමක් ලෙස පවත්වන ලදී.

මෙම සමුළුවෙහි පූර්ණ සමාරම්භය හා තාක්ෂණික සැසිවාරයන් තුළ දී ප්‍රධාන දේශනයන් හා බොහෝ ඉදිරිපත්කිරීම් සිදුකරන ලදී. ප්‍රධාන සැසිවාරය මෙහෙයවීම එක්සත් රාජධානියේ හඩ්ස්ෆීල්ඩ් විශ්වවිද්‍යාලීය ගෝලීය ආපදා මධ්‍යස්ථානයේ මහචාර්ය දිලන්ති අමරතුංග, තායිලන්තයේ ආසියානු පෙරසූදානම් කරන මධ්‍යස්ථානයේ සිසිර මදුරප්පෙරුම සහ ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ චතුර ලියනාරච්චි යන අය විසින් පූර්ණ සැසිවාරය මෙහෙයවන ලද අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්, මහාචාර්ය කපිල පෙරේරා, ග්‍රාමීය මාර්ග හා අනෙකුත් යටිතල පහසුකම් පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය රංජිත් දිසානායක, ශ්‍රී ලංකා ආරක්ෂක අමාත්‍යාංශයේ ආරක්ෂක ලේකම්, ජනරාල් (විශ්‍රාමික) ජී. ඩී. එච්. කමල් ගුණරත්න, ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනමෙහි සභාපති, ආචාර්ය රංජිත් සේනාරත්න, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්, මේජර් ජෙනරාල්, සුදන්ත රණසිංහ සහ කොළඹ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සෞඛ්‍ය සේවා) මහාචාර්ය, හේමන්ත හේරත් යන අය මෙම සැසිවාරය සඳහා සහභාගී වූ අතර ''බහුවිධ උපද්‍රව පූර්ව අනතුරු හැඟවීම්'' (MHEW) සහ ''ආපදා අවදානම් අවමකිරීම'' (DRR) සඳහා වන ප්‍රකාශනයන් සම්මත කරගන්නා ලදී.

මෙම සමුළුවෙහි විශේෂ අවස්ථාව වූයේ ජා. ගො. ප. සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්, ඉංජිනේරු (ආචාර්ය) ආසිරි කරුණාවර්ධනයන් ගේ ප්‍රධානත්වයෙන් පැවති ''අනාගතයේ ඔරොත්තුදීම සඳහා ස්වභාවධර්මය පදනම් කරගත් විසඳුම්'' (NBS) යන තේමාව යටතේ වූ පූර්ණ සැසිවාරය යි. මෙම පූර්ණ සැසිවාරය තුළ දී පහත සඳහන් ප්‍රධාන පණිවුඩයන් 2020 වසරේ ''බහුවිධ උපද්‍රව පූර්ණ අනතුරු හැඟවීම්'' (MHEW) සහ ආපදා අවදානම අවමකිරීම (DRR) සඳහා කොළඹ ප්‍රකාශනයෙහි අවසන් සැසිවාරය සඳහා යොමු කෙරෙන ප්‍රධානයන් වශයෙන් ලබාදෙන ලදී.

1. ''ස්වභාවධර්මය පදනම් කරගත් විසඳුම්'' (NBS) වඩාත් වැදගත් හා ප්‍රයෝජනවත් වන්නේ., පරිසර පද්ධති මත පදනම් අභියෝග සපුරාලීමට සහ දේශගුණික විචලතාවයන් හා මානව විද්‍යාත්මක මැදිහත්වීම් හේතුවෙන් ස්වාභාවික පරිසර පද්ධතිය තුළ සිදුවන පිරිහීම් නිසාවෙන් ප්‍රජාවන් තුළ ඔරොත්තුදීමේ හැකියාවන් ද අවමවීම් ආශ්‍රිත ව පැනනගින අවදානම ආමන්ත්‍රණය කිරීම යි.

2. සම්ප්‍රදයික විසඳුම් (ව්‍යුහාත්මක ක්‍රියාකාරකම්) ''ස්වභාව ධර්මය මත පදනම් විසඳුම්" (NBS) සමඟ ඒකාබද්ධ වූ විට ජල-කාලගුණික ආපද සිදුවීම්වල දී අවදනම් අවමකිරීම කෙරෙහි වඩාත් වැඩි ප්‍රමාණාත්මක හැකියාවක් පවතී. එය පරිසර පද්ධතීන් ඉතා හොඳින් කළමනාකරණය කරන අතර ම දීර්ඝ කාලීන කාලගුණික වෙනස්කම්වල අයහපත් බලපෑම් අවමකිරීම සඳහා ද උපකාරී වේ.

3. ස්වභාව ධර්මය මත පදනම් භාවිතය සඳහා කෙරෙන ආයෝජන ආපද අවදනම් අවමකිරීම හා දේශගුණික බලපෑම් වෙනස්කිරීම සඳහා ම පමණක් නොව, ජීවනෝපාය මාර්ග වැඩි දියුණුකිරීම, සමාජ-ආර්ථික අවදනම අවමකිරීම, පරිසරය ආරක්ෂා කිරීම, ස්වභාවික සම්පත් රැකගැනීම ආදී අනෙකුත් පහසුකම් සැපයීම සඳහා ද දයක වේ. මේ සම්බන්ධයෙන් ප්‍රජාවන්හට වෙනස්කිරීමේ නියෝජිතයන් වශයෙන් දයක විය හැකි අතර වගකිව යුතු අධිකාරීන් ප්‍රතිපත්ති ම ය මැදිහත්වීම් තුලින් අවදනමට පාත්‍ර ප්‍රජාවන් ප්‍රමාණවත් ලෙස බලගැන්වීම් කළ යුතු ය.

4. දේශීය වශයෙන් දැනුම නිෂ්පාදනය කිරීම හා වැඩිදියුණුකිරීම සඳහා පියවර ගැනීම වැදගත්වන අතර පර්යේෂණ ප්‍රතිඵලයන් පුළුල් ලෙස බෙදහැරීමේ අවස්ථා වැඩිදියුණු කළ යුතු ය. තවදුරටත් නව්‍යකරණය හා ජාත්‍යන්තරකරණයෙන් යුත් ධාරිතා වර්ධන වැඩසටහන් මඟින් පුළුල් භාවිතයන් තහවුරු කිරීම ගුණාත්මක වර්ධනය හා තිරසාර බව තහවුරු කළ හැක.

5. ''ස්වභාවධර්මය පදනම් කරගත් විසඳුම්" (NBS) සංකල්පය සම්බන්ධයෙන් වැදගත් කටයුතු රාශියක් ශ්‍රී ලංකාව තුල සිදුවෙමින් පවතී. නමුත් ඒවා පුළුල් ලෙස ප්‍රවර්ධනය සඳහා සම්බන්ධීකරණ උත්සාහයක් අවශ්‍ය වේ. සියළු පර්යේෂකයන්, විද්වතුන්, වෘත්තිකයින්, ශාස්ත්‍රාලයීයන්හට දැනුම හා අත්දැකීම් බෙදගත හැකි වන පරිදි මෙම තේමාත්මක විෂය කළාපය වටා දැනුම පිළිබඳ වේදිකාවක් සංවර්ධනය කිරීම උචිත ය.

6. ඉහත සඳහන් කරුණු දේශගුණික සහ ආපදවන්ට ඔරොත්තුදීමේ ප්‍රතිපත්ති හා උපායමාර්ග පිණිස ''ස්වභාවධර්මය පදනම් කරගත් විසඳුම්" (NBS) ප්‍රධාන ප්‍රවාහයෙහි මූලික සිද්ධාන්තවන අතර තිරසාර සංවර්ධනය සඳහා ආපද අවදනම අවමකිරීම (DRR) සහ CCA මැදිහත්වීම පිණිස ද උපකාරී වේ.

පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු

2020 වසරේ පුහුණු සහ දැනුවත් කිරීම්

නැවත පදිංචිකිරීමෙන් වසර දෙකකට පසු ජන ජීවිත පිළිබඳ අධ්‍යයනය: ‘‘ශ්‍රී ලංකාව තුළ ස්වාභාවික විපත් හේතුවෙන් අවතැන්වීම් සහ නැවත පදිංචිකිරීම් පිළිබඳ තත්ත්වය’’

නැවත පදිංචිකිරීමෙන් වසර දෙකකට පසු ජීවිත පිළිබඳ අධ්‍යයනය ‘‘ශ්‍රී ලංකාව තුළ ස්වාභාවික විපත් හේතුවෙන් අවතැන්වීම් සහ නැවත පදිංචිකිරීම් පිළිබඳ තත්ත්වය’’ පුහුණු සහ දැනුවත්කිරීම් සංරචකය යටතේ භාරගන්නා ලදී. මෙම පර්යේෂණ අධ්‍යයනයේ අරමුණ ආපද හේතුවෙන් 2016 වසරේ අරණායක නායයෑම් පශ්චාත් බලපෑමට ලක්වූ ජනතාව නැවත පදිංචිකිරීමේ බලපෑම් අවබෝධ කර ගැනීම යි. මෙම පර්යේෂණ අධ්‍යයනය නායයෑම් නිසා ජනතාව නැවත පදිංචිකිරීමේ දී ඇතිවන බලපෑම් අවබෝධකර ගැනීමටත් ඒ තුළින් නැවත පදිංචිකිරීමේ ක්‍රියාවලියෙහි වෙනස්කම් සිදුකිරීම සඳහා නිර්දේශ ලබාදීම පිණිස වැදගත් වේදිකාවක් සැළසේ. අධ්‍යයනයේ සොයාගැනීම් රාජ්‍ය සහ රාජ්‍ය නොවන පාර්ශවකාර සංවිධානයන්, වෘත්තිකයන් හා ශ්‍රී ලංකාව තුළ පශ්චාත් ආපද නැවත ගොඩනැගීම් කටයුතු සඳහා දයකත්වය සපයන විශ්වවිද්‍යාල නියෝජිතයන් වෙත බෙදදෙන ලදී. අධ්‍යයනයේ සොයාගැනීම් කෑගල්ල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ ද සාකච්ඡා කරන ලදී. මෙම අධ්‍යයනය කොළඹ විශ්වවිද්‍යාලීය සමාජ ප්‍රතිපත්ති විශ්ලේෂණය හා පර්යේෂණ මධ්‍යස්ථානය එක්සත් රාජධානියේ ‘‘හඩර්ස්ෆීල්ඩ්’’ විශ්වවිද්‍යාලය සහ ජාතික ගොඩනැගිලි පර්යෙෂණ සංවිධානය (NBRO) අතර සහයෝගීතාවයෙන් සිදුවිය.

‘‘තිරසාර යටිතල පහසුකම්’’ පිළිබඳ මාර්ගගත කෙටි පාඨමාලාව

ජා. ගො. ප. සංවිධානය ඕස්ට්‍රේලියාවේ නිව් සවුත්වේල්ස් විශ්වවිද්‍යාලය (UNSW) සමඟ සහයෝගීතාවයෙන් ‘‘තිරසාර යටිතල පහසුකම්‘‘ පිළිබඳ කෙටිකාලීන මාර්ගගත පාඨමාලාව සංවිධානය කරන ලදී. මෙම මාර්ගගත කෙටි කාලීන පාඨමාලාව ඕස්ට්‍රේලියාවේ නිව් සවුත්වේල්ස් විශ්වවිද්‍යාලයේ තිරසාර ගොඩනගන ලද පරිසරය පිළිබඳ ආචාර්යකරු ආචාර්ය සරත් මාතරආරච්චි විසින් මෙහෙයවන ලදී. පාඨමාලාව 2020 ජූලි 30 සිට 2020 ඔක්තෝම්බර් 16 දක්වා පැවැත්විය. ජා. ගො. ප. සංවිධානයේ නිලධාරීන් සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ආපද කළමනාකරණ අංශය යටතේවන ආයතන නියෝජිතයින් මෙම කෙටි කාලීන පාඨමාලාව සඳහා සහභාගී විය. මෙම වැඩසටහනෙහි අරමුණ ශ්‍රී ලංකාව තුළ තිරසාර යටිතල පහසුකම් සහ මහජන සේවාවන් සැලසුම්කරණය හා කළමනාකරණය පිළිබඳ ජා. ගො. ප. සංවිධානයෙහි නිලධාරීන් තුළ ධාරිතා වර්ධනය ඇති කිරීම යි.

නිවසේ සිට රාජකාරී කාල සීමාව තුල තත්‍ය ධාරිතා සංවර්ධන වැඩසටහන්

කොවිඩ් 19 අර්බුධකාරී කාල සීමාවෙහි දී නිවසේසිට රාජකාරී කාල සීමාවන්වල ජා. ගො. ප. සංවිධානයේ කාර්යමණ්ඩලය වෙත විවිධ විෂය ක්ෂේත්‍රයන් හි දැනුම අත්පත් කරගත හැකිවන පරිදි අන්තර් ක්‍රියාකාරී සැසිවාරයන් මාලාවක් සංවිධානය කරන ලදී. පවත්වන ලද සැසිවාරයන් පහත සඳහන් වේ.

- ‘‘නවෝත්පාදන සහ නව නිපැයුම්’’ - ජා. ගො. ප. සංවිධානයේ ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ, ආචාර්ය පත්මකුමාර ජයසිංහයන් විසින් ඉදිරිපත් කරන ලදී.
- ‘‘කොවිඩ් 19 අර්බුධය හමුවේ අභිප්‍රේරණාත්මක මණ්ඩපය’’ - සැසිය සඳහා සත්කාරකත්වය ජ්‍යෙෂ්ඨ උපදේශක, දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානයෙහි හිටපු ප්‍රධාන විධායක නිලධාරී, ඉංජිනේරු නිශාන්ත කමලදාස
- ‘‘විද්‍යුත්මක පත්‍රිකා ලිවීම’’ - එක්සත් රාජධානියේ හඩසර්ෆීල්ඩ් විශ්වවිද්‍යාලයේ ආපද අවදානම අවමකිරීම හා කළමනාකරණය පිළිබඳ මහාචාර්ය, දිලන්ති අමරතුංග මහත්මිය විසින් ඉදිරිපත් කරන ලදී.
- ‘‘ශ්‍රී ලංකාවේ නායයෑම් අවදානම කළමනාකරණය’’ - අවමකරණ ක්‍රියාමාර්ග තුලින් නායයෑම් අවදානම අවමකිරීම පිළිබඳ ව්‍යාපෘතියහි ව්‍යාපෘති අධ්‍යක්ෂ, ආර්. එම්. එස්. බණ්ඩාර මහතා විසින් මෙහෙයවන ලදී.

සමාජ ජාල මාධ්‍ය ඔස්සේ නායයෑම් පූර්ව අනතුරු හැඟවීම පිළිබඳ මහජනතාව දැනුවත්කිරීමේ ව්‍යාපාරය

නායයෑම් පූර්ව අනතුරු හැඟවීම් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාර කිහිපයක් සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ ඉදිරිපත්කරන ලදී. 2020 දෙසැ. මස ‘‘බුරවි’’ සුළි කුණාටුව හේතුවෙන් හටගත් අධික වර්ෂාපතනය පිළිබඳ ව සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ දැනුවත් කිරීම් සිදුකරන ලදී.



COLOR: RED

WW/1/20/04/17/07

Warning for Severe lightning

Issued by the natural hazards early warning center

At 02.00 p.m. 17 April 2020 for the period until 10.30 p.m. 17 April 2020

For Land Areas

PLEASE BE AWARE:

Thundershowers accompanied by severe lightning are likely to occur at several places in Western, Sabaragamuwa, Central, North-western and Southern provinces and Mannar district in the evening or night.

There may be temporary localized strong winds during thundershowers. General public is kindly requested to take adequate precautions to minimize damages caused by lightning activity.

ACTION REQUIRED:

The Department of Meteorology advises that people should:

- Seek shelter, preferably indoors and never under trees.
- Avoid open areas such as paddy fields, tea plantations and open water bodies during thunderstorms.
- Avoid using wired telephones and connected electric appliances during thunderstorms.

ප්‍රධාන උපදේශන ව්‍යාපෘති

ඉදිකිරීම් ව්‍යාපෘතිවල භූ තාක්ෂණික ගැටළු නිරවුල් කිරීම

ඉතා උස් වූ ගොඩනැගිලි සහ විශාල පරිමාණයේ ගොඩනැගිලි ඇතුලත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී පුළුල් කැනීම් හා අත්තිවාරම් කටයුතු සිදුකිරීමේ දී අසල්වාසී ගොඩනැගිලිවලට ඍණාත්මක බලපෑම් සිදුවීමට ඉඩ ඇති බැවින් ඒවා සඳහා අනුමැතිය ලබාදීමට ප්‍රථම අදාල විමර්ශනයන් සිදුකරන ලෙස හා වාර්තා ලබා දෙන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය සහ සංචාරක මණ්ඩලය වැනි අධිකාරීන් වෙතින් ජා. ගො. ප. සංවිධානය වෙත ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබයි.

වසර	2017	2018	2019	2020
වාර්තා සහ අලුත්කිරීම්	32	38	20	09

ගොඩනැගිලි පිළිබඳ තත්ත්ව වාර්තා නිකුත්කිරීම

ජා. ගො. ප. සංවිධානය විසින් ගොඩනැගිලිවල තත්ත්වය හා ඒවායේ ව්‍යුහාත්මක අඛන්ඩතාවය තක්සේරු කිරීම සඳහා විමර්ශනයන් සිදුකරනු ලබන අතර අදාල වාර්තා නිකුත්කිරීම ගාස්තු මත පදනම් සේවාවක් වශයෙන් ඉටු කරනු ලබයි. මෙය හුදෙක් පාරිභෝගික ඉල්ලීම් මත හෝ උසාවි නියෝගයක් මත සිදුකරනු ලබයි. බොහෝ විට මෙබඳු සේවාවන් යාබද දේපල තුල සිදු කරනු ලබන ඉදිකිරීම් හේතුවෙන් ගොඩනැගිලිවලට සිදුවන හානිය තක්සේරු කිරීම සඳහා අවශ්‍ය වේ. මෙම ක්‍රියාවලිය සැලකිය යුතු දීර්ග කාලයක් පුරා ජා. ගො. ප. සංවිධානය විසින් සිදුකරනු ලබන අතර පහත වගුව තුලින් තොරතුරු ලබා දී ඇත.

වසර	2015	2016	2017	2018	2019	2020
වාර්තා සංඛ්‍යාව	42	60	148	116	124	116

ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගරයන් හි අවට පරිසරය තුල වායු තත්ත්ව අධ්‍යයනය

ජා. ගො. ප. සංවිධානය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගරයන් හි අවට පරිසරයේ වායු තත්ත්ව අධ්‍යයනය “උදසීන වායු තත්ත්ව නිරීක්ෂණ තාක්ෂණය” භාවිතයෙන් අඛන්ඩ ව සිදුකරනු ලබයි. කොළඹ, ගම්පහ, හොරණ, රත්නපුර, ගාල්ල සහ කළුතර යන නගරයන් හි සල්ෆඩයොක්සයිඩ් (SO_2) සහ නයිට්‍රජන් ඩයොක්සයිඩ් (NO_2) නිරීක්ෂණ කටයුතු VETT වැඩසටහන යටතේ 2012 වසරේ දී ආරම්භ කරන ලදී. එම නිරීක්ෂණයන් පසුව මහනුවර, කුරුණෑගල, අනුරාධපුරය සහ පුත්තලම දක්වා ව්‍යාප්ත කරන ලද අතර PM 2.5 නියැදිකරණ වැඩසටහන ද හඳුන්වා දෙන ලදී, රැස්කරන ලද දත්තයන් ජා. ගො. ප. සංවිධානයේ වායු තත්ත්ව පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා භාවිතා කරන ලදී.

දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය දිගුව සඳහා විමර්ශන නිර්මාණ සහ උපදේශන සේවා සැපයීම

දක්ෂිණ අධිවේගී මාර්ගයෙහි බෙලිඅත්ත ආසන්නයේ වම්පස දැවැන්ත කැපුම් බෑවුමක් (කි. මී. 1 ක දිගින් හා මීටර් 52 ක උසින් යුත් ද්විත්ව කැපුම් බෑවුම) අසාර්ථක වීමෙන් පසුව, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් ව්‍යාපෘතියෙහි බෙලිඅත්ත ආසන්නව Ch/ 19+000 සිට 20+000 අතර බෑවුම් ස්ථායීකරණ විධි විධාන යෙදීම සඳහා මාර්ගෝපදේශ සැපයීමට ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව ජා. ගො. ප. සංවිධානය විසින් පහත සඳහන් සේවා සපයන ලදී. කාර්යය සඳහා සමස්ථ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 44.81 කි.

I. භූ තාක්‍ෂණ විමර්ශන
ii. භූ විද්‍යුත්මක ගවේශන
iii. බෑවුම් නිවැරදිකරණය සඳහා ඉංජිනේරු ම ය නිර්මාණ
iv. උපදේශන සැපයීම සහ බෑවුම් අවමකිරීමේ ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් අධීක්‍ෂණ කටයුතු

දක්ෂිණ අධිවේගී මාර්ගයේ බෙලිඅත්තේ බෑවුම් නිවැරදි කිරීමේ කාර්යය

ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත්වල ගැටුම්වල බලපෑමට ලක්වූ පවුල් සඳහා පිරිවැය නව තාක්‍ෂණික කොන්ක්‍රීට් පැනල ස්ථිර නිවාස ඉදිකිරීම

ගැටුම්වල අඩු බලපෑමට ලක්ව ඇති පවුල් සඳහා අඩු පිරිවැය කොන්ක්‍රීට් පැනල නිවාස 28,000 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි නැගෙනහිර පළාත තුල නිවාස 1000 කින් ඇරඹීමේ කටයුතුවල දී ජා. ගො. ප. සංවිධානය තාක්‍ෂණික උපදේශක වශයෙන් පත්කර ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනය ග්‍රාමීය නිවාස, ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත දිරිගැන්වීම් රාජ්‍ය අමාත්‍යාංශය වන අතර කොන්ත්‍රාත්කරු Yapka ඩිවලපර් (පුද්) සමාගම වේ. ජා. ගො. ප. සංවිධානය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය සමඟ ප්‍රධාන තාක්‍ෂණික සේවා පහක් එනම්, තාක්‍ෂණික ඇගැයීම් පැවැත්වීම සහ තාක්‍ෂණික පිරිවිතරයන් සංවර්ධනය කිරීම, පාර්ශවකරුවන් දැනුවත් කිරීම හා පුහුණු වැඩසටහන් පැවැත්වීම, භූමිය පිළිබඳ ව තත්ත්ව ඇගැයීම් සිදුකිරීම, ගොඩනැගිලි ද්‍රව්‍ය පිළිබඳ ගුණාත්මක තත්ත්වය සහතික කිරීමේ සම්බන්ධීකරණය සහ ඉදිකිරීම් අධීක්‍ෂණය සහ ගෙවීම් සහතික කිරීම යන කටයුතු සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත.

යෝජිත නිවාස වර්ග අඩි 650 ක සම්පූර්ණ භූමි ප්‍රමාණයකින් යුක්තවන අතර නිදන කාමර 2 ක්, විසිත්ත කාමරයක්, මුළුතැන් ගෙයක් සහ වැසිකිළියක් සහිත නාන කාමරයකින් සමන්විත වේ. යෝජිත ඉදිකිරීම් තාක්ෂණයෙහි විශේෂත්වය වන්නේ බිත්ති සඳහා ALC පැනල භාවිතයත් හා අවම ශ්‍රම දායකත්වයක් තුලින් දින 21 ක දී සම්පූර්ණ කළ හැකිවීම සහ නිවසක් සඳහා රු. මිලියන 1.28 ක් වැයවීම යි.

ත්‍රිකුණාමලයේ කුච්චවේලි හි කොන්ක්‍රීට් පැනල නිවාස ඉදිකිරීම්

බදුල්ල ප්‍රදේශයේ ඉදිකරන ලද ආදර්ශ නිවාස

අනෙකුත් ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්

ජා. ගො. ප. සංවිධානය විසින් නායයෑම් අධ්‍යයන හා සේවා, භූ තාක්ෂණ ඉංජිනේරු, ව්‍යාපෘති කළමනාකරණ සේවා, ගොඩනැගිලි ද්‍රව්‍ය, මානව ජනාවාස සහ නැවත පදිංචිකිරීම් සැලසුම්කිරීම් සහ පාරිසරික කළමනාකරණය යන ක්ෂේත්‍රයන් හි තාක්ෂණික පරීක්ෂණයන් සහ උපදේශන සේවාවන් සැපයීම අඛණ්ඩ ව සිදුකරනු ලබන අතර ඒ තුලින් ආයතනික මූල්‍ය ම ය ශක්‍යතාවය බලගැන්වීම සිදුකරයි. ජා. ගො. ප. සංවිධානය විසින් සපයනු ලබන පරීක්ෂණ සහ උපදේශන සේවාවන් පහතින් සාරාංශගත කර ඇත.

ක්‍රියාකාරකම්/අංශය	උපදේශන කාර්යයන් ප්‍රමාණය	පරීක්ෂණ/ විමර්ශන සංඛ්‍යාව	සමස්ථ ආදායම් උත්පාදනය (රු. මි.)
නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය	854	-	63.39
භූ තාක්ෂණ ඉංජිනේරු සහ පරීක්ෂණ අංශය	160	134	157.52
පාරිසරික අධ්‍යයන හා සේවා අංශය	216	265	52.78
ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ සහ පරීක්ෂණ අංශය	-	2276	35.51
ව්‍යාපෘති කළමනාකරණ අංශය	116	75	48.91
මානව ජනාවස සැලසුම් හා පුහුණු අංශය	9	-	28.69
වෙනත් ආදායම්	-	-	53.65
එකතුව			440.45

විදේශීය/දයකත්ව සහයෝගීතා සහිත ව්‍යාපෘතීන්

ජා. ගො. ප. සංවිධානය - ජයිකා තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘති (විදේශීය ආධාර සහ තාක්ෂණික සහයෝගිතා)

➢ නායයෑම් **අවමකිරීමේ** ව්‍යාපෘති සඳහා තාක්ෂණික සහයෝගිතාවය (TCLMP **අදියර** I සහ II) අවදානම් සහිත අඩවි 4 ක අවමකරණ කටයුතු (බදුළුසිරිගම නායයෑම් අඩවිය, උඩමාදුර, මහනුවර සහ අලගුමලේ පාෂාණ පතිතවීම් සහිත අඩවිය)

නායයෑම් අවමකිරීම සඳහා ජයිකා තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතිය (TCLMP) අදියර 1 යටතේ නිමාවට පත්කර ඇත. ව්‍යාපෘති කටයුතු ජා. ගො. ප. සංවිධානය, ''සීමාසහිත කොයිවා කෝපරේෂන් ඇන්ඩ් අර්ත් සිස්ටම් සයන්ස්'' ආයතනය සමඟ සිදුකළ අතර ''නිපෝන් කෝයි'' උපදේශක වශයෙන් ක්‍රියා කරන ලදී.

TCLMP ව්‍යාපෘතියෙහි II අදියර ''SABO'' ව්‍යාපෘතිය ලෙස හැඳින්වෙන තුන් අවුරුදු ව්‍යාපෘතියක් වශයෙන් ආරම්භ කර ඇති ශ්‍රී ලංකාවේ නායයෑම් අවදානම අවමකිරීම සඳහා ව්‍යුහාත්මක නොවන පියවරයන් සංවර්ධනය කිරීම සඳහා ධාරිතාවයන් සංවර්ධනය කිරීම, ව්‍යුහාත්ම නොවන පියවරයන් සංවර්ධනය කිරීම ඉලක්ක කරගනිමින් ස්ථාන විශේෂිත උපද්‍රව සිතියම්ගත කිරීම, ආපද තක්සේරු කිරීම, ප්‍රාදේශීය නායයෑම් පිළිබඳ පූර්ව අනතුරු හැඟවීම් නිකුත්කිරීම, පවතින නිරීක්ෂණ පද්ධති හා අනතුරු හැඟවීම් වැඩි දියුණු කිරීම සහ සංවර්ධන ප්‍රමිතීන්ට අදාල ඉඩම් කළමනාකරණය සඳහා නායයෑම් ආපද පිළිබඳ අවදානම් තක්සේරුකිරීම ක්‍රියාවට නැංවීම කෙරෙහි විශේෂ අවධානය යොමුකරයි. ආරම්භයේ දී කෑගල්ල, බදුල්ල සහ මාතර යන ස්ථානයන් හි තුනක නියමු අඩවි තෝරාගෙන ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන ලදී. ව්‍යාපෘතියේ ඉලක්ක ගත නිමවුම් ශාක්ෂාත්කරගැනීම සඳහා පහත ක්‍රියාකාරී කණ්ඩායම් තුනක් පත්කරන ලදී.

පළමු ක්‍රියාකාරී කණ්ඩායම 1 (WG1) - උපද්‍රව විශ්ලේෂණය සහ අවදානම් තක්සේරුව
දෙවන ක්‍රියාකාරී කණ්ඩායම 2 (WG2) - අවසාදිත ආපද පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය
තෙවන ක්‍රියාකාරී කණ්ඩායම 3 (WG3) - ඉඩම් පරිහරණ සැලසුම් සහ සංවර්ධන ප්‍රමිතීන්

පළමු ක්‍රියාකාරී කණ්ඩායම යටතේ පහත සඳහන් කටයුතු ක්‍රියාවට නැංවිත. නායයෑම් උපද්‍රව කළාප සිතියම් සහ අවදානම් තක්සේරුකිරීම පිළිබඳ ව පවතින ක්‍රමවේදය සමාලෝචනය කිරීම, නායයෑම් ආපද වාර්තා කළමනාකරණය සඳහා පද්ධතියක් වැඩිදියුණු කිරීම, පසුගිය නායයෑම් ආපද පිළිබඳ වාර්තා එක්රැස්කිරීම හා විශ්ලේෂණය කිරීම, අඩවි විශේෂිත සිතියම්ගත කිරීම සහ අවදානම් තක්සේරුකරණය පිළිබඳ කෙටුම්පත් අත්පොතක් සැකසීම, නියාමක අඩවි තුන සඳහා ''හයිපර් කොනාකෝ (Hyper KANAKO)'' ආකෘතිය භාවිතයෙන් නායයෑම් සුන්බුන් මාර්ග සමාකරණය පැවත්වීම මඟින් රතු කළාප සහ කහ කළාප සංකල්පය අනුව අඩවි විශේෂිත උපද්‍රව සිතියම් සැකසීම මෙන් ම නියාමක අඩවිවලට අමතර ප්‍රදේශවල ද අඩවි විශේෂිත උපද්‍රව සිතියම්කරණය සිදුකිරීම ද වේ. ඊට අමතර ව ජා. ගො. ප. සංවිධානයේ කාර්යමණ්ඩලය සඳහා වැඩමුළු, පුහුණු හා කුඩා සම්මන්ත්‍රණ පැවැත්වීම ද සිදුකෙරිණි.



අඩවි විශ්ලේෂිත උපද්‍රව ප්‍රථිඵල - මොරවක්කන්ද නියමු අඩවිය



අඩවි විශේෂිත උපද්‍රව ප්‍රතිඵල - වීරියපුර නියමු අඩවිය

දෙවන ක්‍රියාකාරී කණ්ඩායම (WG2): ජා. ගො. ප. සංවිධානය විසින් නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම් ක්‍රියාවලියෙහි වැඩිදියුණු කිරීම් කිහිපයක් සිදුකර නායයෑම් පූර්ව අනතුරු හැඟවීම් නිකුත්කිරීමේ කාර්යක්ෂමතාවය හා වර්ෂාපතන නිරීක්ෂණ කටයුතු වර්ධනය සඳහා ක්‍රියාකර ඇත. පසුගිය නායයෑම් විමර්ශන වාර්තා ආශ්‍රයෙන් හා පවතින අනෙකුත් මූලාශ්‍රයන් භාවිතයෙන් නායයෑම් විස්තර තොරතුරු පද්ධතියක් සකසා ඇති අතර නායයෑම් ප්‍රවනතාවයන් සහිත සියළු දිස්ත්‍රික්ක 12 සඳහා ම ''වර්ෂාපතන එළිපත්ත'' අගයයන් ගණනය කරීමේ කටයුතු සිදුකර ඇත. මෙම අධ්‍යයනය තුළ දී පැය 24, 48, 72 එක් පැයක ''වර්ෂාපතන සීමා'' අගයයන් සහ පාංශු ජල දර්ශක අගයයන් ව්‍යුත්පන්න කිරීම ඉහත සියළුම කළාපයන් සඳහා සිදුකර ඇත. නායයෑම් පූර්ව අනතුරු හැඟවීම් නිකුත්කිරීම් සඳහාවන තීරණාත්මක රේඛාව කෙටි කාලීන වර්ෂාව සහ දීර්ඝ කාලීන වර්ෂා අගයයන් සංයුක්ත කිරීම භාවිතයෙන් සිදුකරනු ලබයි.





ශ්‍රී ලංකාවෙහි වර්ෂාපතන සීමා අගය වඩාත් නිරවද්‍යතාවය වෙත ළඟාකර ගැනීම සඳහා හඳුනාගත් වර්ෂාපතන එළිපත්ත අගයයන් අනාගත නායයෑම් හා අදාලවන වර්ෂාපතන අගයයන් අනුව යාවත්කාලීන විය යුතු ය.

තෙවන ක්‍රියාකාරීත්වය යටතේ ව්‍යාපෘතිය මඟින් සහ/රතු කළාප මඟින් නම් කරන ලද ප්‍රදේශයේ සුදුසු ඉඩම් පරිහරණය සහ අවශ්‍ය රාජ්‍ය සහ ප්‍රාදේශීය ප්‍රයත්නයන් පිළිබඳ ව සාකච්ඡා කර ඇත. උදා: වශයෙන් කහ කළාපයේ පූර්ව අනතුරු හැඟවීම් සහ ප්‍රදේශයෙන් ඉවත්කිරීමේ පද්ධති ශක්තිමත් කිරීම මධ්‍යම හා ප්‍රාදේශීය රාජ්‍ය අංශයන් විසින් සිදුකළ යුතු ය. රතු කළාපයන් තුළට නව අවදානම් තත්ත්වයන් ඇති නොවන ලෙස අළුතින් ගොඩනැගිලි ඉදිකිරීම් සහ/හෝ මහජන පහසුකම් පාලනය කළ යුතු ය.

මෙම සාකච්ඡාවන් ප්‍රාදේශීය අධිකාරීන්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මෙන් ම නාගරික සංවර්ධන අධිකාරිය වැනි මධ්‍යම සංවර්ධන ආයතන දයකත්වයෙන් සිදුවිය යුතු ය. එමෙන් ම කහ/රතු කළාප ආශ්‍රිත ව කුමන ආකාරයේ ව්‍යුහාත්මක ක්‍රියා මාර්ග කළාපය තුළ සංවර්ධනය සඳහා අදාල වේද යන මඟපෙන්වීම සිදුකළ යුතු ය. ඉඩම් භාවිතා රෙගුලාසි සහ සංවර්ධන පිරිවිතරයන් ''ආපදාවන්ට ඔරොත්තු දෙන ඉඩම පරිහරණ රෙගුලාසි/සංවර්ධන පිරිවිතරයන් හි රටතුළ නායයෑම්වලට ලක්විය හැකි ප්‍රජාවන් සඳහා භාවිතය පිණිස සාරාංශ ගත කෙරෙනු ඇත.

ශ්‍රී ලංකාව තුළ වර්ෂාව නිසා ප්‍රේරිත වේගවත් හා දිගු දුර ගමන්කරන නායයෑම් පිළිබඳ අනතුරු හැඟවීම් තාක්ෂණය සංවර්ධනය කිරීම - SATREPS (JICA)

ලෝකයේ ප්‍රමුඛතම නායයෑම් අධ්‍යයනයන් පිළිබඳ අධිකාරියක් වන ජපානයේ කියෝතෝ විශ්වවිද්‍යාලය පදනම් කරගත් ජාත්‍යන්තර නායයෑම් සම්මේලනය (ICL) සමඟ ජා. ගො. ප. සංවිධානය ඒකාබද්ධ ව තිරසාර සංවර්ධනය සඳහා විද්‍යා හා තාක්ෂණ පර්යේෂණ සහයෝගීතාව (SATREPS) යටතේ ජපාන රජයේ අන්තර් ජාතික කටයුතු දෙපාර්තමේන්තුවෙහි ජපාන විද්‍යා සහ තාක්ෂණික ආයතනය (JST) සහ ශ්‍රී ලංකා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව හා සමගාමී ව ‘‘වැසි ප්‍රේරිත වේගවත් දිගු දුර ගමන්කරන නායයෑම් පිළිබඳ ආපදා අවදානම අවමකිරීම’’ නමින් යුත් ව්‍යාපෘතිය අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. මෙම පස් අවුරුදු ජපන් - ශ්‍රී ලංකා ඒකාබද්ධ ව්‍යාපෘතිය 2019 – 2023 කාලය තුල ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත විය. මෙම යෝජනා මඟින් වැසි ප්‍රේරිත වේගවත් සහ දිගු දුර ගමන් ගන්නා නායයෑම් ආපදා අවදානම අවමකිරීම සඳහා 2015 – 2025 ගෝලීය සෙන්ඩායි සහයෝගිතාවයේ පාර්ශවකරුවන් හරහා උසස් තාක්ෂණය හඳුන්වාදීමට යෝජනා කරයි. මෙම ව්‍යාපෘති කටයුතු සඳහා දේශීය සහ ජපන් සහයෝගිතා හා උපකාරක ආයතන කිහිපයක් සහායවන අතර මූලික කටයුතු දැනටමත් ආරම්භකර ඇත. අපේක්ෂිත ප්‍රතිඵලයන් වන්නේ:

1. අධික වර්ෂාපතනය සහ එහි ප්‍රතිඵලයක් ලෙස භූගත ජලපීඩනය වැඩිවීම පිළිබඳ පැය 24 කට පෙරාතු ව පුරෝකථනය කිරීමේ තාක්ෂණය සංවර්ධනය කිරීම, වර්ෂාව නිසා ප්‍රේරිත නායයෑම් ස්ථාන සහ ඒවායේ චලනය වන කළාප හඳුනාගැනීම සංවර්ධනය කිරීම.
2. කඳුකර සහ ප්‍රාදේශීය නගර ආශ්‍රිත ව ජීවත්වන ප්‍රජාවන් හි ජනතාව වෙත එළදයී අවදානම් සන්නිවේදන තාක්ෂණික රාමුවක් හා තාක්ෂණය සංවර්ධනය කිරීම.
3. නියමු අධ්‍යයන අඩවි තුළ ඒකාබද්ධ පර්යේෂණ පදනම් කරගනිමින්, වැසි මඟින් ප්‍රේරණයවන දිගු දුර නායයෑම් පිළිබඳ අනතුරු ඇඟවීමේ පද්ධතියක් සංවර්ධනය කර ඇති අතර ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රදේශවල භාවිතය සඳහා මාර්ගෝපදේශ සහ අත්පොත සහිත සංවර්ධිත පද්ධතිය ඉදිරිපත් කර ඇත.
4. දියුණු කරන ලද ඉහත තාක්ෂණයන් නායයෑම් සහ ඒ ආශ්‍රිත උවදුරුවලින් අවදානමට ලක් ව ඇති ප්‍රජාවන් හා ජනතාවගේ ආරක්ෂාව හා සුරක්ෂිතභාවය සහතික කරනු ඇත.

මෙම ව්‍යාපෘතියෙහි ආරම්භක වැඩමුළුව 2020 කොළඹ දී පවත්වන ලද අතර ව්‍යාපෘති කාර්යාලය ජපානයේ ටෝකියෝ හි පිහිටා ඇත. මේවන විට ජා. ගො. ප. සංවිධානයේ විද්‍යාඥයින් කිහිපදෙනෙකු ධාරිතා සංවර්ධන වශයෙන් පුහුණු කරනු ලැබ ඇත. පාර්ශවකරුවන් සඳහා තවත් පුහුණු වැඩසටහන් සැලසුම්කර ඇති අතර පුහුණු වැඩසටහන් සඳහා ඇතැම් විද්‍යාඥයින් මේ වන විටත් නම්කර ඇත. දත්ත රැස්කිරීමේ අභ්‍යාසයන් ආරම්භ කිරීමට නියමිත අතර භූ තාක්ෂණික ඉංජිනේරු අංශයේ පර්යේෂණාගාරය නායයෑම් සමාකරණ උපකරණ වැනි සංකීර්ණ උපකරණයන්ගෙන් ශක්තිමත් කිරීමට සැලසුම් කර ඇත.

ටෝකියෝ හි SATREPS කාර්යාලය

ජා. ගො. ප. සංවිධානයේ ව්‍යාපෘති සමාරම්භය

ශ්‍රී ලංකාවේ නායයෑම් අවදානම කළමනාකරණය සඳහා පිළිවෙතක් ලෙස ස්වභාව ධර්මය පදනම් විසඳුම් (NbS)

ස්වභාව ධර්මය පදනම් විසඳුම් යනු මානව යහපැවැත්ම හා ජෛව විවිධත්ව ප්‍රතිලාභ එකවිට සලසමින් සමාජ අභියෝග ඵලදායී ලෙස හා අනුවර්තනය ලෙස ආමන්ත්‍රණය කරන ස්වභාවිකව ස්ථාපිත හෝ නිර්මිත පරිසර පද්ධති තිරසාර ලෙස කළමනාකරණය හා ආරක්‍ෂා කිරීම සඳහා වන ක්‍රියාමාර්ග ලෙස හැඳින්වේ. මෙබඳු විසඳුම්වල වැදගත්කම 2015 – 2030 ආපද අවදානම අවමකිරීම සඳහාවන ''සෙන්ඩායි" සැලසුම් රාමුව තුල දේශගුණික වෙනස්වීම්වලට ඔරොත්තුදීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා ඵලදායී ආපද අවදානම අවමකරණ ක්‍රමවේද ලෙස අවධාරණය කර ඇත. ආසියානු රටවල් බොහොමයක නායයෑම් අවදානම අවමකිරීමේ කාර්යයේ දී වගාවන් ඇති කිරීම, ඛාදනයන් අවම කරමින් සහ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් හට ආශ්‍රිත අවදානම් තත්ත්ව සමඟ කටයුතු කිරීමට උපකාරී වෙමින් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන බව සිදුකරන ලද අධ්‍යයනයන් ගණනාවක දී තහවුරු වී ඇත. ශ්‍රී ලංකාව තුල නායයෑම් අවදානම කළමනාකරණයේ දී ස්වභාව ධර්මය පදනම් ප්‍රවේශයන් භාවිතය තවමත් සීමිත බව අනාවරණ වී ඇත. ඒ අනුව ලෝක බැංකුව විසින් ජා. ගො. ප. සංවිධානය සමඟ සහයෝගීතාවයෙන් ශ්‍රී ලංකාව තුල ස්වභාව ධර්මය මත පදනම් නායයෑම් අවදානම් කළමනාකරණ විශ්ලේෂණාත්මක හා උපදේශනාත්මක සේවා ව්‍යාපෘතියක් දියත්කර ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය සහයෝගය සහ තාක්‍ෂණික මගපෙන්වීම් සඳහා ආසියානු ආපද පෙර සූදානම්කරන මධ්‍යස්ථානය (ADPC) පත්කර ඇත. මෙම ව්‍යාපෘතිය තුලින් දැනුවත්භාවය ඉහල නැංවීම සහ ස්වභාව ධර්මය මත පදනම් සහ දෙමුහුන් (ස්වභාව ධර්මය දැනුම් හා සාම්ප්‍රදායික ඉංජිනේරු ම ය ක්‍රියාමාර්ග සම්මිශ්‍රනය) විසඳුම්වල කාර්යභාරය පිළිබඳ දැනුම ගැඹුරු කිරීම මෙන් ම රටතුල නායයෑම් අවදානම කළමනාකරණය සහ ''ස්වභාව ධර්මය මත පදනම් විසඳුම් (NbS) හි සමාජයීය ප්‍රතිලාභ කෙරෙහි දයකත්ව සාධක තීරණය කිරීමේ විද්‍යාත්මක ප්‍රජාවන් විසින් සිදුකරනු ලබන විස්තරාත්මක විශ්ලේෂණයන් ද සිදුකෙරෙනු ඇත.

වත්මන් ව්‍යාපෘතිය යටතේ ජා. ගො. ප. සංවිධානය විසින් සිදු කරන ලද පර්යේෂණවල අරමුණ වූයේ අවදානම් - දැනුවත්වීම් පිළිබඳ ව නායයෑම් ආපද අවමකරණය සඳහා ''ස්වභාව ධර්මය මත පදනම් විසඳුම්" භාවිතය, අනාරක්ෂිත අවදානම් සහගත බෑවුම් ස්ථායීකරණය සහ අනාගත පාංශු ඛාදනය ඇතුලත්වීම පිළිබඳ විභවයන් ගවේෂණය කිරීම යි. ව්‍යාපෘතිය මඟින් අනාවරණය වූ කරුණක් වූයේ සියළුම ආකාරයේ නායයෑම් එබඳු ''ස්වභාවධර්මය මත පදනම් විසඳුම්" තුලින් අවමකරණ කටයුතු සිදුකළ නොහැකි වුව ද විභවීය වශයෙන් භාවිතා කල හැකි අත්‍යවශ්‍ය ස්ථානයෙන් පවතින බව යි. නායයෑම් අවදානම සඳහා ගොදුරු විය හැකි විශාල කලාපයන් හි අවදානම අවමකිරීම් සඳහා ''ස්වභාව ධර්මය මත පදනම් විසඳුම්" (NbS) ඵලදායී ලෙස භාවිතා කළහැකි අතර සාම්ප්‍රදායික අවමකරණ විකල්පයන් හි භාවිතාවන්ට වඩා පිරිවැය ඵලදායී වේ. එවැනි කලාපයන් අතර සිදුවීමේ විභවයන් සහිත නොගැඹුරු මන්දගාමී ව චලනයවන නායයෑම්, නායයෑම් ආරම්භවීමේ මූලික ලක්‍ෂණ පෙන්නුම් කිරීම නිසාවෙන් අත්හැර දමන ලද කළාපයන්, නැවත සක්‍රියවීමේ සලකුණු සහිත පෙර නායයෑම්වලට ලක්වූ ස්ථාන සහ ජා. ගො. ප. සංවිධානය විසින් සිදුකරන ලද අවදානම් කලාප සිතියම් ගත කිරීම් අනුව ඉහල නායයෑම් අවදානම් විභවයන් සහිත ස්ථානයන් වේ. එවැනි කලාපයන් නායයෑම් අවදානම් ආශ්‍රිත නැවත ස්ථානගත කිරීම් හේතුවෙන් හිස්බවට පත්ව ඇති බැවින් දීර්ඝකාලීන ස්ථායීතාවය තහවුරු කිරීම සඳහා ''ස්වභාව ධර්මය මත පදනම් විසඳුම්" (NbS) ඵලදායී ලෙස භාවිත කළ හැකිවනු ඇත. වගාවන් ඇති කිරීමෙන් හෝ පාංශු ජෛව ඉංජිනේරු ම ය ක්‍රමවේදයන් මඟින් ගැඹුරු නායයෑම්වල පසෙහි පාංශු තෙතමනය අවමකිරීම ඉතාමත් මද වුව ද ශාක මූලයන් මඟින් අතිරේක ව ගොඩනැගෙන පාංශු ජලපීඩනය වලක්වා ගැනීමට උපකාරී වනු ඇත.

තවත් වැදගත් සොයාගැනීමක් වන්නේ ස්වභාව ධර්මය මත පදනම් නායයෑම් අවදානම කළමනාකරණයෙහි ප්‍රධාන සංරචකයවන ශාක ප්‍රභේද/වගාවන් ස්ථානගත කිරීම, සාම්ප්‍රදායික

ඉංජිනේරු ම ය විසඳුම්, ස්වභාව ධර්මය මත පදනම් විසඳුම්, උචිත වගාවන් සංකලනයෙන් (දෙමුහුන් විසඳුම්) පිරිවැය ඵලදායී ආකාරයෙන් නායයෑම් අවදානම අවමකරණ කටයුතු සිදුකල හැකි බව යි. එබඳු දෙමුහුන් විසඳුම් වඩාත් තිරසාර වන අතර දිගුකාලීන තඩත්තු පිළිබඳ ව පැන නගින අභියෝගවලට මුහුණ දීම සඳහා ද හඳුන්වා දිය හැකිවනු ඇත.

දෙමුහුන් විසඳුම් සඳහා උදාහරණ

අවමකිරීමේ ක්‍රමවේදයන් තුලින් නායයෑම් අවදානම අවමකිරීමේ ව්‍යාපෘතිය (RLVMMP)

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලත් ඒකාබද්ධ නායයෑම් අවමකිරීමේ වැඩසටහනින් ආරම්භ වී ජා. ගො. ප. සංවිධානය විසින් ‘‘අවමකරණ ක්‍රියාමාර්ග තුලින් නායයෑම් අවදානම අවමකිරීමේ ව්‍යාපෘතිය’’ (RLVMMP) ආරම්භ කරන ලදී. වසර 5 ක් පුරා ක්‍රියාත්මක මෙම මහා පරිමාණ ව්‍යාපෘතිය සඳහා හඳුනාගත් අධි-අවදානම් අඩවි මෙන් ම මාර්ග ආශ්‍රිත අස්ථායී බෑවුම් හා උඩරට දුම්රිය මාර්ගය ආසන්න අස්ථාවර බෑවුම් ආශ්‍රිත අවමකිරීමේ කටයුතු ඇතුලත් වේ. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචක වන්නේ:

- සිවිල් වැඩ සහ ඒ ආශ්‍රිත සැලසුම් සහ ඉදිකිරීම් අධීක්ෂණ/කළමනාකරණ කටයුතු
- ප්‍රතිපත්ති සහ නියාමනයන් වැඩි දියුණු කිරීම
- ආයතනික ධාරිතා ගොඩනැගීම
- තාක්ෂණික සහාය සහ ව්‍යාපෘති කළමනාකරණය

අඩවි 147 ක් ආශ්‍රිත ඉතා කඩිනම් අවමකරණයන් අවශ්‍යව ඇති අතර ජා. ගො. ප. සංවිධානය විසින් දේශීය අධිකාරී ආයතන, මාර්ග සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ඒකාබද්ධ ව ප්‍රමුඛතාවයන් ලබාදීම සිදුකර ඇත.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය එහි ව්‍යාපෘති කාර්යමණ්ඩලය හා ජා. ගො. ප. සංවිධානයෙහි සහායක කාර්යමණ්ඩලය සමඟ තම වගකීම් ඉටුකරනු ලබයි.

පළාත	දිස්ත්‍රික්කය	වැඩබිම් සංඛ්‍යාව
මධ්‍යම	මාතලේ	12
	මහනුවර	19
	නුවරඑළිය	14
වයඹ	කුරුණෑගල	3
සබරගමුව	කෑගල්ල	18
	රත්නපුර	33
දකුණ	මාතර	6
ඌව	බදුල්ල	19
බස්නාහිර	කොළඹ	1
	කළුතර	22
එකතුව		**147**



කළාප 1 හි පැකේජය 1 සහ පැකේජය 2, 2020 වසරේ දී තෝරාගත් කොන්ත්‍රාත්කරුවන් වෙත පිරිනමන ලද අතර රත්නපුර හා කළුතර දිස්ත්‍රික්කවල නායයෑම් අඩවි 11 ක ඉදිකිරීම් ආරම්භ කරන ලදී. පැකේජය 3 සඳහා වන සිවිල් වැඩ කොන්ත්‍රාත්තුව ලබාදී ඇති අතර ඉදිකිරීම් කටයුතු 2021 වසර මුල දී ඇරඹීමට නියමිත ව ඇත. කළාප 1 යටතේ වන පැකේජය-4, උප පැකේජයන් තුනකට බෙදා දේශීය කොන්ත්‍රාත්කරුවන් වැඩි පිරිසකට අවස්ථාව සැලසෙන පරිදි වර්තමාන කොවිඩ් - 19 වාතාවරණය හමුවේ ටෙන්ඩර් ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.

දුරේකන්ද නායයෑම් අවමකරණ අඩවිය (වම) සහ රත්නපුර දිස්ත්‍රික්කය, ගලබොඩ (දකුණ)

"බලගැන්වීමේ ව්‍යාපෘති"

ජා. ගො. ප. සංවිධානය විසින් 2019 වසරේ එහි වාර්ෂික පර්යේෂණ සමුළුව තුල දී එක්සත් රාජධානියෙහි සල්ෆඩ් විශ්වවිද්‍යාලයේ 'THINKlab' ආයතනය සමඟ ආපදා අවදම අවමකිරීම සඳහා ප්‍රතිචාර දැක්වීමත් ආපදා ප්‍රතිචාර දැක්වීම් ධාරිතාවය වර්ධනය කිරීම සඳහාත් ජා. ගො. ප. සංවිධානයෙහි ඩිජිටල් හැකියාව ශක්තිමත් කිරීම සඳහා ජාත්‍යන්තර පර්යේෂණ සහයෝගීතාවයක් දියත්කරන ලදී. ජා. ගො. ප. සංවිධානයෙහි අවශ්‍යතාවය අනුව ආපදා අවදානම අවමකිරීමේ කටයුතු සඳහා ඉලක්කගත ඩිජිටල් මෙවලම් සමූහය සංවර්ධන අවශ්‍යතාවය හඳුනාගැනීම සඳහා කණ්ඩායම් දෙකම එක් ව කටයුතු කරන ලද අතර 'THINKlab' කණ්ඩායම විසින් ජා. ගො. ප. සංවිධානය වෙත 'MOBILISE' වේදිකාවක් සලසන ලදී. පසුව ජා. ගො. ප. සංවිධානයෙහි තොරතුරු තාක්ෂණ ධාරිතාවය, ඩ්‍රෝනයානා, ආකෘති නිර්මාණය සමාකරණය සහ ආපදා අවදානම් අවමකරණ ක්‍රියාකාරකම්වල දෘශ්‍යකරණය පිළිබඳ ආයතනික ධාරිතාව ඉහල නැංවීම සඳහා යෙදවුම් සංවර්ධනය කරන ලදී. මෙම සහයෝගීතාවය යටතේ සල්ෆර්ඩ් විශ්වවිද්‍යාලය විසින් මානව හා ජනාවාස සැලසුම් හා පුහුණු අංශයේ ජ්‍යෙ. විද්‍යාඥ, දයාන් මුණසිංහයන් හට ආචාර්ය තත්ත්වය ප්‍රදානය කරන ලදී. පසුව MOBILISE වේදිකාව ජා. ගො.ප. සංවිධානය තුල පවත්නා වූ ඩිජිටල් යටිතල පහසුකම් සමඟ සංගෘහිත කිරීම මඟින් එහි පරිනතභාවය කරා ලඟා විය. මෙම සහයෝගීතාවය MOBILISE ව්‍යාපෘතිය (www.mobilise-project.org.uk) විසින් පහසුකම් සපයන ලද අතර එක්සත් රාජධානියේ 'ගෝලීය අභියෝගීතා පර්යේෂණ අරමුදල' (GCRF) විසින් ප්‍රජාවන් වෙත ස්වභාවික විපත්වලින් ඇතිවන බලපෑම අවමකිරීම සඳහා ඒජන්සි රාශියකට එක් ව කටයුතු කිරීම පිණිස අවශ්‍යවන බුද්ධිම ය දයකත්වය ලබාගැනීම උදෙසා අවශ්‍ය කරන ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් මූල්‍ය දයකත්වය සපයන ලදී.

මෙම ව්‍යාපෘතියේ වැදගත් ම කාර්යය වන්නේ පූර්ව අනතුරු හැඟවීම් පණිවිඩ ජනනය කිරීමේ ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීමවන අතර මෙය 2020 වසරේ සක්‍රිය සහයෝගික පර්යේෂණ වැඩසටහනකි. ජා. ගො. ප. සංවිධානය ප්‍රථමයෙන් 'MOBILISE' තාක්‍ෂණික කණ්ඩායම වෙත ජා. ගො. ප. සංවිධානය විසින් අදාල අධිකාරීන් වෙත යවනු ලබන පූර්ව අනතුරු හැඟවීමේ පණිවිඩ කළමනාකරණය කිරීම සඳහා වැඩ ප්‍රවාහ යෙදවුමක් සංවර්ධනය කිරීම පිණිස වර්ෂාමාන සමූහයක් වෙත ප්‍රවේශය සපයන ලදි. ප්‍රතිඵල වශයෙන් ජා. ගො. ප. සංවිධානයෙහි නායයෑම් පූර්ව අනතුරු හැඟවීම් මධ්‍යස්ථානය සහ දිස්ත්‍රික් නිලධාරීන් ආපද කළමනාකරණ මධ්‍යස්ථානය, දිස්ත්‍රික් ලේකම්වරු හා ප්‍රාදේශීය ලේකම්වරු, ජාතික ආපද සහනසේවා මධ්‍යස්ථානය (NDRSC) සහ ග්‍රාම නිලධාරීන්වරුන් යන සියලුම පාර්ශ්වයන්හට පූර්ව අනතුරු හැඟවීමේ පද්ධතිය වෙත පෞද්ගලික ව ප්‍රවේශවීමේ පහසුකම් සැලසේ.

ජා. ගො. ප. සංවිධානය බොහෝවිට නායයෑම් අවදනම් කළමනාකරණය සඳහා ඩ්‍රෝන පාදක ඡායාරූප භාවිතා කරයි. MOBILISE වේදිකාව වෙත උසස් තත්ත්වයේ ඩ්‍රෝන ඡායරූප ඇතුලත් කිරීම සඳහා භාවිතකරුවන්ට අවකාශ සැලසෙන අතර උනන්දුවක් දක්වන පාර්ශවකරුවන් බොහෝ පිරිසක් වෙත ඩ්‍රෝන ඡායාරූප, කළමනාකරණ සැලසුම් සහ අඩවි පිරිසැකසුම් වැනි විශාල තොරතුරු ගොනු හුවමාරු කරගැනීමේ පහසුකම් සැළසේ. මේ තුළින් ප්‍රජාව නැවත පදිංචිකිරීමේ වැඩසටහන් තුල දී බොහෝ පාර්ශවකරුවන් සමඟ වඩාත් හොඳ සහයෝගීතාවයකින් කටයුතු කිරීම සඳහාත්, ඩ්‍රෝන මත පදනම් නායයෑම් කටයුතු නිරීක්ෂණයන් සඳහාත්, ජා. ගො. ප. සංවිධානයෙහි හැකියාව වර්ධනයට ද හේතු විය. නායයෑම් අවමකිරීමේ අඩවිවල ඉදිකිරීම් අධීක්ෂණය සඳහා දැනට ක්‍රියාත්මකව පවතින ස්ථානයන් 147 ක වරින් වර ලබාගන්නා ඩ්‍රෝන ඡායාරූප හා පටිගත කිරීම් යොදාගනිමින්, ඉංජිනේරුවරුන්ගේ විශ්ලේෂණයන් සඳහා එබඳු අඩවිවල ත්‍රිමාණ ආකෘති නිර්මාණය පිණිස ඩ්‍රෝන පදනම් යෙදවුමක් සංවර්ධනය කර ඇත. ඉංජිනේරුවරුන් සඳහා හරස්කඩ විශ්ලේෂණයන් සිදුකිරීම, පස් කැපුම් හා පිරවුම් ගනනය සහ චලන විශ්ලේෂණයන් පිණිස අනන්‍ය මෙවලම් රාශියක් සංවර්ධනය කර ඇත. ප්‍රතිඵලයන් විවිධ කාලවකවානු තුල දී ගන්නා ලද ඩ්‍රෝන ඡායාරූපවල හු තත්ත්ව රේඛා කිහිපයක් සමඟ ද්විමාන ප්‍රස්තාර වශයෙන් ඉදිපත් කළ හැකි ය. පස් කැපුම් හා පිරවුම් ගණනය කිරීමේ මෙවලම මඟින් කිසියම් නිශ්චිත භූමියක කොපමණ ප්‍රමාණයක් පස් පිරවීම හෝ ඉවත්කිරීම සිදුකර ඇත් ද යන්න පිළිබඳ ව සංඛ්‍යාත්මක අගයන් ලබාදීම සිදුකෙරේ. චලන විශ්ලේෂණ මඟින් තෝරාගත් ස්ථානයක කාලයත් සමඟ සිදුවන ත්‍රිමාණ චලිතය ලබාදෙන අතර පරිශීලකයා විසින් භූමියෙහි පදිංචි වීම හා ව්‍යුහයේ තිරස් චලනය පිළිබඳ ව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ. https://nbro.mobilise-srilanka.org/

රූපය : ඩ්‍රෝන දත්ත දෘශ්‍යකරණ පද්ධතිය



රූපය : හරස්කඩ සැකසීමේ හැකියාව



රූපය 1: Mobilize පද්ධතිය

එක්සත් ජනපදයේ භූ විද්‍යාත්මක සමීක්ෂණ ආයතනය (USGS) සමඟ තාක්ෂණික සහයෝගීතාවය

එක්සත් ජනපදයේ භූ විද්‍යාත්මක සමීක්ෂණ ආයතනයේ (USGS) කණ්ඩායමක් 2019 වසරේ දී ජා. ගො. ප. සංවිධානය වෙත පැමිණි අතර නායයෑම් අවදානම කළමනාකරණය සඳහා ජා. ගො. ප. සංවිධානය වෙත සහාය දැක්වීම සඳහා සාකච්ඡා පැවැත්විණි. මේ සම්බන්ධයෙන් වන අවබෝධතා ගිවිසුමක් ජා. ගො. ප. සංවිධානය හා එක්සත් ජනපදයේ භූ විද්‍යාත්මක සමීක්ෂණ ආයතනය සමඟ අත්සන් තැබිණ. කණ්ඩායම විසින් ජා. ගො. ප. සංවිධානයේ කාර්යය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහනක් ද පවත්වන ලදී.

2020 ඔක්තෝම්බර් මාසයේ දී නායයෑම් අධීක්ෂණ උපකරණ පරිත්‍යාගයක් ලද අතර ජා. ගො. ප. සංවිධානයේ කණ්ඩායම විසින් ඒවා බදුල්ල දිස්ත්‍රික්කයේ තෝරාගත් අඩවි තුළ සාර්ථක ව ස්ථාපනය කරන ලදී. පසුගිය අත්දැකීම් හා එක්සත් ජනපදයේ භූ විද්‍යාත්මක සමීක්ෂණ කණ්ඩායම සමඟ පවත්වන ලද ඒකාබද්ධ වැඩමුළුව තුළදී ලබාගත් තාක්ෂණික දැනුම නව පද්ධතිය පහසුවෙන් ස්ථාපනය සඳහා මහත් පිටුවහලක් විය.

මෙම අධීක්ෂණ පද්ධතිය මඟින් ජා. ගො. ප. සංවිධානය වෙත දුරස්ථ ව පාංශු තෙතමණය, සිදුරු ජල පීඩනය, වායු ගෝලීය පීඩනය හා ස්ථාපිත අඩවියෙහි තත්කාලීන වර්ෂාපතනය ඇතුළත් පරාමිතීන් අධීක්ෂණය සඳහා අවස්ථාව සැලසිණි. මේ තුළින් ජා. ගො. ප. සංවිධානය, ප්‍රදේශයේ නායයෑම් ආරම්භවීම සඳහා බලපාන විවිධ සීමා පරාමිතීන් ව්‍යුත්පන්න කිරීම් වැනි පර්යේෂණ අරමුණු සඳහා භාවිතා කරනු ඇත. මෙම දත්ත විශ්ලේෂණයන් තුළින් සිදුකරනු ලබන සොයාගැනීම් පිළිබඳ ව පර්යේෂණ පත්‍රිකාවක් ප්‍රකාශයට පත්කිරීමට ද ජා. ගො. ප. සංවිධානය වැඩිදුරටත් අදහස්කර ඇත. මෙම කටයුතුවල අවසාන ඉලක්කය නායයෑම්වලට ලක්වීමේ හැකියාව සහිත ඉලක්කගත ප්‍රදේශවල වාසය කරන ප්‍රජාවන් වෙත දේශීය හා කලාපීය වශයෙන් නායයෑම් පූර්ව අනතුරු හැඟවීම් නිකුත් කිරීම හා එසේ කිරීම තුළින් තම ප්‍රදේශ තුළ නායයෑම්වලින් වඩාත් ජීවිත ආරක්ෂා කර ගැනීම වේ.

බදුල්ල දිස්ත්‍රික්කයේ අධීක්ෂණ පද්ධති ස්ථාපනය කිරීම

ජා. ගො. ප. සංවිධානයේ ප්‍රකාශනයන්

පුවත් පත්‍රිකා

ඉලෙක්ට්‍රොනික පුවත් පත්‍රිකා ප්‍රකාශනයන්

ඉලෙක්ට්‍රොනික පුවත් පත්‍රිකා 6 ක් ප්‍රකාශයට පත්කර ඇත. මෙම පුවත් පත්‍රිකාවල අන්තර්ගතයන්

1. කාලසීමාව තුල සිදුකරන ලද කාර්යයන් ප්‍රකාශයට පත්කිරීම
2. දෛනික ඉදිරිපත් කිරීම සටහන් කිරීම සහ ඒවායේ ප්‍රතිඵල
3. කණ්ඩායමේ අදහස් සාකච්ඡා කිරීම

පහත සඳහන් සබැඳියන් ඔස්සේ පුවත් පත්‍රිකා වෙත ප්‍රවේශ විය හැක.

https://publicate.it/p/s67F6y143444

https://publicate.it/p/Q3qZ5t147301

https://publicate.it/p/jX6CeG141256

වෙබ් යෙදුම්

1. ඩ්‍රෝන දෘශ්‍යකරණ පද්ධතිය MOBILISE වේදිකාව යටතේ සංවර්ධනය කරන ලද අතර මූලික වශයෙන් ඩ්‍රෝන ඡායාරූප උඩුගත කිරීම, ත්‍රිමාණ ආකෘති සැකසීම හා භ්‍රමණය කිරීම මෙන් ම VR වේදිකාව වෙත යොමු කිරීම සඳහා තනි ව ක්‍රියාකරණ මෘදුකාංගයකි. සල්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ විද්‍යා, ඉංජිනේරු හා පාරිසරික පාසලේ THINKlab සහයෝගය සහිත ව RLVMM ව්‍යාපෘතියෙහි අධීක්‍ෂණ කටයුතු සඳහා මෙම පද්ධතිය භාවිතා කරනු ඇත.

2. වායු තත්ත්ව පුරෝකථනය සහ සුදනම්කරණ පද්ධතිය සඳහා ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශතුල තත්‍ය කාලීන වායු තත්ත්ව අධීක්ෂණ ජාලය

මූල්‍ය ම ය විශේෂ අවස්ථා

2020 වසර තුල ජා. ගො. ප. සංවිධානය රු. මිලියන 771.0 ක ඒකාබද්ධ අදයමක් වාර්තාකර ඇත. ජා. ගො. ප. සංවිධානයෙහි සේවා සැපයීම තුලින් ලද ආදායම රු. මිලියන 387.0 කි. ආයතනයේ බොහෝ දුරට මෙම උපදේශාත්මක ආදායම තුලින් තම වර්තමාන පුනරාවර්තන පිරිවැය අවශ්‍යතා සපුරාගැනීම සිදුකරයි.

2020 වසරේ දී රාජ්‍ය ප්‍රතිපාදන යටතේ වන ව්‍යාපෘති හා වැඩසටහන් වෙනුවෙන් රු. මිලියන 331.0 භාවිතාකර ඇත. 2011 මාර්තු මාසයේ සිට දිස්ත්‍රික් කාර්යාල 9 ක් නායයෑම් නැඹුරුතාවයක් සහිත දිස්ත්‍රික්ක තුල සංවර්ධන කටයුතුවලට ප්‍රථම නායයෑම් අවදනම් වාර්තා නිකුත් කිරීම සඳහා ක්‍රියාත්මක වෙමින් පවතී. පුනරාවර්ථන වියදම් වශයෙන් භාණ්ඩාගාරයෙන් රු. මිලියන 32.5 ක් සපයන ලද අතර ශේෂය සේවාලාභීන් වෙතින් අයකරනු ලබන නාමික ගාස්තු මගින් හා ජා. ගො. ප. සංවිධානයේ ආදායම තුලින් පියවාගැනීම කටයුතු කර ඇත.



මුලු මෙහෙයුම් ආදායම හා ශුද්ධ අතිරික්තය



2016 – 2020 කාලය තුල උපයන ලද ශුද්ධ ආදායම



2020 වසරේ රාජ්‍ය ප්‍රතිපාදන ව්‍යාපෘති



පරීක්ෂණ හා උපදේශනයන් මගින් ලද ආදායම

ඊට අමතර ව නායයෑම් ආපදු සිතියම්ගත කිරීම් සඳහා රු. මිලියන 23.0 ක් ද පර්යේෂණ හා සංවර්ධන සඳහා රු. මිලියන 12.8 ක් ද නායායෑම් විශේෂ විමර්ශන සඳහා රු. මිලියන 65.1 ක් ද පර්යේෂණාගාර හා ක්ෂේත්‍ර කාර්යාල ප්‍රසම්පාදනය සඳහා රු. මිලියන 19.8 ක ප්‍රතිපාදනයන් ද භාණ්ඩාගාරය වෙතින් හිමි විය.

2020 වසරේ ඒකාබද්ධ ආදයම රු. මිලියන 771.0 ක් වූ අතර අදාල කාලපරිච්ඡේදය සඳහා ඒකාබද්ධ පිරිවැය රු. මිලියන 740.8 ක් විය. ඒ අනුව රු. මිලියන 30.2 ක ශුද්ධ ලාභයක් වාර්තා විය.

402 දෙනෙකුගෙන් ශක්තිමත් කාර්යයමණ්ඩලය ඇතුලූ දෛනික වේතනයන් ලබන සේවකයන්ගේ දීමනාවන් වෙනුවෙන් රු. මිලියන 455.0 ක පිරිවැයක් 2020 වසරේ දී දරා ඇති අතර 2019 වසරේ දී කාර්යයමණ්ඩල ශක්තිය 490 සහ දෛනික වේතනයන් ලබන සේවකයන් ද ඇතුලූ ව මෙම අගය රු. මිලියන 539.0 ක් විය.

ආයතනික වර්ධනය සහ වැඩිදියුණු වූ කාර්යසාධනය ප්‍රධාන වශයෙන් ජා. ගො. ප. සංවිධානයෙහි කළමනාකාරීත්වයේ සහ කාර්යමණ්ඩලයෙහි ධෛර්යමත් උත්සාහයේ ප්‍රතිඵලයකි.

මූල්‍යමය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

රු.

	ඇමුණුම් අංකය	31.12.2020 දිනට		31.12.2019 දිනට
ජංගම වත්කම්				
මුදල් සහ ඒ ආශ්‍රිත වත්කම්	1		94,773,584	116,777,209
ලැබීමට නියමිත ව්‍යාපෘති ණයගැනියත්	2	477,982		477,982
විවිධ ලැබීම්	3	91,037,149	91,515,131	75,302,188
			186,288,715	**192,557,379**
ඉන්වෙන්ට්‍රි	4		3,410,241	3,965,848
කාර්යමණ්ඩලයෙන් ලැබීම්	5		101,092,773	118,746,878
පෙර ගෙවීම්	5A		135,922,914	157,787,979
වෙනත් ජංගම වත්කම්				
සිදුවෙමින් පවතින ව්‍යාපෘති	6	104,284,321		292,179,615
කාලීන තැන්පතු	7	469,321,082	573,605,403	463,912,823
ජංගම නොවන වත්කම්			**1,000,320,046**	**1,229,150,522**
යටිතල, පිරියත සහ උපකරණ	8	710,556,869		670,221,382
නව විද්‍යාගාර ගොඩනැගිල්ල නොනිම් වැඩ		391,734,775		333,811,858
රත්නපුර ගොඩනැගිල්ල නොනිම් වැඩ		3,928,967	1,106,220,611	1,310,000
මුළු වත්කම්			**2,106,540,657**	**2,234,493,762**
වගකීම්				
ජංගම වගකීම්				
ගෙවීමට ඇති සේවාදයකයන්ගෙන් ලැබූ මුදල්	9	319,910,612		514,260,662
විවිධ ගෙවීම්	10	116,845,313	436,755,926	139,177,262
ජංගම නොවන වගකීම්				
දීර්ඝ කාලීන ප්‍රතිපාදන				
ක්ෂයවීම් සඳහා	11	542,121,830		484,490,237
පාරිතෝෂික සහ බොල් ණයකරුවන් සඳහා වෙන්කිරීම්	12	105,257,332	647,379,162	93,534,997
මුළු වගකීම්			**1,084,135,088**	**1,231,463,158**
ශුද්ධ වත්කම්			**1,022,405,569**	**1,003,030,604**
ශුද්ධ වත්කම් / ප්‍රාග්ධනය				
රජයේ සහ වෙනත් ආයතනවලින් දයක කරන ලද ප්‍රාග්ධනය	13	588,731,489		599,526,190
වෙන්කිරීම් –අතිරික්තය නැවත ගණනය		27,875,989		27,875,989
පවරාගත් වත්කම්		2,264,498	618,871,976	2,264,498
සමුච්චිත අතිරික්තය/ (ඌනතාව)				
ඉදිරියටගෙන ආ අතිරික්තය	14	373,363,926	373,363,926	318,124,023
වර්ෂය සඳහා අතිරික්තය			30,169,666	55,239,903
ශුද්ධ වත්කම් / ප්‍රාග්ධනය			**1,022,405,569**	**1,003,030,604**

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය රු.

ආදායම	ඇමුණුම්	2020 වර්ෂය	2020 වර්ෂයේ සංශෝධිත අයවැය	2019 වර්ෂය
ආදායම				
පාරිසරික අධ්‍යයන සහ සේවා අංශය	**15**	66,284,071	68,225,056	72,854,502
භූ තාක්ෂණික ඉංජිනේරු සහ පරීක්ෂණ අංශය	**16**	157,524,997	181,000,000	235,338,251
නායයාම් පර්යේෂණ සහ අවදානම් කළමනාකරණ අංශය	**17**	226,452,921	232,850,000	273,147,266
මානව ජනාවාස සැළසුම් සහ පුහුණු අංශය	**18**	64,031,993	65,203,372	97,376,186
ගොඩනැගිලි ද්‍රව්‍ය අංශය	**19**	35,505,706	36,000,000	40,648,623
ව්‍යාපෘති කළමනාකරණ අංශය	**20**	167,890,127	153,494,823	186,387,791
සම්පූර්ණ මෙහෙයුම් ආදායම		**717,689,815**	**736,773,251**	**905,752,619**
වෙනත් ආදායම්	**21**	53,654,050	50,000,000	53,120,424
මුළු ආදායම		**771,343,865**	**786,773,251**	**958,873,043**
අඩුකළා: වියදම්				
වැටුප්, පඩිනඩි හා සේවක ප්‍රතිලාභ	**22**	454,787,074	490,094,565	538,893,390
භාවිතා කරන සැපයුම් සහ පරිභෝජන	**23**	235,814,360	225,124,614	326,542,078
ක්ෂය වීම	**24**	6,478,138	8,000,000	9,244,961
දේපළ ඌනතා, පිරියත සහ උපකරණ	**25**	13,065,378	10,910,071	16,333,344
වෙනත් වියදම්	**26**	27,780,767	21,231,705	12,565,069
මූල්‍ය පිරිවැය	**27**	48,482	3,881	54,298
මුළු වියදම		**737,974,198**	**755,364,836**	**903,633,140**
බදුවලට පෙර ශුද්ධ ලාභය		33,369,666	31,408,415	55,239,903
ආදායම් බදු		3,200,000		
බදුවලට පසු ශුද්ධ ලාභය		**30,169,666**	**31,408,415**	**55,239,903**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

රු.

	2020 වසර	2019 වසර
අතිරික්තය / (හිඟය)	**30,169,666**	**55,239,903**
ගැලපුම්		
ක්ෂයවීම්	6,478,138	9,244,961
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	17,539,828	19,906,232
පාරිතෝෂික ගෙවීම	-5,817,493	-2,194,769
වාහන අපහරණය	-	-
ගිණුමට බැර නොවූ පොලී ආදායම	-46,168,030	-47,177,596
ක්‍රියාකාරී ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර ක්‍රියාත්මක අතිරික්තය (හිඟය)	**2,202,110**	**35,018,731**
ක්‍රියාකාරී ප්‍රාග්ධනයේ වෙනස්වීම්		
ණයගැතියන් වැඩිවීම	-15,734,961	-26,611,666
කාර්යමණ්ඩලයෙන් ලැබීම් වැඩිවීම	17,654,105	-89,390,591
පෙරගෙවීම් වැඩිවීම	21,865,065	-33,599,420
ඉන්වෙන්ට්‍රිවල වැඩිවීම	555,606	-222,667
අත ඇති වැඩවල ප්‍රගතිය වැඩිවීම	187,895,293	149,488,457
තැන්පතු වැඩිවීම	-5,408,259	123,680,265
සේවාදායකයන්ගෙන් ලැබුණු මුදල්	-194,350,050	-59,644,750
විවිධ ණය හිමියන්ගේ වැඩිවීම	-22,331,949	-3,733,738
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබුණු ශුද්ධ මුදල් ප්‍රවාහය	**-7,653,038**	**94,984,621**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබුණු මුදල් ප්‍රවාහය		
පොලී ආදායම	46,168,030	47,177,596
ස්ථාවර වත්කම් මිලදීගැනීම්	-100,900,638	-204,792,239
ස්ථාවර වත්කම් සඳහා බැහැර කිරීම	23,268	1,500,000
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**-54,709,341**	**-156,114,643**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
රජයේ ප්‍රතිපාදන (ප්‍රසම්පාදන)	11,611,914	21,013,402
වෙනත් ප්‍රතිපාදන	28,746,841	49,578,848
මුදල් යෙදවීමේ ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ	**40,358,754**	**70,592,250**
මුදල් සහ සමාන දෑවල ශුද්ධ වෙනස්වීම	-22,003,625	9,462,227
කාල සීමාව ආරම්භයේ මුදල් සහ සමාන දෑ	116,777,209	40,116,143
2020.12.31 දිනට මුදල් සහ සමාන දෑ	**94,773,584**	**49,578,370**
සටහන - මුදල් සහ සමාන දෑ		
බැංකුවේ සහ අත ඉතිරි මුදල්	94,773,584	116,777,209
	94,773,584	**116,777,209**

ගිණුම් සටහන්

1. ගිණුම් සඳහා වූ පදනම

සාමාන්‍ය පිළිගත් ගිණුම් ප්‍රතිපත්ති, මූලික උපකල්පන, රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිති සහ විටින් විට වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය මගින් හඳුන්වාදුන් ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව සහ පහත සඳහන් කරුණු සැලකිල්ලටගෙන මූල්‍ය ප්‍රකාශන සකස්කර ඇත.

(අ) ලාභ සහිතව පවත්වාගෙනයන ආයතන.

(ආ) ගිණුම් ප්‍රතිපත්ති අඛණ්ඩව භාවිත කිරීම.

(ඇ) උපචිත පදනමින් ආදායම සහ වියදම් හඳුනාගැනීම.

(ඈ) ප්‍රමිතිවලින් බැහැරවීම හෙළි කිරීම

2. සාමාන්‍ය ගිණුම් ප්‍රතිපත්ති

2.1 ක්ෂය කිරීමේ ප්‍රතිපත්ති

(අ) ක්ෂයකිරීම භාවිතා කළ දවස් ගණන මත පදනම් වේ
(ආ) පහත සඳහන් ප්‍රතිශතයන් අනුගමනය කරමින් සරල මාර්ග පදනම් කරගෙන ස්ථාවර වත්කම් ක්ෂය කරනු ලැබේ.

ස්ථාවර වත්කම් වර්ගය	%
ගොඩනැගිලි	2.5
යන්ත්‍රසූත්‍ර සහ විද්‍යාගාර උපකරණ	20
ලී බඩු සහ සවිකිරීම්	10
වාහන	20
සාමාන්‍ය කාර්යාලයීය උපකරණ	20
ඇඳිම සඳහා භාවිත කරන කාර්යාලයීය උපකරණ	10
මෙවලම්	50
පුස්තකාල පොත්	5
ගිනි නිවීමේ උපකරණ	10

ඇ) ශ්‍රී ලංකාවේ ගණකාධිකරණ ප්‍රමිතිවල සඳහන් පරිදි දායක වත්කම් සඳහා ගෙවීම්, දායක මුදල් ඉදිරියටගෙන ආ වටිනාකමින් අඩුකර ඇත.

2.2 අවසාන තොග ගණනයකිරීම

භාවිත නොකරන ලද භාණ්ඩ තොග පිරිවැය මත ගණනයකර ඇත.

2.3 පාරිතෝශික සඳහා ප්‍රතිපාදන

පාරිතෝශික පනත අනුව පාරිතෝශික සඳහා ප්‍රතිපාදන ගණනය කරන ලදී.

2.4 අවිනිශ්චිත ණයකරුවන් සඳහා ප්‍රතිපාදන

පහත සඳහන් කරුණු පදනම් කොට අවිනිශ්චිත ණයකරුවන් සඳහා ප්‍රතිපාදන සපයා ඇත:

(අ) අවු. 2-10 පුරා හිඟ ණය සඳහා 1 % ප්‍රතිපාදන සපයනු ලැබේ.
(ආ) අවු. 10 ක් පුරා හිඟ ණය සඳහා 25 % ප්‍රතිපාදන සපයනු ලැබේ.

Statement of Responsibility for Financial Statements in terms of Sec. 7A.

The Accounting policies & Notes to Accounts on pages 06 form an integral part of these Financial Statements. The Board of Directors is responsible for the preparation and presentation of these Financial Statements. These Financial Statements were approved by the Board of Directors and signed on their behalf.

Member of the Interim Management Committee of NBRO

Kamal Gunaratne WWV RWP RSP USP ndc psc
Major General (Retd)
Secretary
State Ministry of National Security and Disaster Management
Chairman of the IMC

General Kamal Gunaratne (Retd)
WWV RWP RSP USP ndc psc MPhil
Secretary
State Ministry of National Security,
Home Affairs and Disaster Management

H.U.R. Fonseka
Chief Accountant
Disaster Management Division
State Ministry of National Security and Disaster Management

H.U.R. Fonseka
Chief Accountant
State Ministry of National Security,
Home Affairs and Disaster Management
Disaster Management Division
Vidya Mawatha, Colombo 07.

Chief Executive Officer of NBRO

Eng.(Dr.) Asiri Karunawardena
Director General
National Building Research Organisation

Director General
National Building Research Organisation
No. 99/1, Jawatta Road,
Colombo 05.

Chief Financial Officer of NBRO

K.K.H.Randeny
Director (Finance)
National Building Research Organisation

K.K.H. RANDENY
DIRECTOR FINANCE
NATIONAL BUILDING RESEARCH ORGANIZATION
FINANCE DIVISION
99/1, JAWATTA ROAD,
COLOMBO - 05.

මානව සම්පත් කළමනාකරණය /ධාරිතා සංවර්ධනය

ආපද කළමනාකරණ අමාත්‍යාංශයේ ආපද අවදානම් අවමකිරීමේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ජා. ගො. ප. සංවිධානයේ ධාරිතා සංවර්ධනය කිරීමට එහි දැක්ම සහ මෙහෙවර සකස්කරන ලදී. ඒ අනුව කටයුතු කරනු වස් ජා. ගො. ප. සංවිධානය ඉහළ ප්‍රමිතියෙන් යුතු සේවයක් සැළසීමට ආයතනීය මෙහෙවර පාර්ලිමේන්තු පනතක් මඟින් නීතිගත කිරීමේ ක්‍රියාවලිය සහ කාර්යමණ්ඩල ධාරිතාව ඉහළ නැංවීම සම්බන්ධයෙන් පියවර ගනිමින් සිටියි. ආයතනයේ මානව සම්පත් හා යටිතල පහසුකම් අවශ්‍යතා වර්තමානයේ දී ආයතනය විසින් දරණු ලබන වගකීම් කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතු කරුණකි.

අත්‍යාවශ්‍ය පුරප්පාඩු අවස්ථාවන් සඳහා නවක සේවකයින් බඳවාගැනීම සිදුවිය. 2020 වසරේ දී කාණ්ඩයන් දෙකකට අයත් සේවකයින් 7 දෙනෙකු බඳවාගැනීම සිදුකර ඇත.

අංකය	වැටුප් කේතය	කාර්යමණ්ඩල ගණය	බඳවාගැනීම් සංඛ්‍යාව	දැනට සිටින කාර්යමණ්ඩලය (ස්ථිර)	පුරප්පාඩු ගණන (ස්ථිර)	ලබා ගත හැකි අතිරේක කාර්ය මණ්ඩලය (වෙනත් පදනම්)
1	HM 2- 3	ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ප්‍රධාන විධායක නිලධාරී) (CEO)	1	1	0	0
2	HM 1-3	ජ්‍යෙෂ්ඨ කළමනාකරු	8	7	1	0
3	AR2	ජ්‍යෙෂ්ඨ අධ්‍යයන/විද්‍යාඥ	25	21	4	0
4	MM 1-1	මධ්‍ය කළමනාකරු	12	10	2	-
5	AR 1	අධ්‍යයන/විද්‍යාඥ	124	110	14	26
6	JM 1-1	කණිෂ්ඨ කළමනාකරු	25	23	1	09
7	MA 2-2	කළමනාකරණ සහකාර (තාක්ෂණ)	36	32	4	06
8	MA 1-2	කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)	53	41	12	12
9	PL 1,2&3	ප්‍රාථමික ශ්‍රේණි	102	83	19	21
	එකතුව		**386**	**328**	**57**	**74**

2020 වසරේ ස්ථිර කාර්යමණ්ඩලය බඳවාගැනීම්, විශ්‍රාම ගැනීම් සහ ඉල්ලා අස්වීම්

අංකය	වැටුප් කේතය	කාර්යමණ්ඩල ශ්‍රේණිය	බඳවාගැනීම් සංඛ්‍යාව	ඉල්ලාඅස්වූ සංඛ්‍යාව	විශ්‍රාමලත් සංඛ්‍යාව
1	HM 1- 3	ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ප්‍රධාන විධායක නිලධාරී) (CEO)	-	1	-
2	HM 1-1	ජ්‍යෙෂ්ඨ කළමනාකරු	-	-	-
3	MM 1-1/JM 1-1	මධ්‍ය/ කණිෂ්ඨ කළමනාකරු	-	-	-
4	AR2	ජ්‍යෙෂ්ඨ අධ්‍යයන/ විද්‍යාඥ	-	2	-
5	AR 1	අධ්‍යයන/ විද්‍යාඥ	-	3	-
6	MA 2-2	කළමනාකරණ සහකාර (තාක්ෂණික)	-	-	-
7	MA 1-2	කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	-	2	2
8	PL 1,2&3	ප්‍රාථමික ශ්‍රේණි	-	1	5
	එකතුව		-	**9**	**7**

ජා. ගො. ප. සංවිධානයේ පුහුණු/ වැඩමුළු සහභාගී වීම් / සම්මන්ත්‍රණය ආදිය

ජා. ගො. ප. සංවිධානය සිය කාර්යමණ්ඩලය සඳහා විවිධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. කෙටි කාලීන පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා බොහෝ කාර්යමණ්ඩල සාමාජිකයින් හට විදේශගත අවස්ථා සලසන ලදී. ඇතැම් විද්‍යාඥයින් සඳහා විදේශගත ආචාර්ය උපාධිය වැඩසටහන් සඳහා ද අවස්ථා සලසා දී ඇත.

2020 වර්ෂයේ විදේශ පුහුණු වැඩසටහන්

අනු අංකය	නම	තනතුර/අංශය	පුහුණු වැඩසහන	කාලය	රට
1	Mr. W.D.B.C. Abeywickrama	Scientist GETD	Master's Degree Program in Photogrammetry & Geoinformatics for the Academic Year 2020/21	02nd October - 31st March 2022	Germany
2	Mrs. K.M.S.K. Rajapaksha	Scientist ESSD	Master's Degree Program in Civil Environmental Engineering	25th September 2020 - 24th September 2022	Japan
3	Mrs. D.M.D.I.K. Ariyarathna	Scientist LRRMD	JICA Long Term Training (PhD) under Project on Development of Early Warning Technology of Rain - Induced Rapid and Long Travelling Landslides in Sri Lanka	12th October 2020 - 30th September 2023	Japan
4	Mr. S.H.S. Jayakody	Scientist (Engineer) GETD	JICA Long Term Training (PhD) under Project on Development of Early Warning Technology of Rain - Induced Rapid and Long Travelling Landslides in Sri Lanka	11th November 2020 - 30th September 2023	Japan

උපකරණ ප්‍රසම්පාදනය

2020 වසරේ දී මහා භාණ්ඩාගාරය විසින් පරීක්ෂණාගාර සහ ක්ෂේත්‍ර උපකරණ ප්‍රසම්පාදනය සඳහා රු. මිලියන 9.8 ක ප්‍රතිපාදන, ජා. ගො. ප. සංවිධානයේ පර්යේෂණ හා ධාරිතා සංවර්ධනය සඳහා ඵලදායී ලෙස භාවිතා කරන ලදී. ප්‍රධාන උපකරණයන් කිහිපයක් ඇතුළු ක්ෂේත්‍ර උපකරණ මෙම ප්‍රසම්පාදනයන් යටතේ ප්‍රතිපාදනය කෙරින. ප්‍රධාන අයිතමයන් පහත වගුව තුලින් දැක්වේ.

අංශය	අයිතමය
පාරිසරික අධ්‍යයන හා සේව අංශය	වර්ණමාපක, Ph මාපක, කැළඹීම් මාපක, ශබ්ධ මාපක, වායු නියැදි පොම්ප - 6, කාබන්ඩයොක්සයිඩ වායු අනාවරක, බහු-වායු අනාවරක, VOC අනාවරක, ඝෝෂා මාපක, ජල තත්ත්ව පරීක්ෂක
මානව ජනාවාස සැලසුම් හා පුහුණු අංශය	Phantom 4 RTK ඩ්‍රෝන - 3 Matrice 210 RTK ඩ්‍රෝන - 1

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.	ඩීඑම්ජී/ඒ/එන්බීආර්ඕ/එෆ්එස්/2020/13	ඔබේ අංකය / உமது இல. / Your No.	
දිනය / திகதி / Date	2021 ජූලි 29 දින		

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද පිරිවැය රු.60,603,536 ක් වූ මෝටර් වාහන 09 ක් පිරිවැය රු.29,840,484 ක විද්‍යාගාර උපකරණ සහ පිරිවැය රු.1,157,589 ක් වූ කාර්යාල උපකරණ දැනටමත් භාවිතා කරමින් පැවතියද රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව එම වත්කම්වල ඵලදායි ජීවිත කාලය නැවත තක්සේරු කර ගිණුම්වල ගැලපුම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 20 හි 117 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අස්පෘශ්‍ය වත්කම්වල ඵලදායී ජීවිත කාලය හෝ ක්ෂය කිරීමේ අනුපාතය, ඵලදායී ජීවිත කාලය තුල ක්ෂය කරන ක්‍රමය දැක්විය යුතු වුවත් පිරිවැය රු.12,337,058 ක් වූ පරිගණක මෘදුකාංග (Computer Software) සම්බන්ධයෙන් ඒ අනුව හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

(ඇ) පර්යේෂණ සංවිධානයේ දිස්ත්‍රික් කාර්යාලවලින් ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේෂණය කරන ලද රු.3,977,204 ක් ආදායම් හා වගකීම් ලෙස නිවැරිදිව හඳුනා ගැනීමට කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශනවල හඳුනා නොගත් ලැබීම් ලෙස දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ සිට ඉදිරියට ගෙනවිත් තිබුණු ලැබිය යුතු හා ගෙවිය යුතු ජාතිය ගොඩනැගිමේ බදු පිළිවෙළින් රු.7,966,743 ක් සහ රු.4,448,125 ක් වූ අතර එම ශේෂ අදාල ගිණුම්වලින් කපා හැරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී වෙනත් වියදම් ගිණුමට ගලපා තිබුණි. එම හේතුවෙන් වර්ෂයේ වෙනත් වියදම් රු.3,528,282 කින් වැඩියෙන් සහ වර්ෂයේ ලාභය එම වටිනාකමෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයේ ලැබිය යුතු එකතු කළ අගය මත බදු ලෙස වර්ෂ ගණනාවක සිට පැවත එන රු.6,016,209 ක ශේෂයක් 2020 දෙසැම්බර් 31 දින උප කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් ගිණුමට වියදමක් ලෙස ගලපා තිබුණි. එම හේතුවෙන් වර්ෂයේ වියදම් එම වටිනාකමෙන් වැඩියෙන් ද ලාභය අඩුවෙන් ද දක්වා තිබුණි.

(ඊ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් 30 අවුරුදු බදු පදනම මත රු.7,965,000 ක බදු මුදලක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා ඉඩමක් ලබාගෙන තිබුණ ද සංවිධානය සහ නාගරික සංවර්ධන අධිකාරිය අතර බදු ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. එම ඉඩමේ නෛතික හිමිකම සංවිධානය වෙත ලබා ගැනීමට කටයුතු නොකර එම ඉඩමේ වටිනාකම වූ රු. 7,965,000 ක මුදල දේපල පිරියත උපකරණ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) රජයේ ප්‍රදාන මගින් මිලදී ගත් වත්කම් සඳහා සමාලෝචිත වර්ෂයේ සිදු කර තිබුණු ක්‍රමක්ෂය ප්‍රමාණය වූ රු.51,153,455 මුදල් ආදායම් ප්‍රවේශය අනුව මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කරන බව අනාවරණය කර තිබුණද, ඉහත ක්‍රමක්ෂය ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි.

(ඌ) හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ වත්කම් අත්පත් කර ගැනීම් ලෙස රු.2,264,498 ක හඳුනා නොගත් ශේෂයක් පෙර වර්ෂවල සිට ඉදිරියට ගෙනවිත් තිබුණු අතර ඒ සඳහා තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා

ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්ථාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංවිධානය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංවිධානයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංවිධානයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකු සංවිධානයට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංවිධානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛය	තත්කාර්ය අතුරු අග්‍රිම ලබා ගන්නා නිලධාරීන් විසින් කාර්ය නිම කළ විගස අත්තිකාරම පියවිය යුතු වුවද අවස්ථා 54 කදී ලබාගෙන තිබුණු රු.1,182,500 ක අත්තිකාරම් පියවීම සඳහා දින 32 සිට දින 102 ක කාල පරාසයක් ප්‍රමාද වී තිබුණි.
(ආ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.22 වගන්තිය	ආපදා අවම කිරීමේ රු. 61,845,848 වටිනාකම් සහිත ව්‍යාපෘති 02 ක් සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීමේදි දින 21 ක අවම කාල සීමාවක් දිය යුතු වුවද ඒ සඳහා ලබා දී තිබුණේ දින 16 ක් පමණි.
(ඇ)	2019 ජුනි 18 දිනැති අංක NBRO/AD/2019/132 දරන අධ්‍යක්ෂ මුදල්ගේ ලිපිය	කලින් ලබා ගන්නා ලද අත්තිකාරම් මුදල පියවන තුරු අත්තිකාරම් ලබා නොදෙන බව දන්වා ඇතත් කලින් ලබා ගත් අත්තිකාරම් මුදල පියවා නොතිබියදී නැවත අත්තිකාරම් ලබා දී තිබුණි. තවද මාසයක් තුල නොපියවන ලද අත්තිකාරම් සඳහා දඩ මුදල් අයකරන බව දක්වා ඇතත් රු.28,145 ක දඩ මුදල් සංවිධානය විසින් නිලධාරීන්ගෙන් අයකරගෙන නොතිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 19 දිනැති අංක DMS/1508 vol viii හා 2017 හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය	බාහිර පාර්ශවයන් වෙතින් සංවිධානය වෙත ලැබෙන නායයෑම් අවදානම් අවම කිරීමේ උපදේශන කොන්ත්‍රාත් ඉටුකිරීමේදී ඒ සඳහා සම්බන්ධවන සංවිධානයේ නිලධාරීන් වෙත එම නිලධාරීන්ගේ ස්ථිර තනතුරට හිමිවන වැටුපට අමතරව දීමනා ලෙස අවස්ථා 6 කදී නිලධාරීන් 33 දෙනෙකු වෙත රු. 9,716,289 ක මුදලක් හා ඊට අදාල සේවක අර්ථසාධක සහ භාරකාර අරමුදල් සඳහා රු. 1,410,059 ක මුදලක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් වලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(2) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව සංවිධානයේ බලතල කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකුල නොවන ලෙස කටයුතු කර ඇතිබව

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සංවිධානයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

සංවිධානයේ නව කාර්යාල සහ විද්‍යාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ගිවිසුම ප්‍රකාරව දින 240 කින් නිම කළ යුතු වුවත් 2020 දෙසැම්බර් 31 දින වන විට දින 1016 ක කාලයක් ගතවී තිබුණද ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. 2019 දෙසැම්බර් 31 දිනෙන් පසු කාලය දීර්ඝ කිරීම් අනුමත කර නොතිබුණ අතර ප්‍රමාද ගාස්තු රු.3,650,000 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. කළ වැඩ වාර්තාවන්ට අනුව රු. 51,730,418 ක් වටිනා වැඩ අළුතින් ඉටුකර ඇති අතර රු. 63,927,288 ක් වටිනා වැඩ සැලසුම්වලින් ඉවත් කර තිබුණි. කොන්ත්‍රාත් වටිනාකම රු. 161,803,814 ක් වූ අතර සංවිධානය මගින් කල වැඩ වටිනාකම රු. 185,853,800 ක් ලෙස තක්සේරු කර තිබුණි. ඒ අනුව විචලන වටිනාකම රු. 24,049,986 ක් වූ අතර එම අගය තුල කොන්ත්‍රාත්කරුගේ පරිපාලන වියදම් රු. 10,971,473 හා මිල විචලනය රු. 2,300,000 අන්තර්ගත වි තිබුණි. ව්‍යාපෘති කළමනාකරණ අංශයේ නිලධාරීන්ගේ ප්‍රමාද දෝෂයන් හේතුවෙන් රු. 13,271,473 ක් අතිරේකව කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට සිදුවී තිබුණි. ව්‍යාපෘති කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂ මූලික සැලසුම් සහතික කිරීම, ලංසු ඇගයීම කමිටුවේ සහ විචලන වැඩ අධ්‍යයනය සඳහා පත්කල තාක්ෂණික ඇගයීම් කමිටුවේ සමාජිකත්වය දරා ඇති බැවින් එම කටයුතු විනිවිද භාවයකින් සිදුවූවාද යන්න ගැටළුකාරී විය.

3. වෙනත් කරුණු

(අ) සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි ඉදි කිරීම් සඳහා ඉඩම් පරීක්ෂාව සහ සංවර්ධන කටයුතු සඳහා ඉල්ලුම්පත් 8,542 ක් ලැබී තිබුණ අතර ඉන් තක්සේරු වර්තා ලබාදී තිබූ ඉල්ලුම්පත් 7,374 පමණි. ඒ අනුව 2020 වර්ෂයේ ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධයෙන් හා සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් නායයෑම් අවදානම් තක්සේරු වාර්තා ඉල්ලුම්පත් 1,168 ක් නිර්දේශ ලබා දී නොතිබුණි. ඒ අනුව එහි ප්‍රතිශතය සියයට 13.6 ක් විය .

(ආ) සමාලෝචිත වර්ෂයේදී නාය යෑම් සමීක්ෂණය සඳහා ඉල්ලුම්පත් 7,879 ක් ලැබී තිබූ අතර ඉන් ඉල්ලුම්පත් 3,717 ක් සඳහා අවදානම් තක්සේරු වාර්තා ලබා දී තිබුණ අතර නිර්දේශ ලබාදිය යුතු ඉල්ලුම්පත් ගණන 4162 ක් විය. වර්ෂය තුල නිර්දේශ ලබා දිම සඳහා ලද ඉල්ලුම්පත් ප්‍රමාණයෙන් සියයට 52.8 ක ප්‍රතිශතයක් සඳහා අදාල සමීක්ෂණ සිදුකර නිර්දේශ ලබා දී නොතිබුණි.

(ඇ) ප්‍රජා මූලික ආපදා අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සහ නායයෑම් විස්තාපනය හඳුනාගැනීමේ පද්ධති වෙනුවෙන් 2015 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් මගින් ලැබී තිබුණු රු.7,624,490 ක් සහ නාය යෑම් අවදානම් අවම කිරීමේ අංශය වෙත 2015 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් ආංකික ආකෘති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ලැබී තිබුණ රු.5,000,000 ක මුදලද 2020 දෙසැම්බර් 31 දින විටත් උපයෝජනය කර නොතිබුණි.

එසේම නායයෑම් අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 97.25 ක මුදලක් ලැබී තිබුණි. සංවිධානය විසින් 2020 වර්ෂය තුල ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කර තිබුණ අතර උපයෝජනය කර තිබුණේ රු.මිලියන 85.36 ක් බැවින් රු.මිලියන 11.89 ක මුදලක් ඌණ උපයෝජිතව පැවතුණි.

(ඈ) සංවිධානය සඳහා නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් පනතක් පිළියෙල කිරීම සඳහා ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2010 ජූනි 02 දින අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව පිළියෙල කළ පනත් කෙටුම්පත 2012 සැප්තැම්බර් 10 දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබුණ ද 2020 දෙසැම්බර් 31 දින වනවිටත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ණය පදනම මත සේවා සැපයීම සංවිධානයේ ප්‍රතිපත්තිය නොවුවද ණයට සේවාවන් සැපයීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රු.62,155,575 ක ණයගැති ශේෂ පැවතුණු අතර එය 2014 සිට 2020 දක්වා කාලයට අදාල විය.

(ඊ) සංවිධානයේ ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් කාර්යාල වෙත කුලී පදනම මත වාහන ලබා ගැනීමේදී ධාවනය කළ යුතු අවම දුර උපයෝජනය වන පරිදි කටයුතු නොකිරීම හේතුවෙන් අවස්ථා 34 කදී රු.599,512 ක් සංවිධානයට වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි

(උ) 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කොන්ත්‍රාත්කරුවන් වෙත අත්තිකාරම් ලෙස ගෙවා තිබුණු රු.118,236,114 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවා ගෙන නොතිබුණි.

(ඌ) දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යය මණ්ඩල නිලධාරීන් 386 ක් වුවද සේවයේ නියුතු කාර්යය මණ්ඩලය 424 ක් විය. ඉන් සේවකයින් 98 ක් ස්ථිර කාර්යය මණ්ඩලයට අයත් නොවන නිලධාරීන් වන අතර කාර්යය මණ්ඩල පුරප්පාඩු 62 ක් පවතින බව අනාවරණය විය. එසේම මුල් බඳවා ගැනීම් පරීක්ෂාව අනුව එක් තනතුරක් ලෙස පැවති අධ්‍යක්ෂ ආයතනික තනතුර සඳහා අධ්‍යක්ෂ පාලන සහ අධ්‍යක්ෂ මුදල් ලෙස තනතුරු දෙකක් ඇති කිරිමේදී මුල් බඳවා ගැනීමේ පටිපාටියේ ඇතුලත් සුදුසුකම් අධ්‍යක්ෂ පාලන තනතුර සඳහා පමණක් අදාල වනසේ සංශෝධනය කර තිබු අධ්‍යක්ෂ මුදල් තනතුර සඳහා බඳවා ගැනීම් පටිපාටිය සංශෝධනය කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
99/1, ජාවත්ත පාර, කොළඹ 5.
දුරකතන අංක : **011-2588946, Fax: 011-2502611**
විද්‍යුත් ලිපිනය : **info@nbro.gov.lk**, වෙබ් අඩවිය : **www.nbro.gov.lk**